# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை 2014

# ANNUAL PERFORMANCE REPORT




කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் வணிக அமைச்சு

**Ministry of Industry and Commerce**

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# 2014

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය

**මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට ද පරිවර්තනය කර ඇත.**

# පෙරවදන

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ 2014 වාර්ෂික කාර්යසාධන වාර්තාව 2002 සැප්තැම්බර් 12 දින රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 මඟින් දෙන ලද උපදෙස් අනුව පිළියෙල කර ඇත.

මෙම වාර්තාවේ මුල් කොටසින් අමාත්‍යාංශයේ කර්මාන්ත අංශය යටතේ ඇති ආයතන සහ අංශ වලින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල කාර්යසාධනය පිළිබඳව විස්තර කර ඇත. අමාත්‍යාංශයේ, වාණිජ අංශය යටතේ ඇති ආයතන වලින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වල කාර්ය සාධනය මෙම වාර්තාවේ දෙවෙනි කොටසින් දක්වා ඇත.

අමාත්‍යාංශයේ පොදු තොරතුරු සහ 2014 වර්ෂයේ සමස්ත මූල්‍ය කාර්යසාධනය අවසන් වශයෙන් සවිස්තරාත්මකව දක්වා ඇත.

## දැක්ම

*"සවිමත් වාණිජමය පරිසරයක් තුළින් ජාත්‍යන්තර තරඟකාරී දේශීය කර්මාන්ත අංශයක් ශ්‍රී ලංකාව තුළ ගොඩනැගීම"*

## මෙහෙවර

*"ශ්‍රී ලාංකාවේ ආර්ථික සංවර්ධනයට දායක නංවන්නාවූද, ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදන බිහි කරන්නාවූ, සවිමත් වාණිජ අංශයකින් සමන්විතවූද, ධරණීය හා තරඟකාරීත්වයකින් හෙබි නිෂ්පාදන ආයතනයන්හි අභිවෘද්ධිය සඳහා හිතකාමී වන පරිසරයක් නිර්මාණය කිරීම"*

## කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ මූලික අභිමතාර්ථයන්

*දැනුම මත පදනම් වූ නිෂ්පාදන කර්මාන්ත අංශයක් බිහිකිරීම*

*අගය එකතු කළ අපනයනයන් සංවර්ධනය හා ප්‍රවර්ධනය තුළින් අපනයන ආදායම ඉහල නැංවීම*

*හිතකර වාණිජමය පරිසරයක් ඇති කිරීම*

# අමාත්‍යාංශයේ විෂයපථය

**2010.11.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශයට පවරා ඇති විෂයපථය පහත පරිදි වේ.**

1. මහින්ද චින්තන ඉදිරි දැක්ම සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා කර්මාන්ත හා වාණිජ විෂයන්ට හා සමගාමීව දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම.

2. අදාල අරමුණු සපුරා ගැනීම සඳහා ජාතික සැලසුම් බලධාරීන් සමඟ එකඟත්වයට පැමිණි කාලසීමාව හා අයවැයගත සම්පත් ප්‍රමාණය තුළ ඉහත ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මෙහෙය වීම.

3. අමාත්‍යාංශ විෂයපථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම.

4. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටුකිරීම සහතික කිරීමට ඉවහල්වන ආකාරයට නවීන කළමනාකරණ තාක්ෂණික ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.

5. බුද්ධිමය දේපල පිළිබඳව ජාත්‍යන්තර සම්මුතිය පරිපාලනය කිරීමට අදාළ කාර්යයන්හි ප්‍රකාශන අයිතිය හා ජගත් බුද්ධිමය දේපල කාර්යාලයෙහි (WIPO) ප්‍රකාශන අයිතිය

6. අපනයන සංවර්ධන හා උපදේශන සේවා

7. ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා

8. විදේශයන්හි ශ්‍රී ලංකා වෙළඳ කටයුතු නියෝජනය

9. තරඟකාරීත්ව පිළිවෙත

10. කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධනය

# කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අංශ සහ ආයතන

**කර්මාන්ත අංශය**

කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය

කර්මාන්ත සංවර්ධන අංශය

සංවර්ධන අංශ I

සංවර්ධන අංශ II

සංවර්ධන අංශ III

කර්මාන්ත ලියාපදිංචි කිරීමේ සහ කළමනාකරණ තොරතුරු අංශය

ඵලදායිතා වර්ධන අංශය

රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය

සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

මාන්තායි සෝල්ට් ලිමිටඩ්

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

පේෂකර්මාන්ත සංවර්ධන අංශය

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය

**වාණිජ අංශය**

වාණිජ දෙපාර්තමේන්තුව

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

# පටුන


| | **පිටු අංකය** |
|---|---|
| **කර්මාන්ත අංශය** | |
| කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය | 01 |
| කර්මාන්ත සංවර්ධන අංශය | 03 |
| සංවර්ධන අංශ I | 07 |
| සංවර්ධන අංශ II | 10 |
| සංවර්ධන අංශ III | 12 |
| කර්මාන්ත ලියාපදිංචි, ඵලදායිතා වර්ධන හා කළමනාකරණ තොරතුරු අංශය | 16 |
| රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය | 20 |
| සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය | 23 |
| කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් | 27 |
| මාන්තායි සෝල්ට් ලිමිටඩ් | 30 |
| ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය | 32 |
| පේෂකර්මාන්ත සංවර්ධන අංශය | 37 |
| පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | 42 |
| ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය | 44 |
| **වාණිජ අංශය** | |
| වාණිජ දෙපාර්තමේන්තුව | 50 |
| සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | 54 |
| ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපල කාර්යාලය | 56 |
| අපනයන සංවර්ධන මණ්ඩලය | 60 |
| **පුහුණු සහ මානව සම්පත් තොරතුරු** | |
| කාර්යමණ්ඩල තොරතුරු | 68 |
| දේශීය හා විදේශීය පුහුණු | 71 |
| **මූල්‍ය ප්‍රගතිය** | **74** |

# කර්මාන්ත අංශය

# කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය

**හැඳින්වීම**

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය විසින් කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූල වන පරිදි වෙළෙඳ හා තීරු බදු සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට දායක වේ.

**ජාත්‍යන්තර වෙළෙඳාම හා ආශ්‍රිත කටයුතු**

නිදහස් වෙළෙඳ ගිවිසුම් තුලින් අපනයන උත්පාදන කර්මාන්ත සඳහා අපනයන අවස්ථා ලබා ගැනීමට දායක වීම හැරුණුකොට, දේශීය කර්මාන්තයන් හි සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා පියවර ගැනීම ද කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය විසින් වාණිජ දෙපාර්තමේන්තුව හා එක්ව සිදුකරනු ලැබේ.

**තීරු බදු ආශ්‍රිත කටයුතු**

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව හා ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික කවුන්සලය ආදියෙහි අදාල නිලධාරින් සමඟ සම්බන්ධීකරණය තුලින් දේශීය කර්මාන්තකරුවන්ගේ තීරු බදු ආශ්‍රිත ගැටළු විසඳීම සඳහා මෙම අංශය සිය දායකත්වය දක්වයි.

**2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය**

**තීරු බදු ආශ්‍රිත ගැටළු විසඳීම**

මුදල් අමාත්‍යාංශය මගින් කර්මාන්තකරුවන්ගේ විවිධ තීරු බදු ආශ්‍රිත ගැටළු විසඳීමට පසුගිය වසර තුලදී මෙම අංශය විසින් කටයුතු කර ඇත.

දේශීය කර්මාන්ත සුරක්ෂිත කරනු වස් තේ කර්මාන්තයට අදාළ යන්ත්‍ර සූත්‍ර, ට්‍රැක්ටර්, වානේ වර්ග, සිමෙන්ති, බෝට්ටු නිෂ්පාදන කර්මාන්තයට අදාල උපකරණ/කොටස්, වීල්බැරෝ සහ කොටස්, ගෝස් යන භාණ්ඩ වල තීරු බදු ද කෘත්‍රිම මල් වර්ග, මඳුරු දඟර, තිරිඟු හෝ මෙස්ලින් පිටි, මාගරීන් හෝ එළවළු යොදය, සත්ත්ව යොදය, සොසේජස් හා ඒ සමාන නිෂ්පාදන, සෝස් සහ සැකසුම් ද්‍රව්‍ය, සීනි ආශ්‍රිත රස කැවිලි, චොක්ලට් සහ කොකෝවා සහිත සැකසුම්, පැස්ටා සහ සමාන නිෂ්පාදන, ධාන්‍ය හා සමාන නිෂ්පාදන, සුප් සහ හොදි වර්ග සහ ඒ සමාන නිෂ්පාදන, අයිස් ක්‍රීම් සහ ආහාරයට සුදුසු අයිස්, තීන්ත සහ වාර්නිෂ්, විනාකිරි, ඉටිපන්දම්, බැටරි, හඳුන්කූරු, ගෝස්, සබන් සහ මුහුණ සේදීමට පාවිච්චි කරන දියර, ලැමිනේට් කරන ලද කඩදාසි, සනීපාරක්ෂක තුවා, වානේ නිෂ්පාදන, ඇළුමිනියම් පොලු සහ බට, ගෘහ භාණ්ඩ, කොපු සහ බුරුසු, සමහර රබර් නිෂ්පාදන සහ සමහර රබර් නිෂ්පාදන යන්ත්‍ර, කුරුඳු, කරාබුනැටි, ගම්මිරිස්, සාදික්කා සහ කරදමුංගු යන භාණ්ඩ වල සෙස් බද්ද ද ඉහළ නංවාලනු ලැබීය.

**දේශීය කර්මාන්ත ක්ෂේත්‍රයන් හි උන්නතිය සඳහා කර්මාන්ත ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය විසින් ගෙන ඇති පියවර**

30% කට වඩා දේශීය එකතු කළ අගයක් සහිත දේශීයව එකලස් කළ/නිෂ්පාදිත මෝටර් වාහන සහ HS ශීර්ෂ පාඨ 84 සහ 85 යටතේ එන විදුලි උපකරණ, කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයාගේ නිර්දේශයන් මත නිෂ්පාදන බදු ගෙවීමෙන් නිදහස් වේ.

දේශියව අගය එකතු කරන ලද වාහන සඳහා 2008 දී මුල්වරට නිෂ්පාදන බදු සහනය

ලබාදීමෙන් පසු මේ වන විට වාහන නිෂ්පාදන සමාගම් 07ක් ඒ සඳහා අවතීරණ වී ඇත. 2008 වසරේ සිට මේ දක්වා වාහන මාදිලි 18 කට අයත්වාහන 7500 කට වඩා මෙම සමාගම් 07 මගින් 30% කට ඉහල දේශියව එකතු කල අගයක් සහිතව එකලස් කර ඇත.

මෙම අනුග්‍රහය යටතේ, මෙරට විදුලි උපකරණ නිෂ්පාදන ආයතනයක් විසින් දේශියව එකතු කල අගයක් සහිතව නිෂ්පාදනය කරන ලද රෙදි සෝදන යන්ත්‍ර මාදිලි දෙකක් සහ ශීතකරණ මාදිලි දෙකක් සඳහා ද නිෂ්පාදන බදු සහනය 2014 වසර තුලදී ලබාදෙන ලදී.

30% කට වැඩි දේශීය එකතුකළ අගයක් සහිතව රෙදි සෝදන යන්ත්‍ර, ශීතකරණ යන්ත්‍ර නිපදවනු ලබන සමාගම් දෙකක් සඳහා ද මේ වන විට මෙම නිෂ්පාදන බදු සහනය ලබා දී ඇත.

ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදන තාක්ෂණය දියුණු කිරීම, පසු පස ඒකාබද්ධතා බැඳීම් ස්ථාපිත කිරීම සහ නවෝත්පාදන දිරිමත් කිරීමට අමතරව මෙම නිෂ්පාදන බදු සහන ලබාදීමේ අනෙකුත් අරමුණු වනුයේ දේශීයව නිපදවන අමතර කොටස්/උපාංගවල ගුණාත්වය වැඩිදියුණු කිරීම සහ උපාංග නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන හැකියාවන් වර්ධනය කිරීමයි. මෙමඟින් විදේශ විනිමය රටින් පිටතට ගලා යාම සීමා කිරීම සහ දේශිය පාරිභෝගිකයින්ට දැරිය හැකි මිල ගණන්වලට මෝටර් රථ සහ විදුලි උපකරණ සැපයීමට හැකියාව ලැබේ.

මෙම වැඩසටහනෙ හි වක්‍ර ප්‍රතිලාභයක් වනුයේ නිදහස් වෙළඳ ගිවිසුම් (ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම වැනි) යටතේ අපනයන අවස්ථා විවර වීමය. 35% කට වැඩි දේශීය එකතු කළ අගයක් සහිතව ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන නිෂ්පාදන සඳහා එම ගිවිසුම මඟින් (යෙදවුම්, නිමවුම් බවට පත්වීමේ දී සැලකිය යුතු පරිවර්තනයකට ලක්ව තිබීම හා සරල නොවන නිෂ්පාදන ක්‍රියාදාමයක් අනුගමනය කොට තිබීම යන කරුණු වලට යටත්ව) තීරු බදු සහන පිරිනැමේ.

# කර්මාන්ත සංවර්ධන අංශය

### හැඳින්වීම

සංවර්ධිත ප්‍රදේශවලට පමණක් සීමා වී ඇති කාර්මික සංවර්ධනය ප්‍රාදේශීය මට්ටමින් ව්‍යාප්ත කිරීමටත් එමගින් ජාතික ආදායමට කර්මාන්ත අංශයෙන් වන දායකත්වය ඉහළ නැංවීමටත් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රාදේශීය කර්මාන්ත සංවර්ධන අංශය දායක වෙයි. මෙම කර්තව්‍යයේ දී ප්‍රාදේශීය වශයෙන් කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයෝජන දිරිගැන්වීම, අවශ්‍ය වන යටිතල පහසුකම් සලසා දීම සහ තාක්ෂණික පහසුකම් හා උපදේශන සේවා ලබා දීම මෙම අංශයේ වගකීම වේ.

### ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු

ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත යටතේ සෑම පළාතක් සඳහාම ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු ස්ථාපිත කර ඇත. මෙම කමිටුවේ කාර්යභාරය ලෙස පළාත් තුල කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය වන සැලසුම් සහ ක්‍රියාත්මක සැලැස්මක් සකස් කිරීම, ඒ සඳහා අවශ්‍ය වන පහසුකම් සැලසීම සහ කර්මාන්ත සම්බන්ධ ආයෝජන තීරණයන් ක්‍රියාත්මක කිරීමට ආයෝජකයන්ට සහාය වීම හැඳින්විය හැක.

මෙම කමිටුවේ සභාපති ලෙස අදාල පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමාගේ එකඟත්වය සහිතව කර්මාන්ත විෂයභාර අමාත්‍යවරයා විසින් පුද්ගලික අංශය නියෝජනය කරන ව්‍යාපාරිකයෙකු පත් කරනු ලබන අතර පළාත නියෝජනය කරන කර්මාන්තකරුවන් සහ රාජ්‍ය නිළධාරීන් 15 ක් මෙම කමිටුවට ඇතුලත් වේ.

### ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන

මෙම ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුවේ කර්යභාරය ඉටු කිරීම පිණිස පළාත් මට්ටමින් ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන 09 ක් ආරම්භ කර ඇති අතර ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටුවේ ලේකම් ලෙස ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලබයි. එම තනතුරේ කාර්යයට සහාය වීම සඳහා අදාල කාර්ය මණ්ඩලයක් ද පත් කර ඇත.

කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ඉඩම් ලබා ගැනීමට ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන වෙත ඉදිරිපත් වන නව ව්‍යාපෘති යෝජනා ඇගයීම් ප්‍රාදේශීය කර්මාන්ත සේවා කමිටු මගින් සිදු කරනු ලබයි. මෙමගින් ප්‍රාදේශීය මට්ටමින් නව ආයෝජකයින් තෝරා ගැනීමට අවස්ථාව උදාවේ. කමිටුව මගින් නිර්දේශ කරනු ලබන ව්‍යාපෘති තවදුරටත් ඇගයීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන කමිටුව වෙත යොමු කරනු ලබයි. මෙම කමිටුව මගින් ව්‍යාපෘති අනුමත කිරීමේ දී නිෂ්පාදන ක්‍රියාවලිය, අගය එකතු කිරීමේ ප්‍රතිශතය, පාරිසරික බලපෑම, මූල්‍ය ශක්‍යතාවය සහ රැකියා උත්පාදනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

මීට අමතරව මෙම ව්‍යාපෘති යෝජනා අතුරෙන් පාරිසරික වශයෙන් සංවේදී ව්‍යාපෘති යෝජනා පිළිබඳව තාක්ෂණික කාර්මික ආයතනය වැනි තාක්ෂණික ආයතන වෙතින් නිර්දේශ ලබා තාක්ෂණික වශයෙන් වැඩි දියුණු කිරීම් සිදුකර පරිසරයට අවම හානියක් සිදු වන අයුරින් ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය විසින් මග පෙන්වීමට කටයුතු කරනු ලබයි. ඇගයීම් කමිටු අනුමැතිය ලද ව්‍යාපෘති අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබෙන ව්‍යාපෘති සඳහා අමාත්‍යාංශය මගින් සංවර්ධනය කරන ලද

කර්මාන්තපුරවලින් වසර 35 ක් සඳහා වූ බදු පදනම යටතේ ඉඩම් කොටස් වෙන්කර දෙනු ලබයි.

## 2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය

**ප්‍රාදේශීය කර්මාන්තපුර සංවර්ධන වැඩසටහන**

2014 වර්ෂය වන විට අමාත්‍යාංශය විසින් ග්‍රාමීය මට්ටමින් සැලකිය යුතු රැකියා අවස්ථා සංඛ්‍යාවක් සලසමින් රටපුරා කර්මාන්තපුර 29 ක් දිස්ත්‍රික්ක 19ක් තුළ ස්ථාපනය කර ඇති අතර, විදුලිය, ජලය හා මාර්ග පද්ධතිය ආදී අවශ්‍ය යටිතල පහසුකම් සහිතව අක්කර 902.41 ක ප්‍රමාණයක් සංවර්ධනය කර තිබේ. කර්මාන්තපුර 29 හි කර්මාන්ත 304ක් වාණිජ නිෂ්පාදන කටයුතුවල නිරතවන අතර තවත් කර්මාන්ත 38 ක් ගොඩනැගිලි ඉදිකරමින් පවතී. මෙම කර්මාන්තපුරවල රැකියා අවස්ථා 17,669 ක් උත්පාදනය වී ඇත.

2014 වර්ෂයේ ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථාන වෙත නව ව්‍යාපෘති සඳහා අයදුම්පත් 70 ක් ලැබී ඇති අතර එම ව්‍යාපෘති අතුරින් අමාත්‍යාංශ ඇගයීමේ කමිටුව විසින් නිර්දේශ කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව 46 කි. අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා මෙම වසරේ මේ දක්වා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති 40 න් 20 ක් සඳහා අනුමැතිය ලැබී ඇති අතර ඒ සඳහා ඉඩම් කොටස් වෙන් කර දී ඇත.

**මන්නාරම කර්මාන්තපුරය**

2010 වර්ෂයේ "උතුරු වසන්තය" වැඩසටහනට සමගාමීව සංවර්ධනය කිරීමේ අරමුණින් ආරම්භ කරනු ලැබූ පළමු කර්මාන්තපුරය ලෙස මන්නාරම කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු මන්නාරම නගරයට නුදුරින් අක්කර 25 ක ඉඩමක ආරම්භ කරන ලදී. යටිතල පහසුකම් සැපයීමේ කටයුතු සිදුකරමින් පවතී. ආයෝජන මණ්ඩලය මගින් අනුමත නවීන තාක්ෂණයෙන් යුතු ඇඟළුම් කර්මාන්තශාලා 02 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති අතර ප්‍රාදේශීය සේවා වියුක්තියට විසඳුමක් ලෙස රැකියා අවස්ථා 850 ක් සපයමින් වාණිජ නිෂ්පාදන කටයුතු අරඹා ඇත. එක් කර්මාන්තකරුවෙකු කර්මාන්තශාලා ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතින අතර වාණිජ නිෂ්පාදන කටයුතු ඇරඹීමට නියමිත ය.

**ත්‍රිකුණාමලය කර්මාන්තපුරය**

"නැගෙනහිර නවෝදය" වැඩසටහනට සමගාමීව ත්‍රිකුණාමලය කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු ආරම්භ කරමින් අදියර - 1 හි අක්කර 25 ක සංවර්ධන කටයුතු නිමකල අතර ඒ සඳහා කර්මාන්ත ආයතන 09 ක් තෝරා ගෙන ඇත. සේවකයන් 875 ක් පමණ සේවයේ යොදවමින් කර්මාන්ත ආයතන 05 ක් වාණිජ නිෂ්පාදන කටයුතු අරඹා ඇති අතර සෙසු ආයෝජකයන් කර්මාන්තශාලා ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතුවල නිරත වෙමින් සිටී.

අදියර 11 හි සංවර්ධන කටයුතු දැනට සිදු කරමින් පවතින අතර එම භූමියේ සංවර්ධන කටයුතුවලින් 75%ක් නිම කර ඇත.

**මතුගම කර්මාන්තපුරය ( අදියර 1, 11)**

මතුගම කර්මාන්තපුරය - අදියර 1 හි සංවර්ධන කටයුතු නිමකර ඇති අතර මධ්‍යම හා මහා පරිමාණ කර්මාන්ත සඳහා ඉඩම් වෙන්කර ඇත. ඇස්බැස්ටොස් සෙවිලි තහඩු නිෂ්පාදන කර්මාන්තයක්, වානේ නිෂ්පාදන ආයතනයක් හා තුනී ලෑලි කර්මාන්ත ආයතනයක් දැනටමත් තම වාණිජ නිෂ්පාදන කටයුතුවල නිරත වෙමින් පවතින අතර තවත් කර්මාන්තශාලා 2 ක් ඉදිකරමින් පවතී.

**දංකොටුව කර්මාන්තපුරය**

දංකොටුව කාරණාවන්වත්තේ අක්කර 53 ක පිහිටි දංකොටුව කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු නිමකර ඇති අතර තවදුරටත් වැඩිදියුණු කිරීමේ කටයුතු නිම කිරීමට

අපේක්ෂිතය. ඒකියා අවස්ථා 2205 ක් සපයමින් කර්මාන්තකරුවන් 42 ක් වාණිජ නිෂ්පාදන කටයුතු සිදු කරමින් පවතී. කර්මාන්තපුරයේ අභ්‍යන්තර මාර්ග සංවර්ධන කටයුතු 85% ක් පමණ නිම කර ඇත.

**මිනුවන්ගොඩ කර්මාන්තපුරය**

කර්මාන්තපුරය තුල කඩදාසි නිෂ්පාදන ආයතනයක්, ටයර් නැවත පිරවීමේ ආයතනයක් හා තේ බෑග් සඳහා නූල් නිෂ්පාදන ආයතනයක් ඇතුලු නිෂ්පාදන ආයතන 14 ක් ඒකියා අවස්ථා 332 ක් සපයමින් වාණිජ නිෂ්පාදන කටයුතු සිදු කරමින් පවතී. මෙම කර්මාන්තපුරය තුල ආයෝජකයන් විසින් රු.මි. 603 ක ආයෝජනයක් සිදු කර ඇති අතර වාර්ෂික පිරිවැටුම රු.මි. 637.1 ක් වේ. කර්මාන්තපුරයේ ආරක්ෂිත වැට ඉදි කිරීමේ කටයුතු මේ වන විට අවසන් කෙරෙමින් පවතී.

**නාලන්ද කර්මාන්තපුරය**

නාලන්ද කර්මාන්තපුරය තුල කර්මාන්තකරුවන් 13 ක් වාණිජ නිෂ්පාදන කටයුතු වල නිරත වන අතර කර්මාන්තශාලා 01 ක ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී. මෙම කර්මාන්තපුරය මඟින් මුළු ඒකියා අවස්ථා 955 ක් නිර්මාණය කර ඇත. මෑත කාලයේ දී මෙම සංවර්ධන කටයුතු අවසන්ව ඇති අතර මේ වන විට ජල සැපයුම ලබාදීමේ කටයුතු සිදුවෙමින් පවතී. ජල සාම්පල පරීක්ෂාව සම්පූර්ණ කර ඇති අතර ජලයේ කඨිනතාවය පරීක්ෂා කිරීම සඳහා ඇස්තමේන්තු ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙතින් කැඳවා ඇත.

**බටඅත කර්මාන්තපුරය**

කර්මාන්ත ආයතන 05 ක වාණිජ නිෂ්පාදන කටයුතු සිදුකරනු ලබන අතර ඒකියා අවස්ථා 548 ක් සපයා ඇත. කර්මාන්තපුරයේ සංවර්ධන කටයුතු අවසන්ව ඇති අතර ප්‍රවේශ මාර්ගය අළුත්වැඩියා කිරීම සම්බන්ධ කටයුතු සිදු කිරීම දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ප්‍රදානය කර ඇත.

**වැලිඔය කර්මාන්තපුරය**


ඇඟලුම් නිෂ්පාදනය සඳහා විශේෂිත වූ කර්මාන්තපුරයක් ඇරඹීමේ අරමුණින් නවීන තාක්ෂණයෙන් යුතු ඇඟලුම් කර්මාන්ත ශාලා 05ක් පිහිටුවීම සඳහා වැලිඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහවැලි අධිකාරියට අයත් අක්කර 50 ක භූමි ප්‍රමාණයක් හඳුනාගෙන ඇත. මේ සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

**විල්ගමුව කර්මාන්තපුරය**

ආයෝජනයන් දිරිමත් කිරීම තුලින් ප්‍රාදේශීය සංවර්ධනය ඇති කිරීමේ උපාය මාර්ගයක් ලෙස විල්ගමුව කර්මාන්තපුරය යෝජනා වී ඇත. අක්කර 18.6 ක භූමි ප්‍රමාණයක මෙම කර්මාන්තපුරය පිහිටුවීම සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශය මේ වන විට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.

**මුසලි කර්මාන්තපුරය**

ඇඟලුම් කර්මාන්ත ශාලා 05 ක් ඉදි කිරීම සඳහා අක්කර 25 ක භූමි ප්‍රමාණයක් මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොන්ඩච්චි ග්‍රාම නිලධාරී වසමේ කල්ලරු ප්‍රදේශයෙන් හඳුනාගෙන ඇත. මේ සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.


Regional Industrial Estates
Ministry of Industry and Commerce
Development works completed
Development works underway
Proposed new locations
Mannar Industrial Estate
Welioya Industrial Estate
Puttlam Industrial Estate
Makandura (East) Industrial Estate
Makandura (West) Industrial Estate
Dambadeniya Industrial Estate
Dankotuwa Industrial Estate
Nurani Industrial Estate
Minuwangoda Industrial Estate
Mahara Industrial Estate
Kolonnawa Industrial Estate
Templeburg Industrial Estate (Stage I and II)
Ratmalana Industrial Estate (Stage I and II)
Millawa Industrial Estate
Kalutara Industrial Estate
Mathugama Industrial Estate
Karandeniya Industrial Estate
Udukawa Industrial Estate
Bata-Atha Industrial Estate
Embilipitiya Industrial Estate
Nalanda Ellawala Industrial Estate (Stage I and II)
Galigamuwa Industrial Estate
Buttala Industrial Estate
Nawagampura Industrial Estate
Wilgamuwa Industrial Estate
Ulapane Industrial Estate
Nalanda Industrial Estate
Batticaloa Industrial Estate
Laksha Uyana Industrial Estate
Trincomalee Industrial Estate
Musali Industrial Estate
Jaffna
Kilinochchi
Mullaitive
Mannar
Vavuniya
Anuradhapura
Trincomalee
Puttalam
Polonnaruwa
Kurunegalla
Matale
Batticaloa
Kandy
Ampara
Gampaha
Kegalle
Badulla
Colombo
Nuwara Eliya
Monaragala
Kaluthara
Rathnapura
Galle
Matara
Hambantota

# සංවර්ධන අංශය - I

### හැඳින්වීම

සංවර්ධන අංශ 1 යටතේ කෘෂි නිෂ්පාදන හා ඒ ආශ්‍රිත සැකසුම් ක්ෂේත්‍රයේ නිපැයුම් කර්මාන්ත තුළින් වැඩි වාසිදායක තත්වයක් ලබා ගැනීමට අවශ්‍ය වන්නා වූ සේවා පහසුකම් ලබා දීම මෙම අංශයේ කාර්යයභාරය වේ. එම ක්ෂේත්‍ර සංවර්ධනය කිරීම මඟින් රැකියා උත්පාදනය, දැනුම හා කුසලතා ඉහළ නැංවීම, දේශීය පරිභෝජන අවශ්‍යතා ශක්තිමත් කිරීම සහ අපනයන සංවර්ධන සිදුකර ඒ තුළින් විශේෂිත වාසි ලබා ගැනීමට අපේක්ෂා කරයි. මෙම අංශයන් හි කර්මාන්ත සංවර්ධනය සඳහා නිෂ්පාදන ඉහළ නැංවීම, තත්ත්වය ඉහළ නැංවීම, ඵලදායිතාවය ඉහළ නැංවීම හා තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා මෙම අමාත්‍යාංශය අදාළ අනෙකුත් ආයතන ද සමඟ එක්ව විවිධ සංවර්ධන වැඩසටහන් දියත් කරයි.

### ප්‍රධාන අරමුණු

1.ජාත්‍යන්තර වෙළඳපොලේ තරගකාරිත්වයට මුහුණදිය හැකි ගුණාත්මක තත්ත්වයෙන් යුත් භාණ්ඩ නිෂ්පාදනය සඳහා දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.

2.දේශීය වෙළඳපොලෙහි අවශ්‍යතා හඳුනාගෙන එම අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අවශ්‍ය කර්මාන්ත අංශයන් සංවර්ධනය කිරීම.

### අංශයේ වගකීම් යටතේ පවත්නා කර්මාන්ත අංශ

- සැකසූ ආහාර කර්මාන්ත අංශය
- ඇසුරුම් ද්‍රව්‍ය කර්මාන්ත අංශය
- කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය
- අගය එකතු කළ තේ කර්මාන්ත අංශය
- අගය එකතු කළ කොහු කර්මාන්ත අංශය

### ක්‍රියාකාරකම්

- මහින්ද චින්තනයේ සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන යටතේ දැක්වෙන අදාළ ක්ෂේත්‍රයන් සඳහා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පෞද්ගලික අංශයේ කර්මාන්තකරුවන්, අපනයනකරුවන් සහ විද්වත් මණ්ඩල වලින් සැදුම්ලත් උපදේශක කමිටුවල උපදේශකත්වයෙන් සංවර්ධන සැලසුම් හා උපායමාර්ග පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- අදාළ අංශයන් හි නිෂ්පාදන හා අලෙවිය ආශ්‍රිත ගෝලීය ප්‍රවණතා අධ්‍යයනය කිරීම සහ ඒවාට අනුකූලවන්නා වූ උපයෝගීත්වයෙන් සංවර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු පිළිබඳ සාකච්ඡා කර එම ගැටළු විසඳා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- රේඛීය අමාත්‍යාංශ, මහා භාණ්ඩාගාරය, වෙළඳ මණ්ඩල, අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන අතර සම්බන්ධීකරණය සිදුකිරීම හා ඒ තුළින් කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම.
- දේශීය සහ විදේශීය කාර්මික හා තාක්ෂණික ආයතන මඟින් කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය නවීන තාක්ෂණ පුහුණුව සහ පර්යේෂණ කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කිරීම.
- කර්මාන්තකරුවන් හා විශ්ව විද්‍යාල /පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධීකරණය තුළින් නව තාක්ෂණික දැනුම හුවමාරු කිරීම සහ ඒ තුළින් භාණ්ඩ විවිධාංගීකරණය සඳහා පහසුකම් සැළසීම.

- දේශීය හා ජාත්‍යන්තර ප්‍රදර්ශන සංවිධානය කිරීම තුළින් දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය නව තාක්ෂණය හඳුන්වාදීම සහ එම කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ සකස් කර ගැනීමට සහාය වීම.
- භාණ්ඩ අපනයනය දිරිමත් කිරීමේ අරමුණින් අපනයන භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය තීරුබදු රහිතව ආනයනය කිරීම සඳහා පහසුකම් සැපයීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය තත්ත්ව සහතික, කර්මාන්ත සඳහා හඳුන්වාදීම හා ඒවා ලබාගැනීමට උපකාර කිරීම.

**2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය**

**සැකසූ ආහාර අංශය**

සැකසූ ආහාර කර්මාන්තය සඳහා ආහාර සුරක්ෂිතතාවය/ ගුණාත්මකභාවය තහවුරු කිරීමට ජාත්‍යන්තර තත්ත්ව සහතික 22000 යන සහතික) ලබාගැනීම සඳහා මෙම ක්ෂේත්‍රයේ කර්මාන්ත වෙනුවෙන් විශේෂ අනුග්‍රහයක් මෙම අංශය මඟින් සපයනු ලබයි. මෙහිදී මූලික සහතිකකරණ ගාස්තු හා සහතිකකරණය සඳහා වැයවන අනෙකුත් වියදම් රු. 200,000/- ක උපරිමයකට යටත්ව තත්ත්ව සහතික ලබාගැනීමෙන් අනතුරුව ප්‍රතිපූර්ණය කරණු ලැබේ. මෙම වැඩසටහන යටතේ මෙම වසර තුළ ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධ ජාත්‍යන්තර සහතික ලබාදීම සඳහා කර්මාන්ත 27 ක් තෝරාගන්නා ලදී.

**සැකසූ ආහාර සහ සැකසූ ඇසුරුම් ජාත්‍යන්තර ප්‍රදර්ශනය**

වාර්ෂිකව පවත්වන සැකසූ ආහාර සහ සැකසූ ඇසුරුම් ජාත්‍යන්තර ප්‍රදර්ශනය මෙවර 13 වන වරට ඉතා සාර්ථකව 2014 අගෝස්තු මස දී පවත්වන ලදී. ඒ සඳහා ඉන්දියාව, පාකිස්තානය, චීනය, ඩුබායි, මැලේසියාව, කොරියාව, ජර්මනිය, ඇමරිකා එක්සත් ජනපදය සහ තායිලන්තය වැනි වැනි විදේශීය රටවල් අතර ප්‍රධාන පෙලේ දේශීය කර්මාන්ත ද සහභාගි වියග අමාත්‍යාංශය විසින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා වෙන් වූ විශේෂ මණ්ඩපයක් සංවිධානය කරන ලද අතර එම කර්මාන්ත සඳහා සහනදායී මිලක් යටතේ ප්‍රදර්ශන කුටි ලබාදෙන ලදී. ආහාර තාක්ෂණය හා සම්බන්ධිත විශ්ව විද්‍යාල මෙම ප්‍රදර්ශනයට සහභාගී කරවීම තුළින් විශ්ව විද්‍යාල මට්ටමේ පර්යේෂණ, වෙළඳපොලට හඳුන්වා දීමටත් ආහාර කර්මාන්ත හා විශ්ව විද්‍යාල අතර සබඳතාවය ශක්තිමත් කිරීමටත් අමාත්‍යාංශයේ අනුග්‍රහය සපයන ලදී. ප්‍රාදේශීය වශයෙන් විසිරී ඇති ආහාර කර්මාන්තයන් හි සහභාගීත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් පවත්වන දැනුවත් කිරීමේ වැඩමුළු මඟින් ඒවායේ සහභාගීත්වය පසුගිය වසරට වඩා මෙම වසරේ වැඩිවීමක් දක්නට ලැබුණි.

සැකසූ ආහාර සහ ඇසුරුම් අංශය සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කල අතර මෙහිදී ආහාර වල සෞඛ්‍ය ආරක්ෂිතභාවය, ආහාර වල තත්ත්වය වැඩිදියුණු කර ගැනීම පිළිබඳව ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කයේ පවත්වන ලද විශේෂ වැඩමුළු මඟින් කර්මාන්තකරුවන් දැනුවත් කරන ලදී.

අගය එකතු කර අපනයනය කිරීම සඳහා ලබාදෙන තීරුබදු සහන ක්‍රමය (ඔෂැෂ) යටතේ 2014 වර්ෂයේ නව සැකසූ ආහාර නිෂ්පාදන කර්මාන්ත 11 ක් සඳහා අගය එකතු කල නිෂ්පාදනයන්ගේ අපනයන ධෛර්යමත් කිරීමට පහසුකම් සපයන ලදී.

2014 ආයුර්වේද ප්‍රදර්ශනය සඳහා ආයුර්වේද නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලී සිටින කර්මාන්ත වලට අනුග්‍රහයක් වශයෙන් මූල්‍යමය පහසුකම් ලබා දෙන ලදී.

**ඇසුරුම් අංශය**

අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය එක්ව දෙවසරකට වරක් සංවිධානය කරන "ලංකා පැක් " ඇසුරුම් ප්‍රදර්ශනය 2014 ජුලි මාසයේ දී පැවැත්විණි.

ඇසුරුම් කර්මාන්තයේ නව තාක්ෂණ ක්‍රමවේදයන් වර්ධනය කිරීම හා නව තාක්ෂණය හඳුන්වාදීම සඳහා එම ක්ෂේත්‍රයේ කර්මාන්තයන් හි තාක්ෂණ ශිල්පීන් හා ඇසුරුම් නිෂ්පාදකයන් සඳහා පුහුණු පාඨමාලාවන් හා සහතිකපත් පාඨමාලාවන් පවත්වන ලදී. අමාත්‍යාංශය, කාර්මික සංවර්ධනය මණ්ඩලය හා ශ්‍රී ලංකා ඇසුරුම්කරුවන්ගේ සංගමය සමග එක්ව ඇසුරුම් නිෂ්පාදකයන් ඉලක්ක කර ගනිමින් වැඩමුළු සංවිධානය කරනු ලැබීය.

**අගය එකතු කළ තේ කර්මාන්ත අංශය**

තේ වල අගය එකතු කිරීම ප්‍රධාන වශයෙන් සිදු වන්නේ ඇසුරුම්කරණය සහ රසකාරක, විවිධාකාර ශාකසාර හා පළතුරු කොටස් එකතු කිරීම තුළිනි. කර්මාන්තය සඳහා අවශ්‍ය මෙම ද්‍රව්‍යය, යන්ත්‍ර සූත්‍ර හා තාක්ෂණය බදු රහිත පදනම යටතේ ආනයනය කිරීමට පහසුකම් සැලසීම මඟින් මෙම කර්මාන්තය දිරි ගන්වනු ලැබේ. මේ දක්වා තේ අපනයනයට සම්බන්ධ කර්මාන්ත 189 ක් සඳහා මෙම පහසුකම ලබා දී ඇත.

**අගය එකතු කළ කොහු කර්මාන්ත අංශය**

කොහු හා ඒ ආශ්‍රිත නිෂ්පාදනවල අගය එකතු කරනු ලබන නිෂ්පාදන සඳහා අවශ්‍ය, අතිරේක ද්‍රව්‍ය ගෙන්වා, ඒ තුළින් මූලික නිෂ්පාදන වල වැඩි වටිනාකමක් එකතු කර අපනයනය කරනු ලබයි. එම කර්මාන්ත දිරිගැන්වීම සඳහා තීරුබදු රහිත සහ බදු සහන යටතේ අමුද්‍රව්‍ය ආනයනට පහසුකම් සැපයීම තුළින් මෙම අංශයේ වර්ධනයක් ඇති වී ඇත. ඒ සඳහා කොහු ආශ්‍රිත නිෂ්පාදන අපනයනය සම්බන්ධව කර්මාන්ත 44 කට අමාත්‍යාංශය විසින් පහසුකම් සපයා ඇත.

මෙම වැඩසටහන තුළින් පහත සඳහන් ජාතික අරමුණු ළඟාකර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

- අපනයන අදායම ඉහළ නැංවීම
- නිෂ්පාදන පිරිවැය අවම කිරීම
- ඵලදායීතාවය ඉහළ නැංවීම හා ගුණාත්මක වර්ධනය

## සංවර්ධන අංශය - II

### හැඳින්වීම

පවත්නා කර්මාන්ත ශක්තිමත් කිරීම හා නව ආයෝජන අවස්ථා ඇතිකිරීම මගින් ගෝලීය වෙළඳපොල තරඟකාරීත්වයට මුහුණදිය හැකි ලෙස කර්මාන්ත අංශයේ තිරසාර වර්ධනයක් පවත්වාගෙන යාමත් ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමත් මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ.

### අංශයේ වගකීම් යටතේ පවත්නා කර්මාන්ත අංශ

- අච්චු හා තෙරපුම් අච්චු කර්මාන්ත අංශය
- රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය
- යන්ත්‍රෝපකරණ හා මූලික ලෝහ නිෂ්පාදන කර්මාන්ත අංශය
- බෝට්ටු හා උපාංග නිෂ්පාදන කර්මාන්ත අංශය
- වාහන එකලස් කිරීම හා ප්‍රවාහන උපකරණ නිෂ්පාදන කර්මාන්ත අංශය
- දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය
- ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය
- දෘෂ්ඨි හා ඡයාරූප නිෂ්පාදන කර්මාන්ත අංශය

### ප්‍රධාන කාර්යයන්

- කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය සැළසුම් සකස් කිරීම.
- තාක්ෂණික කළමනාකරණ හා නිෂ්පාදනයට අදාළ ගැටළු අවබෝධ කර ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා පහසුකම් ලබාදීම.
- ඵලදායිතාව නැංවීම හා එකතු කල අගය වැඩි කිරීම සඳහා උසස් තාක්ෂණික ක්‍රමෝපායයන් හඳුන්වා දීම තුළින් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අපනයනය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පරිදි පහසුකම් සැලසීම.
- දේශිය කර්මාන්ත සංවර්ධනයේදී අදාළ අමාත්‍යාංශ,
- මහා භාණ්ඩාගාරය, පුද්ගලික අංශය, කර්මාන්ත මණ්ඩල හා අනෙකුත් අදාළ වන්නා වූ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

### 2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය

#### අච්චු හා තෙරපුම් අච්චු නිෂ්පාදන අංශය

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මොරටුව විශ්ව විද්‍යාලයේ පිහිටුවන ලද අච්චු හා තෙරපුම් අච්චු නිෂ්පාදන හා සංවර්ධනය කිරිමේ මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය මෘදුකාංග සහ යන්ත්‍රෝපකරණ හා අනෙකුත් උපාංග මිලදී ගැනීම සඳහා අමාත්‍යාංශය රු.මි. 85 ක ප්‍රතිපාදන ලබා දී ඇත. ඉතා සාර්ථකව පවත්වාගෙන යන මෙම මධ්‍යස්ථානය මගින් කර්මාන්ත අංශයට අවශ්‍ය පහසුකම් සැපයීම හා විශ්ව විද්‍යාල සිසුන් හා බාහිර සිසුන් සඳහා පාඨමාලා පැවැත්වීම මගින් 2014 වර්ෂයේදී රු.මි. 3.978 ක් ඉපයීමට සමත්ව ඇත.

#### රබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත අංශය

ශ්‍රී ලංකාවේ රබර් කර්මාන්ත ක්ෂේත්‍රය ප්‍රධාන අංශයන් 3 න් සමන්විතය.

- රබර් වැවිලි කර්මාන්තය
- රබර් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය
- රබර් දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත

කර්මාන්ත අංශය පදනම් කරගත් ආර්ථික සංවර්ධනය මෙහෙය වන මූලික ගාමක

බලවේගය ලෙස අගය එකතු කරන ලද රබර් නිෂ්පාදන අංශය මෑතක සිට ඉස්මතු වී ඇත. රබර් නිෂ්පාදන අංශයේ දායකත්වය ඒකක ආදායමක් 1.5% කි. කෙසේ වුවද ජාතික අපනයන ආදායමෙන් 10% ක පමණ දායකත්වයකි.

රබර් ආශ්‍රිත නිෂ්පාදන භාණ්ඩ යටතට ගල් ටයර්, බයිසිකල් ටයර්, අත් ආවරණ, හා මොටර් රථ උපාංග යන අංශ දැක්විය හැක. කෙසේ වෙතත් මෙම අංශය සංවර්ධනය කිරීමේ ප්‍රධාන බාධාවක් ලෙස පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟය, නවීන තාක්ෂණය හුවමාරුවේ ඌනතාවයන් හා අඩු ඵලදායිතාවයන් යන කරුණු හඳුනාගෙන ඇත.

මෙම බාධාවන් අවම කර ගැනීම සඳහා අමාත්‍යාංශය කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලි තාක්ෂණික ශිල්පීන් 15 දෙනෙකු සඳහා න්‍යායික හා ප්‍රායෝගික පුහුණුවක් රබර් හා ප්ලාස්ටික් ආයතනය මගින් ලබා දෙනු ලැබීය.

රබර් ආශ්‍රිත කර්මාන්ත අංශයේ පිහිටුවා ඇති දත්ත බැංකුව යාවත්කාලීන කිරීමට අවශ්‍ය දත්ත ලබා ගැනීමේ කටයුතු සබරගමුව හා බස්නාහිර පළාතින් ආරම්භ කර ඇති අතර ඒ සඳහා අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන්ගේ සේවය ලබා ගන්නා ලදී.

**බෝට්ටු සහ බෝට්ටු උපාංග නිෂ්පාදන කර්මාන්ත අංශය**

බෝට්ටු නිෂ්පාදනය හා අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය දිවයින තුල ප්‍රචලිත කිරීම හා සංචාරක කර්මාන්තය අරමුණු කොට ගෙන බෝට්ටු නිෂ්පාදකයින්ගේ සංගමය සමඟ එක්ව බෝට්ටු ප්‍රදර්ශනය (Boat Show) 2014 වර්ෂයේ ඔක්තෝබර් මස 10-12 දක්වා දික්ඕවිට ධීවර වරායේදී පැවැත්වීය.

බෝට්ටු නිෂ්පාදනය අංශයේ සංවර්ධනය හා දියුණුව වෙනුවෙන් අමාත්‍යාංශය මේ වසර සඳහා රු.මි. 3.5 ක මුදලක් වැය කර ඇත.

ජාත්‍යන්තර නාවික කවුන්සලයේ කර්මාන්ත සංගමයේ කලාපීය රැස්වීම හා කර්මාන්ත සම්මන්ත්‍රණය මෙයට සමගාමීව පැවැත්විනි.

# සංවර්ධන අංශය - III

**හැඳින්වීම**

ජාත්‍යන්තර වෙළඳපොල තරඟකාරීත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක තත්ත්වයෙන් යුත් උසස් භාණ්ඩ නිෂ්පාදනය සඳහා පහත සඳහන් කර්මාන්ත උප අංශ ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම.

**අංශයේ වගකීම් යටතේ පවත්නා කර්මාන්ත අංශ**

- පාවහන්
- සම් භාණ්ඩ
- පිඟන් භාණ්ඩ
- විද්‍යුත් හා විදුලි උපකරණ
- ඖෂධ හා සුවඳ විලවුන් කර්මාන්තය
- තීන්ත හා මුද්‍රණ කටයුතු කර්මාන්තය
- රසායන ද්‍රව්‍ය/රෙදිපිළි නිෂ්පාදනය සඳහා වූ අමතර කොටස්/
- අනෙකුත් කර්මාන්ත

**ප්‍රධාන කාර්යයන්**

- පාවහන් හා සම් භාණ්ඩ, පිඟන් භාණ්ඩ, විද්‍යුත් හා විදුලි උපකරණ, ඖෂධ හා සුවඳ විලවුන්, කර්මාන්ත සඳහා සංවර්ධන සැලසුම් සහ ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- ඉහත අංශයන්හී උපදේශක සභා මඟින් නිර්දේශ කරනු ලබන යෝජනා ක්‍රියාත්මක කිරීම.
- රේඛීය අමාත්‍යාංශ, වෙළඳ සංගම්, සම්මේලන හා විශ්ව විද්‍යාල සම්බන්ධීකරණය කරමින් කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතියට කටයුතු කිරීම.
- තෝරා ගනු ලැබූ කර්මාන්ත අංශයන්හි කුසලතා වර්ධනය සඳහා පහසුකම් සැලසීම.
- නිදහස් වෙළඳ ගිවිසුම් තුලින් තම වෙළඳපොල කොටස ඉහළ නංවා ගැනීමට කර්මාන්තකරුවන් දැනුවත් කිරීම.
- ආයෝජන ප්‍රවර්ධන හා අළෙවිකරණ කටයුතු සඳහා උපදේශණ සේවා සැපයීම.
- අපනයන දිරිගැන්වීම සඳහා TIEP යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හා කර්මාන්ත සඳහා අවශ්‍ය විදේශීය විශේෂඥයින් වෙනුවෙන් වාස වීසා නිර්දේශ කිරීම.

**වැදගත් සිදුවීම් - 2014**

- දේශීය පාවහන් හා සම් භාණ්ඩ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා මෙම අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය හා එක්ව පාවහන් හා සම්භාණ්ඩ පුහුණු පාසලක්, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය තුළ පිහිටුවා ඇත.
- දේශීය පාවහන් හා සම් භාණ්ඩ කර්මාන්තය සඳහා විදේශීය වෙළඳපොල ප්‍රවේශය, නව තාක්ෂණය හඳුන්වාදීම හා වටිනාකම් දාමය වර්ධනය කිරීමේ අරමුණින් මෙම අමාත්‍යාංශය, අපනයන සංවර්ධන මණ්ඩලය හා එක්ව ජාත්‍යන්තර මට්ටමේ පාවහන් හා සම් භාණ්ඩ ප්‍රදර්ශණයක් සෑම වසරකදීම පෙබරවාරි මස පැවැත්වීම.
- පිඟන් මැටි භාණ්ඩ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය මුහුණ දී ඇති අමුද්‍රව්‍ය ගැටළුවලට පිළියම් ලෙස ඌව සහ මධ්‍යම පළාත්වල ඛනිජ නිධි හඳුනාගැනීමේ සමීක්ෂණයක් මේ වන විට සිදු කරමින් පවතී. එසේම දේශීය උළු කර්මාන්තශාලා නවීකරණය කිරීමේ වැඩ පිළිවෙලට සහාය දක්වා ඇත.
- මෙම අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ ස්ථාපිත කොට ඇති ශ්‍රී ලංකා ඖෂධ පර්යේෂණායතනයේ සේවාවන් තවදුරටත් පුළුල් කිරීම සඳහා

අවශ්‍ය අතිරේක යන්ත්‍ර උපකරණ සැපයීම හා ගොඩනැගිලි පහසුකම් පුළුල් කිරීම.

- විදුලි හා විද්‍යුත් උපකරණ නිෂ්පාදකයින්ගේ නව තාක්ෂණික උපකරණ හා නව සොයා ගැනීම් හඳුන්වා දීම සඳහා පවත්වන ලද ෂහඩ ප්‍රදර්ශනය සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදීම.
- දේශීය කර්මාන්ත නගා සිටුවීම සඳහා අවශ්‍ය පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම පිණිස පර්යේෂණ හා සංවර්ධන අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

### විදුලි හා විද්‍යුත් භාණ්ඩ කර්මාන්තය

**හැඳින්වීම**

විදුලි හා විද්‍යුත් භාණ්ඩ කර්මාන්තය - ගෘහ උපකරණ, විදුලි උපකරණ අමතර කොටස් හා කාර්මික උපකරණ යනාදී වශයෙන් ප්‍රධාන කොටස් 03කින් සමන්විතය. මෙම කර්මාන්ත අංශය වේගයෙන් සංවර්ධනයට ලක් කල යුතු දේශීය මෙන්ම ජාත්‍යන්තරව පුළුල් වෙළඳපොලක් සහිත, ඍජු විදේශ ආයෝජන විශාල වශයෙන් මෙරටට ගෙන්වා ගත හැකි අංශයක් ලෙස හඳුනාගෙන ඇත.

**ප්‍රගතිය**

- විදුලි හා විද්‍යුත් භාණ්ඩ කර්මාන්ත අංශයේ සිටින සුළු පරිමාණ නැගී එන කර්මාන්තකරුවන් හා නව නිපැයුම්කරුවන් සඳහා තාක්ෂණික වශයෙන් පහසුකම් සපයන මධ්‍යස්ථානයක් මොරටුව විශ්ව විද්‍යාලය හා එක්ව එම විශ්ව විද්‍යාලය තුළ පිහිටුවා ඇත. මේ යටතේ සුළු පරිමාණ නැගී එන කර්මාන්තකරුවන් දස දෙනෙක් තෝරාගෙන ඔවුන් සඳහා පහසුකම් සැපයීමේ හා පුහුණු කිරීමේ කටයුතු මේ වනවිට ආරම්භ කර ඇත. ඉදිරියේදී වැඩි කර්මාන්තකරුවන් පිරිසකට මෙම පහසුකම ලබාදීමට කටයුතු කරමින් පවතී.
- දේශීය වශයෙන් නිපදවන විදුලි හා විද්‍යුත් භාණ්ඩ සඳහා අන්තර්ජාතික පිළිගැනීමක් ලබා ගැනීම පිණිස අවශ්‍ය තත්ත්ව හා ප්‍රමිති සහතික ලබාගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කොට අනුමැතියට ඉදිරිපත් කර ඇත.
- විදුලි හා විද්‍යුත් උපකරණ නිෂ්පාදකයින්ගේ නව නිර්මාණ එළි දැක්වීමේ ෂහඩ ප්‍රදර්ශණය සඳහා මූල්‍ය අනුග්‍රහය දක්වා ඇති අතර ඉදිරියේදී එය තවදුරටත් සිදුකිරීමට සැලසුම් කර ඇත.

### පිඟන් භාණ්ඩ කර්මාන්තය

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ පිඟන් කර්මාන්තය පහත අංශවලින් සමන්විත වන අතර මෙම කර්මාන්තය සතුව ක්‍රියාකාරී අපනයන සමාගම් 15කට ආසන්න ප්‍රමාණයක් පවතින අතර එමඟින් 5,500-6,000 අතර ඍජු රැකියා ප්‍රමාණයක් සහ 7,500ක පමණ වක්‍ර රැකියා සපයයි. ශ්‍රී ලංකාවේ පිඟන් භාණ්ඩ, ආසියාවේ ඕනෑම තරඟකරුවෙක්ගේ නිෂ්පාදිත භාණ්ඩ හා සමාන කල හැකි හෝ ඊට වඩා අනර්ඝ තත්ත්වයේ පවතියි. අපනයන පිඟන් භාණ්ඩ කර්මාන්තයට ඉහළ එකතු කල අගයක් ඇති අතර, එය 60% කට වඩා ඉහළ මට්ටමක පවතී.

- පෝසිලේන් හා විසිතුරු ගල්වලින් සෑදූ කෑම මේසයට අයත් උපකරණ
- විසිතුරු කලාත්මක භාණ්ඩ සහ උපයෝගී භාණ්ඩ
- බිත්ති සහ පොළොව සඳහා පිඟන් ගඩොල්
- අනෙකුත් උළු ගඩොල් සහ පිඟන් ගඩොල්
- උසස් තත්ත්වයේ පිඟන් භාණ්ඩ
- වීදුරු
- සිමෙන්ති

ශ්‍රී ලංකාවේ පිඟන් භාණ්ඩ කර්මාන්තයට අවශ්‍ය කිරිමැටි, බෝල මැටි, ෆෙල්ස්පා, සිලිකා සහ ඩොලමයිට් ආදී අමුද්‍රව්‍ය දේශීය

වශයෙන් පැවතීම විශාල ශක්තියක් වී ඇත. ශ්‍රී ලංකාවට අත්විඳිය හැකි අනෙක් සුවිශේෂී වාසිදායක තත්ත්වයක් ලෙස උසස් කුසලතාවයන්ගෙන් හෙබි සහ උගත් ශ්‍රම බලකායක් ශ්‍රී ලංකාව සතු වීම දැක්විය හැකිය.

**පාවහන් කර්මාන්තය**

**හැඳින්වීම**

පාවහන් හා සම්භාණ්ඩ කර්මාන්තය වර්තමානයේ දේශීය මෙන්ම විදේශීය වශයෙන් පුළුල් වෙළඳපොලක් පවතින කර්මාන්ත අංශයකි. ඒ අනුව මෙම අංශය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය අසල්වැසි රාජ්‍යයන්ගෙන් හා මන්නාරම ප්‍රදේශයේ පිහිටුවීමට යෝජිත සම් නිෂ්පාදන කර්මාන්තපුරයෙන් ලබාගැනිමේ හැකියාව ඇති නිසා මෙය විශේෂයෙන් දියුණු කල හැකි අංශයක් ලෙස හැඳින්විය හැක.

පාවහන් නිෂ්පාදන කර්මාන්තය සංවර්ධනය උදෙසා අමාත්‍යාංශය පහත පියවර ගෙන තිබේ.

1. දේශීය පාවහන් හා සම් භාණ්ඩ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා මෙම අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය හා එක්ව පාවහන් හා සම් භාණ්ඩ පුහුණු පාසලක්, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය තුළ පිහිටුවා ඇත. මෙමඟින් පාවහන් හා සම් භාණ්ඩ කර්මාන්තයේ නියුක්ත වූවන්ගේ නව තාක්ෂණික හා ශිල්පීය දැනුම වැඩි දියුණු කිරීම සඳහා නව තාක්ෂණික යන්ත්‍ර උපකරණ යොදා ගනිමින් පුහුණු කටයුතු සිදුකරන නව පුහුණු පාඨමාලා සංවිධානය කර ඇත.
2. මෙම කර්මාන්තයට දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ලබාදීම අරමුණු කර ගනිමින් මෙම අමාත්‍යාංශය, අපනයන සංවර්ධන මණ්ඩලය සමග එක්ව අන්තර්ජාතික පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනයක් සෑම වසරකම පෙබරවාරි මස පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර එහි 6 වන ප්‍රදර්ශනය මෙම වසරේදී පවත්වන ලදී.
3. දේශීය පාවහන් නිෂ්පාදකයින් ආරක්ෂා කිරීම සඳහා විදේශයන්ගෙන් ආනයනය කරන පාවහන් සඳහා අයකරන බදු අනුපාතිකයන් ඉහළ දැමීම. (තීරු බදු හා සෙස් බදු ඉහළ දැමීම)

**සම්භාණ්ඩ කර්මාන්තය**

**හැඳින්වීම**

සම් භාණ්ඩ කර්මාන්තය දේශීය මෙන්ම විදේශීය වශයෙන්ද ඉහළ වෙළඳපොලක් පවතින කර්මාන්ත අංශයක් ලෙස හඳුනාගෙන ඇති අතර, එය ප්‍රධාන කොටස් 3ක් යටතේ වර්ගීකරණය කර ඇත. එනම්,

- නිමකල සම්
- සම් භාණ්ඩ
- පාවහන්

විශේෂයෙන් සම් නිෂ්පාදන කර්මාන්තය මහා පරිමාණ කර්මාන්තකරුවන් කිහිප දෙනකුගේ නිෂ්පාදනයන් මත රඳා පවතින අතර, සම් භාණ්ඩ කර්මාන්තයෙහි නියුක්ත කුඩා පරිමාණ නිෂ්පාදකයින් විශාල ප්‍රමාණයක් (විශේෂයෙන් සංචාරක කර්මාන්තය සඳහා භාණ්ඩ නිෂ්පාදනය) දැකිය හැක. එසේම මහා පරිමාණ කර්මාන්තකරුවන් කිහිප දෙනෙක් පමණක් විදේශ වෙළඳපොල සඳහා භාණ්ඩ නිෂ්පාදනය දැකිය හැකිය.

**කර්මාන්තයේ ප්‍රගතිය**

- සම් පදම් කිරීමේ කර්මාන්ත සංවර්ධනය කිරීමේ හා නැවත පිහිටුවීමේ වැඩසටහන යටතේ මන්නාරම මරිච්චිකට්ටි ප්‍රදේශයේ මෙම කර්මාන්තයට විශේෂිත වූ කර්මාන්තපුරයක් පිහිටුවීමට අක්කර 75 ක

ඉඩමක් වෙන්කර එම ව්‍යාපෘතිය සම්බන්ධව ශක්‍යතා වාර්තාව සකස් කර ඇති අතර, ඉඩම පවරා ගැනීමේ කටයුතු වලට අනුමැතියක් ලබාගැනීම දුෂ්කරවී ඇති නිසා මෙම ව්‍යාපෘතිය සැලසුම් කල පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත.

- මෙම අමාත්‍යාංශය අපනයන සංවර්ධන මණ්ඩලය හා එක්ව 2007 වර්ෂයේ අන්තර්ජාතික මට්ටමේ සම්භාණ්ඩ හා පාවහන් ප්‍රදර්ශනයක් පවත්වනු ලැබූ අතර එම ප්‍රදර්ශනය සයවන වරටත් 2014 වසරේ පෙබරවාරි මස පවත්වනු ලැබීය. මෙමගින් කර්මාන්තකරුවන්ට විදේශීය වෙළඳපොළ අවස්ථා උදාකර ගැනීමට හා ඔවුන්ගේ කර්මාන්තයට නවතම විලාසිතාවන් එක්කර ගැනීමට අවස්ථාව සැලසේ.

## ඖෂධ හා සුවඳ විලවුන් කර්මාන්තය

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ඖෂධ නිෂ්පාදකයින් රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය යනුවෙන් දෙකොටසකි. ඖෂධ කර්මාන්තයේ නියැලී සිටින දේශීය හා විදේශීය ඖෂධ නිෂ්පාදන සමාගම් 200 ක් පමණ ඇති අතර, මහා පරිමාණ නිෂ්පාදන සමාගම් 10 ක් පමණ එයට දායකත්වය සපයයි. දේශීය ඖෂධ නිෂ්පාදකයින් දස දෙනෙක් විසින් ප්‍රධාන වශයෙන් ඖෂධ වර්ග 100 ක් පමණ නිෂ්පාදනය කරයි. මුළු දේශීය වෙළඳපොල අවශ්‍යතාවයෙන් එය 15% ත් 18% පමණ අගයක් ගනී.

ඉහත ආනයනික ඖෂධ වෙළඳපොල සළකා බලන විට එයින් රු. බිලියන 20ක් රාජ්‍ය අංශයේ ආනයන වන අතර, රු. බිලියන 18ක ඖෂධ ආනයනය පෞද්ගලික අංශය සිදුකරයි. එසේම දේශීය ඖෂධ නිෂ්පාදනයේ වටිනාකම රු. බිලියන 7ක් පමණ වන අතර, එය දේශීය හා විදේශීය ඖෂධ නිෂ්පාදන සමාගම් කිහිපයක් විසින් සිදුකරනු ලබයි.

### සුවඳ විලවුන් කර්මාන්තය

වර්තමානය වනවිට දේශීය සුවඳ විලවුන් කර්මාන්තයෙහි නියුක්ත මහා පරිමාණ දේශීය මෙන්ම විදේශීය සමාගම් කිහිපයක් දැකිය හැකි අතර, එම සමාගම් දේශීය මෙන්ම විදේශීය වෙළඳපොල සඳහා භාණ්ඩ නිපදවීම සිදු කරයි.

### ප්‍රගතිය

- දේශීය ඖෂධ කර්මාන්ත සංවර්ධනය උදෙසා කොළඹ විශ්ව විද්‍යාලය තුළ පිහිටුවා ඇති ශ්‍රී ලංකා ඖෂධ පර්යේෂණ ආයතනයෙහි තෙවන අදියර යටතේ අවශ්‍ය අතිරේක යන්ත්‍රෝපකරණ මිලදී ගෙන ඇති අතර ආයතනය පුළුල් කිරීමේ කටයුතු මේ වන විටත් සිදුකරමින් පවතී.
- ශ්‍රී ලංකා ඖෂධ පර්යේෂණ ආයතනයේ සේවාවන් වඩා කාර්යක්ෂම කිරීම
- රජය සමග ඇති කර ගැනීමට නියමිත ගිවිසුම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය සමග සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඇති අතර පෞද්ගලික අංශයෙන් ඖෂධ මිලදී ගැනීමට අවශ්‍ය ක්‍රියා පටිපාටිය සැකසෙමින් පවතී.

- දේශීය ඖෂධ කර්මාන්තය ජාත්‍යන්තර තලයට ගෙන ඒම සඳහා, කර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීමේ අරමුණ ඇතිව ඖෂධ නිෂ්පාදන කර්මාන්ත උද්‍යානයක් පිහිටුවීමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විටත් සිදුකරමින් පවතී.
- දේශීය සුවඳ විලවුන් කර්මාන්ත සඳහා අවශ්‍ය, නවීන මෝස්තරයන්ට අනුව නිපදවා ඇති ඇසුරුම් ද්‍රව්‍ය ආනයනය කිරීමේදී බදු සහන ලබා දීමට කටයුතු කර ඇත.

# කර්මාන්ත ලියාපදිංචි, ඵලදායිතා වර්ධන හා කළමනාකරණ තොරතුරු අංශය

**හැඳින්වීම**

ගෝලීය තරගකාරීත්වයට මුහුණ දිය හැකි අයුරින් ශ්‍රී ලාංකික කාර්මික නිෂ්පාදන වල ගුණාත්මකභාවය හා ප්‍රමිතීන් ශක්තිමත් කර කාර්මික නිෂ්පාදන අංශයේ ඵලදායීතාවය ඉහල නැංවීමට අවශ්‍ය පරිසරයක් සකස් කිරීම සඳහා පහසුකම් සැලසීම, නිෂ්පාදන කර්මාන්ත සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදකයන්ට අවශ්‍ය වන තොරතුරු පද්ධතියක් සකස් කිරීම සහ කර්මාන්ත වලට ඍජුවම තොරතුරු ලබා ගත හැකිවන ආකාරයෙන් අමාත්‍යාංශ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සහ පවත්වා ගෙන යාම මෙම අංශය මඟින් සිදු කෙරේ.

**ක්‍රියාකාරකම්**

- තාක්ෂණය වැඩිදියුණු කරගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම සහ යෝග්‍ය තාක්ෂණය හඳුන්වා දීම, ප්‍රවර්ධනය කිරීම.
- බලශක්ති කාර්යක්ෂමතාවය ඉහල දැමීම සහ බලශක්ති පිරිවැය අවම කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- කර්මාන්තයන්ගෙන් සිදුවන පාරිසරික බලපෑම් අවම කිරීමට පහසුකම් සැපයීම.
- නිෂ්පාදන කර්මාන්ත ලියාපදිංචි කිරීම සහ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම.
- අමාත්‍යාංශ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සහ පවත්වා ගෙන යාම.
- ප්‍රතිපත්ති සම්පාදනය සඳහා කාර්මික තොරතුරු විශ්ලේෂණය කිරීම සහ විවිධ සංඛ්‍යානමය වාර්තා සැකසීම.

**2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය**

**කර්මාන්ත ලියාපදිංචි කිරීම**

1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනතට අනුකූලව ලියාපදිංචි වීමට ඉල්ලුම් කරනු ලබන සියළු කර්මාන්ත සම්බන්ධයෙන් පරීක්ෂණ වාර්තාවක් අදාල ප්‍රාදේශීය කාර්යාලයේ වගකිව යුතු නිලධාරියෙකු/නිලධාරිනියක විසින් විසින් කරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් පසුව සකස් කරනු ලබන සවිස්තරාත්මක පරීක්ෂණ වාර්තාවක් (නිර්දේශ සහිතව) පදනම් කොට ගෙන ය.

**2014 වර්ෂයේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇති කර්මාන්ත ආයතන (උප අංශ වශයෙන් )**

| | උප අංශය | ආයතන සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ආහාර පාන වර්ග හා දුම්කොළ නිෂ්පාදන | 23 |
| 2. | රෙදිපිළි ඇගළුම් සහ සම් නිෂ්පාදන | 05 |
| 3. | දැව සහ දැව නිෂ්පාදන | 03 |
| 4. | කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන | 02 |
| 5. | රසායනික, ඛණිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 17 |
| 6. | ලෝහ නොවන නිෂ්පාදන | 06 |
| 7. | මූලික ලෝහ නිෂ්පාදන | 01 |
| 8. | සැකසූ ලෝහ නිෂ්පාදන | 12 |
| 9. | අනෙකුත් | 00 |
| | **එකතුව** | **69** |

*මූලාශ්‍රය: කර්මාන්ත ලියාපදිංචිය ආශ්‍රිත දත්ත සමුදාය*

කර්මාන්ත ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පතෙහි අඩංගු දත්ත පාදක කොටගෙන මෙම දත්ත සමුදාය ගොඩනගා ඇති අතර එය නිරතුරුව යාවත්කාලීන කරනු ලබයි. එහි කර්මාන්ත ශාලාවේ පිහිටීම, අයිතිය, නිෂ්පාදන භාණ්ඩ, ඒවායේ නිෂ්පාදන

ප්‍රමාණය හා වටිනාකම, ස්ථාවර වත්කම්වල වටිනාකම හා සේවක සංඛ්‍යාව යනාදී තොරතුරු අඩංගුව ඇත.

- පසුගිය කාල පරිච්ඡේදය හා සැසඳීමේදී කර්මාන්ත ලියාපදිංචියේ 3.7% ක වර්ධනයක් පෙන්නුම් කරයි.
- පසුගිය කාල පරිච්ඡේදය හා සැසඳීමේ දී කර්මාන්ත ලියාපදිංචියේ වැඩිම වර්ධනයක් (8%) පෙන්නුම් කරනුයේ සැකසූ ලෝහ නිෂ්පාදන අංශය යටතේ ය.
- මුළු ලියාපදිංචි කර්මාන්ත සංඛ්‍යාව හා සැසඳීමේ දී වැඩිම දායකත්වයක් වන 22.7% ක් පෙන්නුම් කරනුයේ රසායනික, ඛණිජ තෙල්, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන අංශය මඟිනි.

**වෙබ් අඩවිය ආශ්‍රිත කටයුතු**

වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කිරීම (refurbish) යටතේ අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වැඩිදියුණු කළ අතර මාර්ගගත ක්‍රම මඟින් කර්මාන්ත ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත ඉදිරිපත් කිරීමේ පහසුකම, දැනට අඩංගු විමසුම් තොරතුරුවල වෙනසක් ඇත්නම් එය මාර්ගගතව (online) දැනුම් දීමේ පහසුකම හා වෙබ් ආශ්‍රිත දත්ත සමුදාය මඟින් විවිධ දත්ත ක්ෂේත්‍ර පාදකකොට ගනිමින් සංඛ්‍යා ලේඛන වාර්තා මාර්ගගතව සැකසීම වැනි පහසුකම් ඇතිකර ඇත.

**පුස්තකාල සේවය**

අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් විමසනු ලදුව එම අවශ්‍යතා මත විවිධ පොත්පත්, සඟරා, කාලීන වාර ප්‍රකාශන හා වාර්තා යනාදීය පුස්තකාලය සඳහා මිලදී ගැනීමට පසුගිය කාලය තුළ කටයුතු සලසන ලදී. පුස්තකාලය භාවිතා කරන අයගේ පහසුව සඳහා එහි අභ්‍යන්තර පිහිටීම ද ක්‍රමවත්ව සකසන ලදී.

**බලශක්ති කාර්යාක්ෂමතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය**

හෝමාගම, මාකඳුර සහ දංකොටුව කර්මාන්තපුරවලින් තෝරාගත් කර්මාන්තශාලා 15 ක මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. මේ සම්බන්ධයෙන්, මෙහෙයුම් කමිටුවක් ද පිහිටුවා ඇති අතර ව්‍යාපෘතිය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් උපදේශක ආයතනයක් සමඟ ගිවිසුමක් ද අමාත්‍යාංශය විසින් අත්සන් කොට ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකයන් වන්නේ මූලික බලශක්ති විගණනය, විස්තරාත්මක බලශක්ති විගණනය, බලශක්ති අවස්ථා ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගති පාලනය යි.

කර්මාන්ත ශාලා 15 සඳහා බලශක්ති විගණනය කිරීම සහ කර්මාන්ත ශාලා සඳහා විස්තරාත්මක බලශක්ති විගණන සකස් කිරීම උපදේශකයන් / විගණකයන් විසින් මේ වන විට නිම කොට ඇත. බොහෝ කර්මාන්ත ශාලා විසින් බලශක්තිය පිරිමැසීමේ ක්‍රම ක්‍රියාත්මක කර ඇති අතර සැලකිය යුතු ආකාරයෙන් බලශක්ති පිරිවැය අඩුවීමක් නිරීක්ෂණය වී ඇත. සමස්ත බලශක්ති විගණනය තුළින් ලද ප්‍රතිපෝෂණය හා සමස්ත නිරීක්ෂණ පිළිබඳ කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් දංකොටුව කර්මාන්තපුරයේ පැවැත්වීමට ඉදිරියේ දී නියමිතව ඇත.

මීළඟ අදියරේ දී, තවත් කර්මාන්ත ශාලා 15 ක් සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිත ය. මේ සඳහා කර්මාන්තකරුවන් තෝරාගැනීම විවෘත ආරාධනා මඟින් සිදුකෙරෙන අතර ඉහල බලශක්ති පිරිමැසීමක් සිදුකරන මහා පරිමාණ බලශක්ති පාරිභෝගිකයන් සඳහා ප්‍රමුඛතාවය හිමිවේ.

නිෂ්පාදන කර්මාන්ත අංශයේ අපද්‍රව්‍ය හුවමාරුව මඟින් කාර්මික අපද්‍රව්‍ය

කළමනාකරණය හා අතුරු නිෂ්පාදන වැඩිදියුණු කිරීමේ වැඩසටහන

ආරම්භයේ දී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද්දේ බස්නාහිර, වයඹ, මධ්‍යම හා දකුණු පළාත්වලින් කාර්මික අපද්‍රව්‍ය රැස්කිරීමටත්, කර්මාන්තපුර වලින් අපද්‍රව්‍ය එක්රැස් කරන කර්මාන්ත ධෛර්යමත් කිරීමට ය. එහෙත් පළාත් පාලන ආයතන මට්ටමේ දී අපද්‍රව්‍ය රැස්කිරීම හා වෙන්කිරීම සම්බන්ධයෙන් ඇති වූ ප්‍රායෝගික දුෂ්කරතා නිසා මෙම ව්‍යාපෘතිය අමාත්‍යාංශය යටතේ ඇති දංකොටුව කර්මාන්තපුරයේ ක්‍රියාත්මක කිරීමට තීරණය විය. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය අමාත්‍යාංශය යටතේ ඇති කර්මාන්තපුරවල ක්‍රියාත්මක කිරීමට තීරණය වූ අතර, නිෂ්පාදන ක්‍රියාවලියේ දී ජනනය වන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් මනා ලෙස සැලසුම් කරන ලද ක්‍රමවේදයක් හඳුන්වා දීමට නියමිත ය. මෙම ව්‍යාපෘතිය ජාතික සුපිරිසිදු නිෂ්පාදන ආයතනය (NCPC) මඟින් ක්‍රියාත්මක කෙරෙන අතර, එම ආයතනය මඟින් දංකොටුව කර්මාන්තපුරයේ තෝරා ගත් කර්මාන්ත ආයතන 05 සඳහා අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන සැලැස්ම නිර්මාණය කිරීම මේ වන විට අවසන් කර ඇත. කර්මාන්තකරුවන් හා එක්ව ඉහත යෝජනා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇත.

**කර්මාන්ත සහායක සේවා සැපයීම**

මෙම අංශය වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යයක් වන්නේ 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනතට අනුකූලව නිෂ්පාදන කර්මාන්ත මෙම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කිරීම ය. මෙම ලියාපදිංචි කර්මාන්තවලට අදාළ දත්ත පාදක කොට මෙම අංශය මඟින් දත්ත සමුදායක් පවත්වාගෙන යනු ලබන අතර ඒ සඳහා ලියාපදිංචියේ දී ලබාගන්නා වූ මූලික දත්ත වන කර්මාන්තයේ පිහිටීම නිෂ්පාදන භාණ්ඩ හා ඇමතුම් තොරතුරු යනාදිය ඇතුලත්ව ඇත. මෙයට අමතරව විශේෂයෙන් බාහිර පරිශීලකයන්ගේ පහසුව උදෙසා ලියාපදිංචි කර්මාන්තවල මූලික දත්ත අප වෙබ් අඩවිය වන www.industry.gov.lk. තුලින් ලබාගත හැකිවන පරිදි වෙබ් ආශ්‍රිත දත්ත සමුදායක් ද පවත්වාගෙන යනු ලබයි. තවද, මෙම රැස්කරනු ලබන දත්ත සකස්කොට විශ්ලේෂණය කිරීමෙන් පසු බාහිර වශයෙන් දත්ත පරිශීලනය කරනු ලබන උපදේශකවරුන්, පර්යේෂකයින්, සහ සිසුන් වැනි කාණ්ඩ වෙත ඔවුන්ගේ අවශ්‍යතා මත බෙදා හරිනු ලබන අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර පරිශීලන කටයුතු සඳහා ද යොදාගනු ලැබේ. තවද සාර්ව මට්ටමේ දත්ත ඇතුලත් දත්ත සමුදායකයක් ද පවත්වාගෙන යනු ලබන අතර එමඟින් කර්මාන්ත අංශයේ ක්‍රියාකාරිත්වය අනෙකුත් අංශ හා ජාතික මට්ටමෙන් ඇගයීමකට ලක්කරනු ඇත.

**කර්මාන්ත ලියාපදිංචි කිරීමේ ප්‍රාදේශීය ව්‍යාපෘතිය 2014**

| උප අංශය | ආයතන සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 1325 |
| ගම්පහ | 370 |
| කළුතර | 110 |
| ගාල්ල | 38 |
| පුත්තලම | 43 |
| නුවර | 87 |
| කුරුණෑගල | 40 |
| මාතර | 41 |
| හම්බන්තොට | 15 |
| නුවරඑළිය | 06 |
| රත්නපුර | 12 |

| | |
|---|---|
| අනුරාධපුරය | 12 |
| බදුල්ල | 07 |
| කෑගල්ල | 17 |
| මාතලේ | 18 |
| මොණරාගල | 02 |
| පොලොන්නරුව | 05 |
| අම්පාර | 07 |
| ත්‍රිකුණාමලය | 04 |
| මඩකලපුව | 02 |
| වව්නියාව | 01 |
| යාපනය | 04 |
| මන්නාරම | 01 |
| කිලිනොච්චි | 01 |
| මුලතිව් | 01 |
| **එකතුව** | **2169** |

*මූලාශ්‍රය: කර්මාන්ත හා ඵලදායීතා වර්ධන අංශය*

# රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය

**හැඳින්වීම**

රසායනික අවි සම්මුතිය (ර. අ. ස.) යනු රසායනික අවි වැඩිදියුණු කිරීම, නිෂ්පාදනය, හුවමාරු කිරීම තොග රැස්කිරීම හා භාවිතය තහනම් කිරීම හා ඒවා විනාශ කිරීම සඳහා වූ ජාත්‍යන්තර ගිවිසුමකි. සමූහ ඝාතක අවි ගණයට අයත් සියළු රසායනික අවි තහනම් කිරීම සඳහා මෙම සම්මුතිය 1993 වසරේ දී සම්මත කරගන්නා ලදී. තවද සම්මුතිය නිසි ලෙස ක්‍රියාත්මක වේදැයි තහවුරු කර ගැනීම උදෙසා යාන්ත්‍රණයක් සහිත වීම හේතුකොට ගෙන මෙම සම්මුතිය අනෙක් සම්මුතින්ගෙන් වෙනස්වේ. 2007 අංක 58 දරන රසායනික අවි සම්මුති පනත, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් 2008 අගෝස්තු 15 දින ශ්‍රී ලංකාව තුල බලාත්මක කරන ලදී.

රසායනික අවි සම්මුතිය යටතේ ක්‍රියාත්මක කළ යුතු වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට හා රසායනික අවි තහනම් කිරීමේ ජාත්‍යන්තර සංවිධානය හා අනෙකුත් සාමාජික රාජ්‍යයන් සමඟ සාධනීය සම්බන්ධතාවයක් පවත්වා ගැනීම සඳහා කේන්ද්‍රස්ථානයක් ලෙස රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය (ජාතික අධිකාරිය) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාශංය යටතේ ස්ථාපිත ඇත.

**2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය**

- **කර්මාන්ත ලියාපදිංචි කිරීම සහ නිර්දේශ නිකුත් කිරීම**

ජාතික අධිකාරිය විසින් මෙම වසරේ නව ආනයන කරන්නන්/ අපනයනකරුවන් 04 දෙනෙකු ලියාපදිංචි කර ඇති අතර කර්මාන්තකරුවන් / ආනයනය කරන්නන් 21 ගේ ලියාපදිංචිය යාවත්කාලීන කර ඇත. තවද ලැයිස්තුගත රසායනික ද්‍රව්‍යයන් ආනයනය කිරීම සඳහා මෙම වසරේ නිර්දේශ 85 ක් නිකුත්කර ඇත. මෙම නිර්දේශ නිකුත්කර ඇත්තේ ආනයනය කරන්නන්ගේ ඉල්ලීම මත රසායනික අවි සම්මුති පනතට යටත්වය.

- **රසායනික අවි තහනම් කිරීමේ සංවිධානය වෙත වාර්ෂික වාර්තා යැවීම**

රසායනික අවි සම්මුතියේ හයවන වගන්තියට අනුකූලව යැවිය යුතු වාර්ෂික ප්‍රකාශය හා දහවන වගන්තියට අනුකූලව ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂක වැඩපිළිවෙල පිළිබඳව වාර්තාව 2014 වර්ෂය සඳහා රසායනික අවි තහනම් කිරීමේ සංවිධානය වෙත යවා ඇත.

- **කාලානුරූපි විමර්ශන**

සාමාජික රාජ්‍යයන් විසින් ලැයිස්තුගත රසායනික ද්‍රව්‍ය ආශ්‍රයෙන් සිදුකරනු ලබන නිෂ්පාදන හා කාර්මික ක්‍රියාකාරකම් සත්‍යාපනය කිරීම සඳහා විමර්ශන සිදු කල යුතු අතරම රසායනික අවි සම්මුතියට අනුකූලව ප්‍රකාශන සැකසිය යුතුය.

- **ටෙම්පල්බර්ග් කර්මාන්තපුරය සමීක්ෂණය - ආරම්භක වැඩසටහන 2014 මාර්තු 07**

බස්නාහිර පලාත් ප්‍රාදේශීය කර්මාන්ත සේවා මධ්‍යස්ථානයේ ඉල්ලීමකට අනුව රසායනික ද්‍රව්‍ය සම්බන්ධ හදිසි අවස්ථා කළමනාකරණය කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක් ටෙම්පල්බර්ග් කර්මාන්තපුරයේ කර්මාන්තකරුවන් හට 2014 මාර්තු 07 දින පවත්වන ලදී. මෙහිදී රසායනික අනතුරු

කළමනාකරණය සඳහා සැලැස්මක් පිලියෙල කිරීම පිළිබඳව මුලික අවබෝධයක් ලබාදෙන ලදී. මෙම වැඩමුළුවේ මුලික අරමුණ වනුයේ කර්මාන්ත පරිශ්‍ර තුල ආරක්ෂාව හා සුරක්ෂිතතාවය තහවුරු කරගැනීම සඳහා ආධාර කිරීම හා ශ්‍රි ලංකාව තුල තිරසාර කර්මාන්ත සංවර්ධනයක් ලගා කරගැනීමත්ය.

- **අල් අමීයා මධ්‍ය මහා විද්‍යාලය සංවිධානය කරන ලද ප්‍රදර්ශනයට සහභාගි වීම**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය අධ්‍යාපන කොට්ඨාසයේ වැල්පොතුවැව පිහිටි අල් අමීයා මධ්‍ය මහා විද්‍යාලයේ හැටවන සංවත්සරය 2014 ජනවාරි 21 සිට 23 දක්වා පවත්වන ලදී. රසායනික අවි සම්මුතිය පිළිබඳවත්, උපද්‍රවකාරී රසායනික ද්‍රව්‍ය පිළිබඳව හා ඒවායින් ආරක්ෂාවන විධි විධාන පිළිබඳවත් පාසැල් ළමුන් හා මහජනතාව දැනුවත් කිරීම මෙම ප්‍රදර්ශනයට සහභාගි වීමේ අරමුණ විය.

- **දැයට කිරුළ සංවර්ධන වැඩසටහන**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රදේශයේ ගොවි ජනතාවට"කෘෂිරසායනික ද්‍රව්‍ය හා පොහොර ආරක්ෂාකාරී ලෙස භාවිතා කරන ආකාරය" පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2014 පෙබරවාරි 26 වන දින දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව පවත්වන ලදී. මහින්ද චින්තන ඉදිරි දැක්මේ "කෙතට අරුණැල්ල" තේමාව යටතේ මෙම වැඩසටහන ආරම්භ කල අතර කෘෂි රසායනික ද්‍රව්‍ය ආරක්ෂාකාරී ලෙස භාවිතා කරන ආකාරය පිළිබඳව ශ්‍රී ලංකාවේ ගොවි ජනතාව දැනුවත් කිරීම තුලින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉහල ප්‍රදේශයේ පැතිරෙන වකුගඩු රෝගය තුරන් කිරීම සඳහා දායක වීමත් මෙම වැඩසටහනේ අරමුණකි. වැඩසටහන අවසානයේ දී පුද්ගල ආරක්ෂිත උපකරණ සහභාගී වූ ගොවියන් අතරේ බෙදා දෙන ලදී.

- **2014 දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සහභාගි වීම**

ජාතික අධිකාරිය, 2014 කුලියාපිටිය පැවැත්වුනු දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සහභාගි වුණි. රසායනික ද්‍රව්‍ය ආරක්ෂාකාරී ලෙස භාවිතය පිළිබඳව වැඩමුළු 02 ක් ජාතික අධිකාරියේ ප්‍රදර්ශන සාමාජිකයන් විසින් පවත්වන ලදී. සෑම වැඩමුළුවක් අවසානයේදීම පුද්ගල ආරක්ෂිත උපකරණ සහභාගී වූවන් හට බෙදාදෙන ලදී.

- **සොකෝ නිලධාරින් සඳහා වූ වැඩමුළුව-2014 මාර්තු 03**

කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලය මඟින් කරන ලද ඉල්ලීමකට අනුව අපරාධයක් සිදුවුනු ස්ථානයක රසායනික ද්‍රව්‍යයන්හි නියැදි ලබාගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ දිනක වැඩමුළුක් SOCO නිලධාරින් සඳහා පවත්වන ලදී. රසායනික ද්‍රව්‍ය ආශ්‍රිතව සිදුවීමක් වු විට ඒ ස්ථානයට ප්‍රවේශ වී රසායනික ද්‍රව්‍යයන්හි නියැදි ලබාගැනීම හා ඒ සම්බන්ධ ආරක්ෂිත විධි විධාන පිළිබඳව මුලික දැනුමක් ලබාදෙන ලදී.

- **හදිසි අවස්ථා කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**

අධ්‍යාපනය තුලින් කාර්මික අනතුරු අවම කරගත හැකි බැවින් කාර්මික සුරක්ෂිතතාවය, පරිසර හා හදිසි අවස්ථා කළමනාකරණය පිළිබඳ මාස පහක සහතික පත්‍ර පාඨමාලාවක් කර්මාන්ත අංශයේ නියුතු පුද්ගලයන් සඳහා ජාතික අධිකාරිය කොළඹ විශ්ව විද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය සමඟ ආරම්භ කරන ලදී. මෙහි සමාරම්භක උළෙල කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේ දී 2014 අප්‍රේල් මස 26 වන දින පවත්වන ලදී.

- **4RS වැඩසටහන - ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා 2014 ජුලි 16-17**

ශ්‍රී ලංකා නාවික හමුදාවේ ඉල්ලීම පරිදි රසායනික අනතුරු/උපද්‍රව අවම කරගැනීම සඳහා ඉක්මන්, ප්‍රතිචාර දක්වන, බේරා ගැනීම් හා සහන සැලසීම සඳහා භට කණ්ඩායමකට 2014 ජුලි 16-17 දක්වා පුහුණු වැඩසහටනක් පවත්වන ලදී. දේශන හා ප්‍රයෝගික සැසි වලින් පුහුණු වැඩසටහන සමන්විත විය. වැඩසටහන අවසානයේ සහභාගි වූ නිලධාරින් 35 දෙනෙක් සඳහා සහතික පත්‍ර බෙදාදෙන ලදී.

- **හොල්සිම් ආයතනයේ උපද්‍රවකාරි රසායනික ද්‍රව්‍ය ප්‍රවහනය කරන්නන් සඳහා පුහුණු වැඩසටහන**

ජාතික අධිකාරිය, කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ (IHRA) සහයෝගය ඇතිව හෝල්සිම් ආයතනයේ උපද්‍රවකාරි රසායනික ද්‍රව්‍ය ප්‍රවහනය කරන්නන් සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

- **ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය සඳහා කරන ලද පුහුණු වැඩසටහන**

ජාතික අධිකාරිය, කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ සහයෝගය ඇතිව උපද්‍රවකාරි රසායනික ද්‍රව්‍ය කළමනාකරණය සහ හදිසි අවස්ථාවකදී ප්‍රතිචාර දැක්වීම පිළිබඳව පුහුණු වැඩසටහනක් ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයේ පරිසර දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා 2014 ජනවාරි 10-11 දක්වා BOI ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

# සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය

## හැඳින්වීම

සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන සියලුම සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වඩාත් ශක්‍ය හා තිරසාර රාජ්‍ය ආයතන බවට පත් කිරීමට අවශ්‍ය සහය ලබා දේ. එකී අරමුණු ඉටු කර ගැනීම සඳහා මෙම අංශය මඟින් මෙම රාජ්‍ය ආයතනවල සියලුම වත්කම් වල ඵලදායීතාව වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියා මාර්ග ගැනීම තුලින් ආදායම් උපරිම කිරීම සහ උපාය මාර්ගික ව්‍යාපාර සැලසුම් හඳුන්වා දීම තුළින් ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීමේ කටයුතු හඳුන්වා දීම ආරම්භ කර ඇත. ඊට අතිරේකව මෙම ව්‍යවස්ථාපිත ආයතනවල දෛනික ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම ද මෙම අංශය මඟින් සිදු කරයි.

**සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය යටතට ගැනෙන රාජ්‍ය ව්‍යාපාර ආයතන නම්,**

- මාන්තායි ලුණු සමාගම
- කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය
- ලංකා ලේලන්ඩ් සමාගම
- ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම

## මාන්තායි ලුණු සමාගම

මාන්තායි ලුණු සමාගම පූර්ණ වශයෙන් රජය සතු සමාගමක් වන අතර, ලුණු නිෂ්පාදනයේ හා විකිණීමේ කටයුතුවල නිරතව සිටියි. වර්තමානයේ මන්නාරම හා යාපනයේ චෙම්මනි ලුණු ලේවායන් ආයතනය සතුව පවත්නා අතර, මන්නාරම් ලේවාය මඟින් සාමාන්‍ය ලුණු, අඹරන ලද ලුණු හා අයඩීන් මිශ්‍ර ලුණු නිෂ්පාදනය කරනු ලබයි. නිෂ්පාදන කටයුතු අසාර්ථක වීම නිසා දැනට චෙම්මණි ලේවායෙහි නිෂ්පාදන කටයුතු නවත්වා ඇත. කෙසේ නමුත්, ඉදිරියේ දී නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමේ අරමුණින් කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීම සඳහා මෙම අමාත්‍යාංශය මඟින් ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. වර්ෂ 2012 දී මාන්තායි සෝල්ට් ලිමිටඩ් ආයතනය විසින් මෙම අමාත්‍යාංශයේ ද සහාය ඇතිව රු.මි. 25 ක පිරිවැයක් දරා අතිරේක ලුණු හෙක්ටයාර 53 ක් වැඩි දියුණු කරන ලද අතර, එමඟින් මෙම වසරේ දී මෙට්‍රික් ටොන් 4000 ක් වූ සාමාන්‍ය වාර්ෂික ලුණු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 5,500 ක් දක්වා වැඩි කරගැනීමට හැකි වී ඇත.

ආයතනය විසින් "රජ ලුණු" වෙළඳ නාමය යටතේ ලුණු නිෂ්පාදනය කර බෙදා හරින අතර, මසකට පැකට් 50,000 ක් අලෙවි කිරීමට හැකි වී ඇත. ආයතනය විසින් රු.මි. 35 ක පිරිවැයක් දරා මේස ලුණු නිෂ්පාදන යන්ත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා සැලසුම් කර ඇත. මේ වන විට ටෙන්ඩර් ඇගයීමේ ක්‍රියාවලිය අවසන් කර ඇති අතර 2014 දී හොඳම ලංසුකරු වෙත ටෙන්ඩරය පිරිනැමීමට නියමිතය. 2014 දෙසැම්බර් මස වන විට ආයතනය ලුණු මෙට්‍රික් ටොන් 4,643.7නිපදවන ලද අතර මෙට්‍රික් ටොන් 3050.6 ක් විකිණීමෙන් රු.මි. 35.1 ක මුදලක් උපයාගෙන ඇත. මෙම කාලය තුල ආයතනයේ මානව සම්පත් කටයුතු ද අමාත්‍යාංශය මඟින් අධීක්ෂණය කර ඇත.

## කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය

කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය පූර්ණ වශයෙන් රජය සතු සීමිත සමාගමකි. මෙම ආයතනය ශ්‍රී ලංකාවේ විශාලතම මිනිරන් කැණීම් ආයතනය වන අතර,

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි ගැඹුරින් අඩි 2000 ක් පමණ වන කහටගහ මිනිරන් පතලෙහි කැණීම් කටයුතු සිදුකරගෙන යනු ලබයි. කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් ආයතනය මිනිරන් කැණීම් කටයුතු සඳහා හැකියාව හා ශක්තිය ඇති එකම රාජ්‍ය ආයතනය ද වේ.

2014 වර්ෂයේ තුල දී ආයතනය විසින් ග්‍රැෆයිට් මෙට්‍රික් ටොන් 565.46 ක් නිෂ්පාදනය කර ඇති අතර එමගින් මෙට්‍රික් ටොන් 608.75 ක් අපනයනය කර ඇත. ග්‍රැෆයිට් විකිණීමෙන් ලද ආදායම රු. මි. 91.86 ක් වන අතර, ශුද්ධ බදු පෙර ලාභය රු.මි. 13.5 කි. ඉහත ක්‍රියාකාරකම් වලට අමතරව නව ඉල්ලම් ගවේෂණය සහ හඳුනාගැනීම, අගය එකතුකළ නිෂ්පාදන සංවර්ධනය සඳහා මෙකී කාලය තුලදී ආයෝජනය කර ඇත. කහටගහ ග්‍රැෆයිට් ආයතනය විසින් ආයතනයේ සේවක මණ්ඩලය 200 ක් දක්වා වැඩිකරන ලෙස ඉල්ලීමක් කර ඇති අතර, එකී ඉල්ලීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. තවද, නව සංවර්ධන කටයුතු වල සම්බන්ධීකරණය සහ සේවක මණ්ඩල කළමනාකරණය සඳහා සාමාන්‍යාධිකාරී තනතුරක් කහටගහ සේවක මණ්ඩල සැලැස්මට ඇතුලත් කරන ලෙස ඉල්ලීමක් ද ඉදිරිපත් කර ඇත. තවද, පතල් සේවකයින් වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙන ලෙස කහටගහ ග්‍රැෆයිට් ආයතනයට දන්වා ඇත.

**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය**

ශ්‍රී ලංකාවේ ආර්ථිකය වැඩි දියුණු කරලීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ඇති වැදගත්කම වටහාගෙන, 2006 අංක 17 දරණ පනත යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පිහිටුවා ඇති අතර, එමගින් විශේෂයෙන්ම රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිළිබඳ වැඩි අවදානයක් සහිතව ව්‍යවසාය සංවර්ධනයට පහසුකම් සැලසීම, උනන්දු කරලීම, ප්‍රවර්ධනය කිරීම හා අනුබල දීම සිදු කෙරේ.

ඒ අතුරින්, අධිකාරිය විසින් දිස්ත්‍රික් ව්‍යවසාය සංසද පිහිටුවීම, ගමට ඔබින ව්‍යාපාර වැඩසටහන, සහ පර්ෂද සංවර්ධන වැඩසටහන් මඟින් ප්‍රාදේශීය මට්ටමේ හා දිස්ත්‍රික් මට්ටමේ කර්මාන්ත සංවර්ධනය සඳහා දායක වී ඇත. සලකා බලන ලද කාලය තුල දී ආයතනයේ මානව සම්පත් කටයුතු ශක්තිමත් කිරීම සඳහා අමාත්‍යාංශය පහත සඳහන් ලෙස දායක වී ඇත.

අමාත්‍යාංශය විසින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ද සහාය ඇතිව අධිකාරිය සඳහා බඳවාගැනීමේ පරිපාටිය සංවර්ධනය කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ද අනුමැතිය ඇතිව අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇත.

සංයුක්ත සැලැස්මේ සහ ක්‍රියාකාරී සැලැස්මේ පරිදි වැඩසටහන් ක්‍රියාත්මක වී ඇත්ද යන්න සොයා බැලීම සඳහා ප්‍රගති සමාලෝචන වැඩසටහන් පවත්වා ඇත.

සලකා බලන ලද කාලය තුල දී විගණකාධිපති විසින් යොමු කොට ඇති විගණන විමසුම් අනුව ඒවා නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

**ලංකා ලේලන්ඩ් සමාගම**

ලංකා ලේලන්ඩ් සමාගම 100% ක් පූර්ණ රජය සතු සමාගමක් වන අතර, 2008 වර්ෂයේ සිට මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ලංකා ලේලන්ඩ් සමාගම විසින් රජය සතු ලංකා අශෝක් ලේලන්ඩ් සමාගමේ කොටස් 42% ක් කළමනාකරණය කරනු ලබන අතර වෙනත් කිසිදු මෙහෙයුම් කටයුත්තක් සිදු නොකරයි.

**ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම**

මිල කල සමාගමක් වන ලංකා අශෝක් ලේලන්ඩ් සීමිත සමාගම, ශ්‍රී ලංකා රජය සමග පවත්නා බද්ධ ව්‍යාපාරයක් ලෙස 1982 දී ශ්‍රී ලංකාව තුල පිහිටුවන ලද අතර, 100% ක් ශ්‍රී ලංකා රජය සතු ලංකා ලේලන්ඩ් සමාගම නියෝජනය කරන 42% ක කොටස් ප්‍රාග්ධනයක් ද ඉන්දියාවේ අශෝක් ලේලන්ඩ් සමාගමට 28% ක කොටස් ප්‍රාග්ධනයක්ද ඉතිරි 30% ක කොටස් මහජනයා සතුව පවත්නා සමාගමකි. සමාගම විසින් "අශෝක් ලේලන්ඩ්" නාමය යටතේ වාණිජමය වාහන එකලස් කරන අතර, සම්පූර්ණයෙන් නිම කල අශෝක් ලේලන්ඩ් බස් රථ, ට්‍රක් රථ, ට්‍රක් රථ සඳහා අවශ්‍ය බඳ කොටස් , අමතර කොටස්, ජෙනරේටර සහ උපාංග ආනයනය සහ අලෙවි කිරිම සිදු කරනු ලබයි. මීට අමතරව, අශෝක් ලේලන්ඩ් භාණ්ඩ හා මගී ප්‍රවාහන වාහන අළුත්වැඩියා කිරීම හා සම්පූර්ණයෙන් අළුත්වැඩියා කිරීම සිදු කරයි. අමාත්‍යාංශය විසින් ආයතනයේ වාණිජ කටයුතු හා මානව සම්පත් කළමනාකරණ කටයුතු අධීක්ෂණය කරනු ලබන අතර ආයතනය සඳහා විදේශීය සේවකයින්ගේ සේවා අවශ්‍යතාවන් සලකා බලා වීසා දීර්ඝ කිරීම් සිදු කරනු ලබයි.

**කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය 111 - චක්‍රීය අරමුදල**

**හැඳින්වීම**

චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය 2012 මැයි 01 වන දින සිට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ව්‍යාපෘති කලමනාකරණ ඒකකය හරහා ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

**අරමුණ**

චක්‍රීය අරමුදලණය යෝජනා ක්‍රමය මඟින් අඩු පොළියක් යටතේ නව ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ තිබෙන ව්‍යාපාරයක ඵලදායීතාව හෝ මෙහෙයුම් මට්ටම වැඩි දියුණු කරගැනීමට හෝ ඒවායේ නිෂ්පාදන වල ගුණාත්මකභාවය වැඩි දියුණු කර ගැනීමට ණය සපයනු ලබයි. තවද, කුඩා හා සුළු පරිමාණ ව්‍යවසායන්වල සංවිධානාත්මක හැකියාව හා නිෂ්පාදන සංවර්ධනය වැඩි දියුණු කිරීම ද මෙමඟින් ආවරණය කරනු ලබයි.

**ක්‍රියාත්මක ක්‍රමවේදය**

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් වර්ග දෙකක් ඇති අතර, ඒවා සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය සහ තාක්ෂණික හුවමාරු සහයෝගී ණය යෝජනා ක්‍රමය නමින්වේ.

1. සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය - මේ යටතේ සියලුම නිෂ්පාදන හා කාර්මික උප අංශ සලකා බලනු ලබයි.
2. තාක්ෂණික හුවමාරු සහයෝගී ණය යෝජනා ක්‍රමය - මේ යටතේ වන උප ව්‍යාපෘති මඟින් කාර්ය මණ්ඩල වල ගණකාධිකරණ, කළමනාකරණ හෝ තාක්ෂණික දැනුම ඉහල නැංවීමක් හෝ රසායනාගාර උපකරණ ද ඇතුලුව තත්ත්ව පාලන උපකරණ මිලදී ගැනීමක් මඟින් අවසාන නිෂ්පාදිතයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීමක් හෝ සලකා බලනු ලබයි.

මෙම ව්‍යාපෘතිය මඟින් සහභාගීත්ව ණය දෙන ආයතන 10 ක් හරහා (ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, ඩී එෆ් සී සී බැංකුව හා සණස සංවර්ධන බැංකුව) උප ණය ලබා දීම සිදු කරනු ලබන අතර 2013 ජූලි මස සිට ණය නිදහස් කිරීම ආරම්භ කර ඇත.

**ණය පිළිබඳ විස්තර**

| **ණය යෝජනා ක්‍රමයේ තොරතුරු** | **සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය** | **තාක්ෂණික හුවමාරු සහයෝගී ණය යෝජනා ක්‍රමය** |
|---|---|---|
| ***උපරිම ණය සීමාව*** | රු. මි. 5 | රු. මි. 2.5 |
| ***පොළිය*** | 9 % | 5 % |
| ***ආපසු ගෙවීමේ කාලසීමාව*** | වසර 10<br>(වසර දෙකක සහන කාලය සමග) | වසර 07<br>(වසර දෙකක සහන කාලය සමග) |

*මූලාශ්‍රය:- සුළු හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රමය*

**2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය**

අපගේ වාර්තා වලට අනුව, 2014 අවසන් වන විට මෙම අරමුදල සතුව රු.බි. 9.4 ක් ඇත. 2014 ණය අයදුම්පත් 1,381 ක් ලැබී ඇති අතර, ඉන් අයදුම්පත් 1,244 ක් ණය ලබාදීම සඳහා සුදුසුකම් ලත් ව්‍යාපෘතීන් ලෙස සලකා ඇත. ඉන් උප ව්‍යාපෘතීන් 249 ක් සඳහා මුදල් වෙන් කොට ඇති අතර වෙන්කොට ඇති මුදල රු.මි. 609 42 කි. තවද, උප ව්‍යාපෘතීන් 318 ක් සඳහා රු.මි. 806 426 ක මුදලක් බැංකු වෙත ප්‍රතිපූරණය කර ඇත. මෙම වර්ෂය තුලදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකින් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් හොරණ, හංවැල්ල, මාතලේ සහ යාපනය යන ස්ථාන වල පවත්වා ඇත. විශේෂයෙන්ම 2014.09.25 වන දින ජාතික රූපවාහිනියේ "දිරියට සවියක්" යන තේමාව යටතේ වැඩසටහනක් පවත්වා ඇත.

# කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

**හැඳින්වීම**

''කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්'' ආයතනය මඟින් කළමනාකරණය කරනු ලබන කහටගහ මිනිරන් පතල් පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි දොඩන්ගස්ලන්ද මඩුරාගොඩ ගම්මානයෙහිය. තවද එය, කොළඹ අගනුවර සිට ආසන්න වශයෙන් කිලෝමීටර 90 ක් පමණ දුරින් පිහිටා තිබේ. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන්නා වූ ද, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ සම්පූර්ණයෙන්ම රජය සතු සීමිත වගකීම් සහිත සමාගමක් වන එහි ප්‍රධාන කොටස් හිමිකරු වන්නේ මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා ය. මූලික ප්‍රතිපත්තිමය තීරණ ගැනීම රේඛීය අමාත්‍යාංශය හරහා මහා භාණ්ඩාගාරයේ ආයතනික ප්‍රතිපත්ති මත විධායක සභාපතිවරයා ප්‍රධානකොට ගත් අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් සිදු කෙරේ.

මුහුදු මට්ටමේ සිට මීටර් 25 ක් උසින් කඳුකර පෙදෙසක කහටගහ පතල් පිහිටා තිබෙන අතර අක්කර 102 ක පමණ භූමි ප්‍රමාණයක් සමාගම සතුව පවතී. කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම පරිහරණය කරනු ලබන්නේ මිහිපිට භූමියෙන් අක්කර සුළු ප්‍රමාණයකි. පතල, එහි පුළුල්ම ස්ථානයේ දී මීටර් 500 ක් තරම් දක්වා වූ දුරකට ව්‍යාප්ත වේ. ඊට අමතරව, අක්කර 102 න් අක්කර 75 ක වූ පොල් වගාව ද, 'කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්' මඟින් කළමනාකරණය කරනු ලබයි.

පතල් ආවාට දෙකක් මඟින් ප්‍රවේශ විය හැකි අඩි 2000 (මීටර් 610) ක ගැඹුරකින් යුක්ත කහටගහ පතල වූ කලී, ශ්‍රී ලංකාවේ ගැඹුරුතම පතල වේ. කහටගහ පිහිටි එක් පතල් ආවාටයක් අඩි 1132 (මීටර් 345) ක් වන අතර කොලොන්ගහ අඩි 330 (මීටර් 101) ක් දක්වා ගමන් කරයි. අඩි 2000 (මීටර් 610) දක්වා ගමන් කිරීමට අනෙකුත් ආවාට සඳහා විංච් යොදා ගැනේ. ප්‍රධාන විංචිය අඩි 1132 මට්ටම දක්වා ගමන් කරන අතර, එතැන් සිට අඩි 2000 දක්වා අනෙකුත් විංච් මඟින් ගමන් කළ යුතු වේ.

ශ්‍රී ලංකාවේ, බෝගල පතල් සහ කහටගහ පතල් යනුවෙන් නම්කර ඇති ප්‍රධාන පතල් දෙකකි. 1872 සිට කහටගහ සහ කොලොන්ගහ පතල් දෙකක් වශයෙන් මෙහෙයුම් කටයුතු සිදු කෙරුණි. දැනට, මෙම පතල් දෙක සම්බන්ධ කොට එකම පතලක් වශයෙන් ක්‍රියාත්මක වේ.

**කහටගහ අනන්‍ය වූ නිෂ්පාදන**

ඉහල කාබන් ප්‍රතිශතයකින් යුත්, ස්වභාවික ස්ඵටික ඉල්ලම් මිනිරන් ලොවට සපයන අනන්‍ය සැපයුම්කරු වශයෙන් ශ්‍රී ලංකාවේ ලොව පිළිගෙන ඇති අතර විශේෂයෙන්ම, කහටගහ පතල් 99% කට වැඩි කාබන් ප්‍රතිශතයක් සහිත සම්පූර්ණයෙන්ම ස්ඵටික ඉල්ලම් මිනිරන් කැණීමේ හැකියාවකින් සමන්විත වේ. ඒවා සිහින් කීරි, කුට්ටි සහ පතුරු වශයෙන් දැකගත හැකි අතර අඩු භාෂ්මිකතාවයක් සහිත ඉහල කාබන් ප්‍රතිශතයකින් පමණක්ම සමන්විත වූ ස්ඵටික ඉල්ලම් මිනිරන් වශයෙන් බහුලව පවතී. තවද, ලොව පිළිගත් අනන්‍ය වූ නිෂ්පාදනයක් වශයෙන් ලෝක වෙළඳපොලෙහි කීර්තිනාමයක් තහවුරු කරගෙන තිබේ.

**සමාගම විසින් මිනිරන් අපනයනය කරනු ලබන රටවල්**


කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් යනු 100% ක්ම අපනයනයට නැඹුරු සමාගමක් වන අතර එහි ප්‍රධාන අපනයන රටවල් වන්නේ

ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, ජපානය, ඔස්ට්‍රේලියාව, ඉන්දියාව සහ පාකිස්ථානයයි. බෝයිං වර්ගයට අයත් ගුවන් යානා සඳහා සහ නාසා ආයතනයේ අභ්‍යවකාශ රොකට් පිළිබඳව සහ ඉදිරියේ දී සිදුකරනු ලබන පරීක්ෂා කිරීම් සඳහා පළමු වරට භාවිතා කරනු ලැබීමට බ්‍රිතාන්‍යයේ බෘනල් විශ්ව විද්‍යාලයෙන් නව විමසීම් කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම වෙත ලැබී තිබේ.

## 2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය

- **නිෂ්පාදනය**

2014/15 වර්ෂය තුල මුළු මිනිරන් (කණින ලද) නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 656.46 කි. 2006 වර්ෂයේ දී පතල් කටයුතු නැවත ආරම්භ කිරීමෙන් අනතුරුව අද දක්වා මුළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 6062.3 කි. 2014/15 මාසයකට නිෂ්පාදන ඉලක්කය මෙට්‍රික් ටොන් 100 කි.




පසුගිය අවුරුදු 10 සමග සසඳා බැලීමේ දී ඒක පුද්ගල මාසික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 0.138 සිට 1.19 දක්වා වැඩි වී තිබේ.

- **ඵලදායීතාවය**


පසුගිය වසරෙහි මිනිස් වැඩ මුරයකට කිලෝ ග්‍රෑම් 45 ක් වූ ඵලදායීතාවයට සාපේක්ෂව පවතින සාමාන්‍ය ඵලදායීතාවය කිලෝ ග්‍රෑම් 45.88 කි.

- **විකුණුම්**

ඇමරිකා එක්සත් ජනපදයේ ඇස්බරි ග්‍රැෆයිට් සමාගම සහ ජපානයේ එස්. කේටෝ සමාගම යන නිරන්තර, සාම්ප්‍රදායික ගැණුම්කරුවන් සමග 2007/ 2008 කාලය තුල මිනිරන් අපනයන වෙළෙඳපොල ක්‍රියාත්මක විය.


2000 වර්ෂයට පසු, ග්‍රැෆෙක්සෙල් සමාගම සමග ගණුදෙනු කරමින්, වර්ෂ 2011 දී යුරෝපීය වෙළෙඳපොල වෙත ප්‍රවේශ වී ඇති අතර එක්සත් රාජධානියේ වෙළෙඳපොල වෙත ඉහළ තත්වයේ මිනිරන් අපනයනය කෙරිණි.

ඒ අනුව 2014/15 වර්ෂයේ සැප්තැම්බර් 15 දක්වා කාලපරිච්ඡේදය තුල කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම මිනිරන් මෙට්‍රික් ටොන් 608.75 ක් අපනයනය කර තිබේ. පතල නැවත ආරම්භ කිරීමෙන් පසු 2006 වර්ෂයේ සිට 2014 මුළු අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 4913.66 කි. 2013/14 වර්ෂයේ දී විකුණුම් ආදායම රු.මි. 144 දක්වා වැඩි වී ඇත. පසුගිය වසරේ (2013/1) ආදායම හා සැසඳීමේ දී රු.මි. 91.68 ක් වූ ආදායම රු.මි. 52.4 කින් වැඩි වී ඇත. අන්තර් ජාතික මිනිරන් කර්මාන්තයේ ස්වභාවය අනුව වසරින් වසර සිදු වන්නා වූ විකුණුම් ඉහළ පහළ යාම මිනිරන් කර්මාන්තයේ ස්වභාවයයි.





- **අරමුදල්**

2014/15 තුල මුළු ආදායම රු.මි. 104.97 කි. පතල නැවත විවෘත කිරීමෙන් පසු 2006 සිට 2014 දක්වා කාලය තුල කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම රු.මි. 748.45 ක් උපයාගෙන තිබේ.




- **ලාභය**

2014/15 කාලපරිච්ඡේදය තුල සමාගම විසින් උපයාගෙන ඇති බදු පෙර ශුද්ධ ලාභය රු.මි. 13.5 කි. පතල නැවත විවෘත කිරීමෙන් පසු 2006 සිට 2014 දක්වා කාලය තුල කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් සමාගම රු.මි. 227.13 ක බදු පෙර ලාභයක් උපයාගෙන තිබේ.




- පතල් මෙහෙයුම් වියදම් සියල්ල සමාගම විසින් දරා ඇත.
- කහටගහ පතල සඳහා මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් සපයා නැත.
- 2014 දෙසැම්බර් 31 දක්වා බැංකු ශේෂය රු.මි. 4.69 කි.
- පාරිතෝෂික ගෙවීම් සඳහා ආයෝජන අරමුදල රු.මි. 5.67 කි.

- **තොග**

2014 දෙසැම්බර් 15 වන විට පවත්නා වත්මන් තොග ප්‍රමාණය මෙට්‍රික් ටොන් 762.1 ක් වන අතර එහි ආසන්න වෙළෙඳපොල අගය රු.මි. 168.4 කි.

- **සේවක සංඛ්‍යාව**

පුහුණු පතල් කරුවන් සහ වෙනත් අදාල තාක්ෂණික කාර්ය මණ්ඩලය ඇතුළුව සම්පූර්ණ සේවක සංඛ්‍යාව 110 කි. එක් කැණීම් ඉංජිනේරුවකු සහ ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරියෙකු පිළිවෙලින් ලංකා ෆෝස්ෆේට් ලිමිටඩ් ආයතනයෙන් සහ භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයෙන් බාහිර වශයෙන් ලබා ගෙන ඇත. සුදුසුකම් සහිත වරලත් ඉංජිනේරුවරයෙකු වර්ෂය තුල අර්ධ කාලීන පදනම මත පත් කරන ලදී.

# මාන්තායි සෝල්ට් සමාගම

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදන කර්මාන්තය සම්බන්ධව ඉතා දීර්ඝ ඉතිහාසයක් සහිත මාන්තායි සෝල්ට් සමාගම සාමාන්‍ය ලුණු නිෂ්පාදනය කර අයඩින් මිශ්‍ර ලුණු, අඹරන ලද ලුණු සහ කර්මාන්ත සඳහා අවශ්‍ය වන්නා වූ ලුණු යන විවිධ වර්ගවල ලුණු නිෂ්පාදන මෙරට නිපදවයි.

මාන්තායි සෝල්ට් ආයතනය යටතේ පාලනය වූ වෙම්මණි ලේවාය කටයුතු භූගෝලීය සාධක මත පවත්නා සම්පත් තුලින් අපේක්ෂිත නිෂ්පාදනය කරා ලඟා වීමට නොහැකි වූ බැවින් නැවත ලුණු නිෂ්පාදනය ආරම්භකිරීම සඳහා වූ ව්‍යාපෘති යෝජනා අමාත්‍යාංශය මඟින් සකස් කරමින් ඇත.

1938 දි ආරම්භ කරන ලද ලුණු දෙපාර්තමේන්තුව විවිධ පරිපාලන ආයතන යටතේ පාලනය වී 2001 වසරේ සිට මාන්තායි සෝල්ට් ලිමිටඩ් බවට පරිවර්තනය වී ඇත. මාන්තායි සෝල්ට් සමාගම කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ වර්තමානයේ පාලනය වේ.

ලංකාවේ අනිකුත් ප්‍රදේශවල ලුණු සමග සසදන කල මෙම ලුණු ඉතා හොඳ තත්ත්වයේ (Nacl 99.5) පවතී.

ස්වාභාවික සම්පත් උපයෝගි කරගෙන නිෂ්පාදනයන් සිදුකිරීමට අමතරව මන්නාරම දිස්ත්‍රික්කයේ මානව සම්පත් ද උපයෝගී කරගෙන ඇත. ශ්‍රම සම්පත ප්‍රයෝජනයට ගැනීමද මාන්තායි සෝල්ට් ආයතනයේ විශේෂත්වයකි. ස්ථිර සේවකයින් 43 දෙනෙකු සහ අනියම් සේවකයින් 90 දෙනෙකු වර්තමානය වන විට ආයතනයේ සේවයේ යෙදී සිටිති.

මුදල් අමාත්‍යාංශයේ සහ අනිකුත් රජයේ දෙපාර්තමේන්තු වලින් නියෝජනයෙන් සැදුම්ලත් වන අධ්‍යක්ෂක මණ්ඩලයක් මඟින් ආයතනයේ පාලනය සිදු කරයි. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ පවත්නා මෙම ආයතනයේ කටයුතු එම අමාත්‍යාංශයේ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල අංශය මඟින් මූල්‍යමය හා නීතිමය පාලනය සිදුකරනු ලබයි. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ආයතනය ලියාපදිංචි කර ඇත.

ආයතනයේ නිෂ්පාදන ප්‍රමිතිය පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් සහතික කර ඇත. මුදල් අමාත්‍යාංශය මඟින් නම් කල අනුමත විගණන සමාගමක් මඟින් ආයතනයේ විගණන කටයුතු සිදු කරයි.

## මන්නාරම ලුණු ලේවාය නිෂ්පාදන කටයුතු

2010 වන විට මන්නාරම ලේවායේ නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීමේ අරමුණින් අක්කර 240 ක් වූ ලේවායේ අක්කර 110 දක්වා නිෂ්පාදන බිම් ප්‍රමාණය සංවර්ධනය කර ඇත. ඉන් අනතුරුව 2011 වසරේ අක්කර 53 ක නිෂ්පාදන බිම් ප්‍රමාණයක් සංවර්ධනය කර ඇත. ඒ අනුව දැනට අක්කර 163 ක් වූ බිම් ප්‍රමාණයක ලුණු නිෂ්පාදන කටයුතු සිදුවේ. වාර්ෂික ලුණු නිෂ්පාදනය දල වශයෙන් වසරකට මෙට්‍රික් ටොන් 4500 ක් පමණ වේ. සංවර්ධන කටයුතු වලට පෙර ලංකාවේ මුළු ලුණු නිෂ්පාදනය 2.6% ක් වූ මන්නාරම ලේවායේ නිෂ්පාදන වර්තමානයේ 5% දක්වා වර්ධනය වී ඇත.

මාන්තායි සෝල්ට් සමාගම ලාභ උපයන ආයතනයකි. ආයතනයේ සංවර්ධන කටයුතු ද, නඩත්තු කිරීමේ කටයුතු ද, සේවක වැටුප් ද සහ සුභසාධක කටයුතු ද නිෂ්පාදන හා විකුණුම් ක්‍රියාවලියේ ලාභයෙන් සිදුකරයි.

රජයේ ප්‍රතිපාදන මගින් ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති සහ ආයෝජන ව්‍යාපෘති සිදුකරයි. මාන්තායි සෝල්ට් සමාගම ස්වයං මූල්‍යනය සහිත ආයතනයකි. මහා පරිමාණ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රතිපාදන දායකත්වය සහිතව ක්‍රියාත්මක වේ.

**2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය**

**සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය**

රු.මි. 35 ක වියදමින් නව මේස ලුණු නිෂ්පාදන පිරියතයක් මන්නාරම දිස්ත්‍රික්කයේ සැකසීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. ව්‍යාපෘතියේ ටෙන්ඩර් කටයුතු නිමකර ඇත.

**සංවධන ව්‍යාපෘති වල ප්‍රගතිය**

| ක්‍රියාකාරකම් | භෞතික ප්‍රගතිය | වෙන්කිරීම් (රු) | වියදම (රු) |
|---|---|---|---|
| ජල පොම්පාගාරයේ සංවර්ධන කටයුතු | වැඩ අවසන් | 542,000.00 | 542,544.00 |
| ජලය ලබාගැනීමේ පොම්පාගාරය දීර්ග කිරීම | වැඩ අවසන් | 61,000.00 | 43,505.00 |
| අයඩනීකරන යන්ත්‍රාගාරයේ වයර් දැල බිත්ති මට්ටම දක්වා ආවරණය කිරීම | | 13,600.00 | 13,600.00 |
| ගැඹුරු ටැංකි ප්‍රදේශ වල ගල් අතිරීම | වැඩ අවසන් | 600,000.00 | 400,000.40 |
| චීන ජැටිය වටා ගල් ඇතිරීම | සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවති | 200,000.00 | 198,000.00 |

*මූලාශ්‍රය: මාන්තායි සෝල්ට් ලිමිටඩ්*

**විකුණුම් හා නිෂ්පාදන ප්‍රගතිය**

| අංශය | ඉලක්ක (මෙ.ටො.) | ප්‍රගතිය (මෙ.ටො.) | සටහන |
|---|---|---|---|
| නිෂ්පාදනය | 5500 | 6099.60 | යෝග්‍ය පාරිසරික තත්වය හා කාරයමණ්ඩලයේ ඇඩි කැපවීම මත නිෂ්පාදන තත්වය කාර්යක්ෂම විය |
| විකුණුම් | 6229 | 4255 | තරගකාරීත්වයේ විනිවිද භාවය හේතුකොට ගෙන අලෙවි කළ ප්‍රමාණය ඉලක්ක විකුණුම් ප්‍රමාණයට වඩා සුළු වශයෙන් අඩුවිය |

*මූලාශ්‍රය: මාන්තායි සෝල්ට් ලිමිටඩ්*

**ආදායම් ප්‍රගතිය**

| | | | |
|---|---|---|---|
| ආදායම | රු. 74,848,810.00 | රු. 44,477,818.00 | විකුණුම් වටිනාකම ඇස්තමේන්තු කල වටිනාකමට වඩා අඩුවීම |
| එකතුකල අගය | - | රු. 31,405. 00 | ලුණු පැකට් වල තත්ත්ව සහතික විගණනය සඳහා ප්‍රමිති ආයතනයට රු.31,405 වියදමක් දැරීම |

*මූලාශ්‍රය: මාන්තායි සෝල්ට් ලිමිටඩ්*

# ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

**හැඳින්වීම**

සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරික අංශයට විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී ලංකාව තුළ ව්‍යවසාය සංවර්ධනය, ප්‍රවර්ධනය කිරීමට සහාය දැක්වීම, දිරි ගැන්වීම සහ පහසුකම් සැලසීම පිණිස 2006 අංක 17 දරණ පනත යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පිහිටුවා තිබේ.

**අරමුණු**

2006 අංකඃ 17 දරණ ජාතික ව්‍යවසාය සංවර්ධන පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ අරමුණු පහත පරිදි වේ.

- ශ්‍රී ලංකාව තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා දිරි දෙමින් ඒවා ප්‍රවර්ධනය කරමින් හා පහසුකම් සපයමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වර්ධනය, ප්‍රසාරණය හා සංවර්ධනය තහවුරු කිරීම.

- මෙම පනතේ අරමුණු සාක්ෂාත් කරගනු වස් විදේශ වෙළෙඳපලට ප්‍රවේශ වීමේ හැකියාව ඇති දේශීය ව්‍යාපාර ජාත්‍යන්තරකරණය කිරීමේ අදහසින් සැලසුම් කරන ලද ව්‍යාපාර ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ක්‍රියාත්මක කිරීම උනන්දුකොට දිරිගැන්වීම.
- උචිත ලෙස සම්පාදනය කරන ලද ප්‍රතිපත්ති, සැලසුම් හා ප්‍රවර්ධන දිරි ගැන්වීම් හඳුන්වා දීම සහ කාර්මික සහ කෘෂිකාර්මික අංශවල සංවර්ධනය සහ වෙළෙඳ ප්‍රවර්ධනය සඳහා සක්‍රීය ලෙස සහාය වීම.
- ව්‍යවසාය සංවර්ධනයේ අත්‍යවශ්‍ය සංරචකයක් ලෙස තාක්ෂණ නිපුණතා සම්බන්ධයෙන් මානව ප්‍රාග්ධන සංවර්ධනය සවිබල ගැන්වීම.
- සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- ව්‍යාපාර සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට මූල්‍ය අංශය වෙත ප්‍රවේශවීමේ පහසුකම් සැලසීම.
- නිෂ්පාදන වැඩිදියුණු කිරීම, තාක්ෂණික ප්‍රවර්ධනය හා පේටන්ට් අයිතිය වාණිජකරණය හා සම්බන්ධ අදාළ පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණ සංවර්ධන අරමුදලක් පිහිටුවීම.
- ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම.

**2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය**

**ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඇගයීමේ වැඩසටහන**

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම සහ ප්‍රතිපත්ති සම්පාදනයේදී නිවැරදි තොරතුරු ලබා ගත හැකි ලෙස එම ගැටළු වාර්තා ගත කිරීම සඳහා මෘදුකාංගයක් හඳුන්වා දීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පියවර ගන්නා ලදී. මෙය ආසියා සංවර්ධන පදනමේ අනුග්‍රහය මත ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම මෙම මෘදුකාංගය භාවිතය හා දත්ත ඇතුළු කිරීම සඳහා නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර යන දිස්ත්‍රික්ක තුළ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**මෘදුකාංගය ජාතික මට්ටමින් හඳුන්වාදීමේ වැඩසටහන**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සාම්ප්‍රදයික සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය සහ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය සමඟ එක්ව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

**ව්‍යවසායකත්ව සම්මාන උත්සව**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයෙහි ලා සුවිශාල දයකත්වයක් දක්වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හඳුනා ගැනීම, ඇගයීම සහ අභිප්‍රේරණය යන අරමුණු සහිතව මෙම ව්‍යවසායකත්ව සම්මාන උත්සව සැලසුම් කර ඇත.

මේ අනුව, දිස්ත්‍රික් වාණිජ මණ්ඩල සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සහයෝගය සහිතව උතුර, නැගෙනහිර, දකුණ, සහ මධ්‍යම පළාත් තුළ මෙම ව්‍යවසායකත්ව සම්මාන උත්සව 04 ක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

2014 සැප්තැම්බර් සහ ඔක්තොම්බර් යන මාස වල මෙම සම්මාන උත්සව පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කෙරෙමින් පවතී.

**දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ව්‍යවසාය සංසද ස්ථාපිත කිරීම සහ ශක්තිමත් කිරීම**

දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් ව්‍යවසායකයින් සඳහා සැපයෙන සේවා ශක්තිමත් කිරීම සඳහා මනා යාන්ත්‍රණයක් පිහිටුවීම අරමුණු කර ගනිමින් මෙම දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ව්‍යවසාය සංසද පිහිටුවීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පියවර ගෙන ඇත.

සියළුම දිස්ත්‍රික්ක තුළ දිස්ත්‍රික් ව්‍යවසාය සංසද පැවැත්වීමට සැලසුම් කර ඇති අතර සංසද රැස්වීම අවම වශයෙන් මාස තුනකට වරක් පැවැත්වීමට සැලසුම් කර ඇත. එමෙන්ම ප්‍රාදේශීය මට්ටමින් ප්‍රාදේශීය ව්‍යවසාය සංසද ස්ථාපිත කිරීමට කටයුතු යොද ඇත.

2014 වසරේදී දිස්ත්‍රික් ව්‍යවසාය සංසද 14 ක් ස්ථාපිත කරන ලද අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 34 ක ප්‍රාදේශීය ව්‍යවසාය සංසද පැවැත්වීමට කටයුතු කරන ලදී.

**තොරතුරු ප්‍රචාරණය**

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා වූ මාර්ගෝපදේශන ග්‍රන්ථය ප්‍රකාශනයට පත් කිරීම**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා සේවා සපයන ආයතන වල තොරතුරු ඇතුළත් ව්‍යාපාරික සේවා සපයන්නන්ගේ නාමාවලිය මුද්‍රණය කිරීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය අවශ්‍ය පියවර ගෙන ඇත. එමෙන්ම මෙම නාමවලිය ජාතික මට්ටමින් සහ ප්‍රාදේශීය මට්ටමින් හඳුන්වාදීමට සැලසුම් කර ඇත.

වයඹ, දකුණ, සබරගමුව සහ මධ්‍යම පළාත තුළ මෙම නාමාවලිය හඳුන්වාදීම උත්සවාකාරයෙන් සිදු කරන ලදී. එමෙන්ම ඉදිරියේදී අනෙකුත් පළාත් තුලද මෙම ග්‍රන්ථය හඳුන්වාදීමට බලාපොරොත්තු වේ.

**දිරියට සවිය රූපවාහිනී වැඩසටහන**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විද්‍යුත් මාධ්‍ය හරහා ව්‍යවසායකත්ව අධ්‍යාපන වැඩසටහන් විකාශනය කිරීමට සැලසුම් කර ඇත. ව්‍යාපාරික පුවත් සහ ව්‍යාපාරික දැනුම ව්‍යවසායකයින් වෙත ඉතා කාර්යක්ෂම ලෙස ලබා දීමට විද්‍යුත් මාධ්‍යට හැකියාව පවතී. මෙම වැඩසටහන් ඔස්සේ, සිද්ධි අධ්‍යන, ක්ෂේත්‍ර නිරීක්ෂණ, සහ සාකච්ඡා මණ්ඩප හරහා මෙම තොරතුරු ව්‍යවසායකයින් වෙත ලබා දීමට සැලසුම් කර ඇත. විනාඩි 30 ක කාල පරාසයකින් යුක්ත වන මෙම

වැඩසටහන සෑම මසකට වරක්ම විකාශනය කෙරේ.

**දිස්ත්‍රික් මට්ටමින් නව ව්‍යාපාර අවස්ථා ඇති කිරීම සහ ව්‍යාප්ත කිරීම**

මෙම වැඩසටහන මූල්‍යය ආයතන හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලැබේ. ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවය මත ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් සහ තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර අදල මූල්‍ය ආයතනය විසින් ප්‍රතිලාභීන්ගේ මූල්‍ය අවශ්‍යතා පිළිබඳව කටයුතු කරනු ලැබේ.

2014 වසරේදී ව්‍යවසායකයින් 654 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු ලබා දුන් අතර 660 දෙනෙකු සඳහා තාක්ෂණික පුහුණු ලබා දෙන ලදී.

**ශ්‍රී ලංකාවේ උගත් තරුණ පිරිස සඳහා ක්‍රියාත්මක වන ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන**

**වෘත්තීය පුහුණු තුළ නියැලෙන තරුණ පිරිස් සඳහා වූ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන**

ව්‍යවසායකත්ව කුසලතා වැඩිදියුණු කිරීම, මූල්‍යමය සහයෝගය සැපයීම, නව තාක්ෂණය හඳුන්වා දීම, සහ ව්‍යාපාර උපදේශනය හරහා තරුණ පිරිස් ශක්තිමත් කිරීම අරමුණු කොටගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. වැඩසටහනෙහි ඉලක්ක කණ්ඩායම ලෙස වෘත්තීය පුහුණු ආයතන/තාක්ෂණ විද්‍යාල තුළ අවසන් වසර සිසුන් තෝරා ගනු ලැබේ.

2014 වසරේදී, වයඹ පළාත් කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙහි වෘත්තිය පුහුණුව ලැබූ සිසුන් 34 දෙනෙකු සහ මධ්‍යම පළාත් කුඩා කර්මාන්ත දෙපාර්තමේතුවෙහි වෘත්තීය පුහුණුව ලැබූ සිසුන් 16 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු ලබා දෙන ලදී.

**කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන**

ව්‍යවසායකත්වය සඳහා කාන්තාවන් උනන්දු කරවීමත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා ඔවුනගේ දයකත්වය ඉහළ නැංවීමත් අරමුණු කොටගෙන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය කාන්තාවන් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව කුරුණෑගල, ගම්පහ සහ පුත්තලම යන දිස්ත්‍රික්ක වල හස්ත කර්මාන්ත අංශයේ ව්‍යාපාර වල නියුතු කාන්තාවන් ඒකාබද්ධ කොට කාන්තා ව්‍යාපාරික සංගම් පිහිටුවන ලදී. එමෙන්ම, ව්‍යාපාරික සංගම් පිහිටුවීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ කාන්තා ව්‍යවසායකයින් මේ වන විට හඳුනාගෙන ඇත.

මීට අමතරව හඳුනාගත් ව්‍යවසායක කණ්ඩායම් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව කාන්තා ව්‍යවසායකයින් 386 දෙනෙකු සඳහා තාක්ෂණික පුහුණු ලබා දුන් අතර, 69 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු ලබා දෙන ලදී.

**පර්ෂද සංවර්ධන වැඩසටහන**

මොරටුව වඩු කර්මාන්ත පර්ෂදය, වයඹ සහ දකුණු පළාත් කොහු කර්මාන්ත පර්ෂදය, ඌව සහ උතුරු පළාත් හස්ත කර්මාන්ත පර්ෂදය, උතුරු පළාත් ලුහු ඉංජිනේරු පර්ෂදය, මඩකලපුව කජු නිෂ්පාදන පර්ෂදය, පුත්තලම මැටි කර්මාන්ත සහ අත්යන්ත්‍ර පේෂකර්මාන්ත පර්ෂදය ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මඟින් හඳුනාගෙන ඇති පර්ෂද වේ. මෙම පර්ෂද සංවර්ධනය සඳහා ජාතික ව්‍යවසාය

සංවර්ධන අධිකාරිය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පර්ෂද සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වැඩසටහන්**

| | |
|---|---|
| මොරටුව වඩු කර්මාන්ත පර්ෂදය | තෝරාගත් වඩු කර්මාන්තකරුවන් 25 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර අවශ්‍යය යන්ත්‍රෝපකරණ ලබා දෙන ලදී |
| වයඹ සහ දකුණු පළාත් කොහු කර්මාන්ත පර්ෂදය | වයඹ සහ දකුණු පළාත් තුළ කොහුමෝල් හිමියන් සඳහා වැඩමුළුවක් ක්‍රියාත්මක කළ අතර කොහු අපනයනකරුවන් සඳහා පහසුකම් ඇති කරන ලදී. |
| මොණරාගල හස්ත කර්මාන්ත පර්ෂදය | මොණරාගල දිස්ත්‍රික්කයේ හස්ත කර්මාන්ත අංශයේ සහ ඇගළුම් නිෂ්පාදනයෙහි නිරත ව්‍යවසායකයින් 83 ක් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් 3 ක් සහ තාක්ෂණික පුහුණු වැඩසටහන් 3ක් ක්‍රියාත්මක කරන ලදී. |
| උතුරු පළාත් හස්ත කර්මාන්ත පර්ෂදය | හස්ත කර්මාන්තයේ නිරත ව්‍යවසායකයින් 58 ක් සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු 2ක් ක්‍රියාත්මක කරන ලදී. |
| උතුරු පළාත් ලුහු ඉංජිනේරු පර්ෂදය | උතුරු පළාතේ ලුහු ඉංජිනේරු අංශයේ ව්‍යවසායකයින් 45 දෙනෙකු සඳහා තාක්ෂණික පුහුණු වැඩසටහන් 2ක් ක්‍රියාත්මක කරන ලදී. |
| පුත්තලම මැටි කර්මාන්ත පර්ෂදය | පාර්ෂවකරුවන්ගේ වැඩමුළුවක් ක්‍රියාත්මක කරන ලදී |
| අත්යන්ත්‍ර පේෂකර්මාන්ත පර්ෂදය | කෑගල්ල සහ අනුරාධපුර දිස්ත්‍රික්ක වල පේෂකර්මාන්තකරුවන් 40 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු ක්‍රියාත්මක කරන ලදී. අත් යන්ත්‍ර පේෂකර්ම නිෂ්පාදන ගැණුම්කරුවන්ගේ හමුවක් කොළඹදී පවත්වන ලදී |
| සංචාරක | සංචාරක කර්මාන්තය ඉලක්ක කරගත් වෙළෙඳ ප්‍රචාරාත්මක යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ සමීක්ෂණ වාර්තාව සකස්කර එකී යෝජනාව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හා මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත.(ප්‍රදේශ දෙකක් දැනට හඳුනාගෙන ඇත) |
| ලුහු ඉංජිනේරු කර්මාන්තය - ගම්පහ | ලුහු ඉංජිනේරු කර්මාන්තයේ ගැටළු හඳුනාගෙන කර්මාන්තයේ නව පරිවර්තන වැඩසටහන පවත්වාගෙන යාම. |

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන සහයෝගිතා වැඩසටහන්**

**ව්‍යාපාරික සේවා සපයන්නන් සහ ව්‍යවසායකයින් සඳහා ක්‍රියාත්මක වන ධාරිතා සංවර්ධන වැඩසටහන්**

2014 වසරේදී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මඟින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ

ව්‍යවසායකයින් 12 දෙනෙකු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 2 ක් ක්‍රියාත්මක කරන ලදී.

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා ප්‍රාදේශීය සහයෝගීතා වැඩසටහන්**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියට අනුයුක්ත සංවර්ධන නිළධාරීන් හරහා ප්‍රාදේශීය මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා සේවා සැපයීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පියවර ගෙන ඇත. මේ හරහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් (ව්‍යවසායකත්වය, අළෙවිකරණය, තාක්ෂණික, ගිණුම් තැබීම, සහ අවශ්‍යතාවය මත පදනම් වූ වෙනත් පුහුණු වැඩසටහන්), මූල්‍ය හා වෙළඳපොළ සම්බන්ධීකරණය, ව්‍යාපාර උපදේශනය සහ අනෙකුත් ව්‍යාපාරික සේවා සැපයීම සිදු කෙරේ. මෙම නිළධාරීන් හරහා මේ වන විට ව්‍යවසායකයින් 1107 දෙනෙකු සඳහා තාක්ෂණික පුහුණු සහ ව්‍යවසායකයින් 800 සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු ලබා දී ඇත.

**ජාතික වැඩසටහන්**

**හඳුන්කූරු කර්මාන්ත සංවර්ධන වැඩසටහන**

දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන යටතේ ගෘහ කර්මාන්ත අංශය තුළ හඳුන්කූරු නිෂ්පාදන කර්මාන්තය සංවර්ධනය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පියවර ගෙන ඇත. මෙම වැඩසටහන සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරනු ලබයි.

2014 වසරේ දී ව්‍යවසායකයින් 745 දෙනෙකු සඳහා තාක්ෂණික පුහුණු ලබා දෙන ලදී.

**දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන**

මේ යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මල් වගාකරුවන් 132 දෙනෙකු සහ පුත්තලම දිස්ත්‍රික්කයේ හස්ත කර්මාන්තකරුවන් 34 දෙනෙකු සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු ලබා දෙන ලදී.

දකුණු පළාත සහ රත්නපුර දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරික සේවා සපයන්නන්ගේ නාමාවලියක් ප්‍රකාශනයට පත් කිරීම සඳහා තොරතුරු ඒකරාශී කර ඇත. මීට අමතරව ව්‍යවසායකයින් 738 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

# පේෂකර්මාන්ත සංවර්ධන අංශය

**හැඳින්වීම**

ශ්‍රී ලංකාව මෙම කලාපය තුල පේෂකර්ම හා ඇඟළුම් ක්ෂේත්‍රයෙහි වඩාත් නිර්මාණශීලී හා තරඟකාරී නිෂ්පාදකයෙකු බවට පත් කිරීමේ දැක්මෙන් යුතුව ජාතික ආර්ථිකය වෙත දායකත්වය ලබා දීම සඳහා පේෂ කර්මාන්ත සංවර්ධන අංශය මගින් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. පේෂකර්මාන්ත සංවර්ධන අංශයේ විෂය පථයට පහත සඳහන් කර්මාන්ත ක්ෂේත්‍රයන් අයත් වේ.

- අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය
- බලවේග පේෂ කර්මාන්තය
- ඇඟළුම් කර්මාන්තය

**2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය**

**අත්යන්ත්‍ර පේෂකර්මාන්තය**

අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයෙහි තිරසාර සංවර්ධනය උදෙසා පේෂකර්මාන්ත සංවර්ධන අංශය මඟින් දියත් කරනු ලබන වැඩසටහන් මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි දක්වා ඇති කරුණු පාදක කර ගනිමින් සකසා ඇත. එහි දක්වා ඇති පරිදි මූල්‍ය, තාක්ෂණය හා වෙළඳපොළ යනු අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයෙහි අවධානය යොමු කල යුතු මූලික ක්ෂේත්‍ර වේ. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා විසින් පත් කල කාර්යසාධන බලකායේ නිර්දේශ ප්‍රකාරව තිරසාර අත්යන්ත්‍ර පේෂකර්මාන්තයක් උදෙසා සංවර්ධනය කල යුතු අංශ ලෙස වෙළඳපොල, පුහුණුව, මෝස්තර නිර්මාණකරණය, තාක්ෂණය හා ව්‍යවසායකත්වය යන අංශ හඳුනාගෙන ඇත. කාර්යසාධන බලකාය මගින් සිදුකල නිර්දේශ පදනම් කර ගනිමින් අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයෙහි සංවර්ධනය උදෙසා සකසන ලද ක්‍රමවේදයන් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පේෂකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය, පේෂකර්ම සමුපකාර සමිති මගින් සිදු කරනු ලැබේ.

- **පේෂ ගම්මාන පිහිටුවීම, අත්යන්ත්‍ර සහ උපාංග අලුත්වැඩියා කිරීම හා පුහුණු පාඨමාලා පැවැත්වීමේ වැඩසටහන**

**පේෂ ගම්මාන පිහිටුවීමේ වැඩසටහන**

පේෂකර්ම දෙපාර්තමේන්තුව සමඟ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය එක්ව ක්‍රියාත්මක කරන මෙම ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය පුද්ගලික අංශ දෙපාර්ශවයෙහිම සහයෝගීතාවයෙන් යුතුව පවුල මුල් කර ගනිමින් ක්‍රියාත්මක කරන ගෘහ කර්මාන්ත ඒකක හඳුන්වා දෙනු ලැබේ. මෙහිදී මූලික මග පෙන්වීම හා අවශ්‍ය පහසුකම් සලසා පේෂ ගම්මාන පිහිටුවීම සිදු කරනු ලබන අතර අනතුරුව එම පේෂ ගම්මානයේ වියන්නන් විසින් එම පේෂ ගම්මානය තමන් විසින්ම පාලනය කරගෙන යනු ලබන ගෘහ කර්මාන්තයක් ලෙසට පරිවර්තනය කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම සිදු කරනු ලැබේ. මෙම සංකල්පය හරහා වියන්නියන් ඇතුලත් සමූහයන් ක්ෂුද්‍ර ව්‍යවසායකයන් බවට පත් කිරීම සඳහා ඔවුන් වෙත අත්යන්ත්‍ර උපකරණ හා අමුද්‍රව්‍ය ද සපයමින් ව්‍යවසායකයන් වශයෙන් කටයුතු කිරීමට ඔවුනට අවශ්‍ය පුහුණුව ද ලබා දෙනු ලැබේ. මෙම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පේෂකර්ම දෙපාර්තමේන්තුව වෙත රු.මි. 12 ක මුදලක් 2014 වර්ෂයේ දී ලබා දී ඇත.

**ඌණ උපයෝජන තත්ත්වයේ ඇති අත්යන්ත්‍ර සහ උපාංග අලුත්වැඩියා කිරීමේ වැඩසටහන**

අත්යන්ත්‍ර රෙදිපිළි සහ නිෂ්පාදන වල ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සහ එබඳු

නිෂ්පාදන කිරීම සඳහා වියන්නියන් වෙත පවතින අවස්ථා වර්ධනය කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. 2014 වර්ෂයේ දී ඌව පලාතේ අත් යන්ත්‍ර උපකරණ අළුත්වැඩියා කිරීම හා අත්යන්ත්‍ර උපකරණ සැපයිම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලදී.

**මානව සම්පත් සංවර්ධනය**

වියන්නන් තුළ ගුණාත්මක අත් යන්ත්‍ර පේෂකර්මාන්ත නිෂ්පාදනයන් හා අගය එකතු කළ නිෂ්පාදනයක් සඳහා පෙළඹවීමක් ඇති කිරීම වෙනුවෙන් නූල් වර්ණ ගැන්වීම හා වර්ණ සංයෝජනය පිළිබඳ පුහුණු පාඨමාලාව ද අත්යන්ත්‍ර නිෂ්පාදන සඳහා පවතින වෙළඳපොළ පුළුල් කිරීම සඳහා අගය එකතු කළ නිෂ්පාදන පුහුණු පාඨමාලාව ද හඳුන්වා දී ඇත. මේ වන විට පුහුණුලාභින් හැත්තෑ දෙනෙකු සඳහා පුහුණුව ලබා දි ඇති අතර පේෂ ගම්මාන වැඩසටහන වෙනුවෙන් පුහුණු පාඨමාලා 15 ක් පවත්වනු ලැබේ.

- **පේෂකර්මාන්ත සේවා මධ්‍යස්ථාන පිහිටුවීම සහ පේෂකර්මාන්ත ක්ෂේත්‍රයට අදාලව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**

**අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ප්‍රාදේශීය පේෂකර්මාන්ත සේවා මධ්‍යස්ථාන පිහිටුවීම**

එකම වහලක් යට අත් යන්ත්‍ර පේෂ කර්මාන්තයට අදාළ සියළු සේවා ලබාදීම අරමුණු කර ගනිමින් ප්‍රාදේශීය පේෂ සේවා මධ්‍යස්ථාන පිහිටුවනු ලැබේ. පුහුණු වැඩසටහන් ලබා දීම, ප්‍රදේශය තුල වියන්නන්ට තම අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත නිෂ්පාදනය ප්‍රදර්ශනයට අවස්ථාව ලබා දීම, නවීන තාක්ෂණයෙන් නූල් වර්ණ ගැන්වීමේ පහසුකම් ලබා දීම වැනි සේවා ඉන් කීපයකි. වයඹ පළාතේ පොල්ගහවෙල හා මධ්‍යම පළාතේ හාරගම ද නැගෙනහිර පළාතේ පාළමුණෛයි (ඉදිවෙමින් පවති) පේෂ මධ්‍යස්ථානය ද පිහිටුවා ඇති අතර පුහුණුව, කුසලතා ඔප් නැංවිම, මෝස්තර, නිෂ්පාදන සංවර්ධනය සඳහා පළාත් සභා මෙන්ම පුද්ගලික අංශයේ අයට ද අවස්ථාව ඇති අතර ව්‍යවසායකත්ව පුහුණුව ලබා දීම ද ඊට අයත්ය.

**අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයට අදාලව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම**

අත් යන්ත්‍ර පේෂකර්මාන්තයේ නිෂ්පාදන ධාරිතාව වැඩි දියුණු කිරිම සඳහා මෙන්ම ඵලදායිතාවය වැඩි දියුණු කිරිම අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක කරන මෙම වැඩසටහන යටතේ 2014 වර්ෂයේ දී දකුණු පළාතේ නියාගම පේෂ මධ්‍යස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් මුදල් ලබා දී ඇත.

**වෙළඳපොළ ප්‍රවර්ධන කටයුතු**

දේශීය ව්‍යවසායකත්වයන් ඉහළ නැංවීම හා අත් යන්ත්‍ර පේෂකර්මාන්තයේ නිෂ්පාදනයන්ට හොඳ වෙළඳපොළක් ලබාදීම හා අත් යන්ත්‍ර පේෂ කර්මාන්තයේ තිරසාර වර්ධනය අරමුණු කර ගනිමින් අමාත්‍යාංශය මඟින් වෙළඳපොළ ප්‍රවර්ධන වැඩසටහන් දියත් කරනු ලැබේ. ඒ අනුව ජාතික හා පළාත් අත් යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශන පවත්වනු ලබන අතර නිර්මාණශීලි බවින් යුතු අත් යන්ත්‍ර රෙදිපිළි හා ඒ ආශ්‍රිත නිර්මාණ දේශීය හා විදේශීය ගැනුම්කරුවන් අතර ප්‍රචලිත කරමින් විවිධාංගිකරණයෙන් යුතු වෙළඳපළක් ඇති කිරීම ඉන් සිදු කෙරේ. ගැනුම්කරුවන් හා වියන්නන් අතර සම්බන්ධීකරණ ජාලයන් ඇති කරමින් පේෂ ගම්මාන වල සිදු කරනු ලබන නිෂ්පාදන වෙනුවෙන් වඩා හොඳ වෙළඳපල අවස්ථා ලබා දීමට ද පියවර ගෙන ඇත.

**බලවේග පේෂ කර්මාන්තය**

- **පේෂකර්මාන්ත ක්ෂේත්‍රය තුල බලශක්ති සංරක්ෂණය හා ඵලදායිතාවය දියුණු කිරීමේ වැඩසටහන**

පේෂකර්මාන්ත ශාලාවන්හි ඵලදායීතාවය හා බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමත් තරඟකාරී ලෝක වෙළඳපල ප්‍රවණතාවන්ට මුහුණදීමත් අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. පුවත්පත් දැන්වීම් මගින් 2014 ජනවාරි මාසයේ දී මේ සඳහා දායක වීමට කැමැත්ත දක්වන කර්මාන්ත ශාලා හඳුනාගන්නා ලදී. මූලික අවස්ථා 04 ක් යටතේ බලශක්ති හා ඵලදායිතා සංවර්ධන වැඩසටහනට අදාල ක්‍රියාකාරී සැලැස්ම සකසා ඇති අතර වැඩසටහනට සහභාගි වන පේෂකර්මාන්ත ශාලාවන් තක්සේරු කරමින් ඔවුන් බලශක්ති සංරක්ෂණයට හා ඵලදායිතා සංවර්ධන වැඩසටහනට දායක කර ගැනීම සිදු කරනු ලැබේ. මෙම ව්‍යාපෘතියේ කොටසක් ලෙස මේ වන විට මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

**රාජ්‍ය අංශයේ නිළ ඇඳුම් රෙදිපිළි අවශ්‍යතාවය සපුරාලීම**

දේශීය රෙදිපිළි නිෂ්පාදකයන් මගින් ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුව, විශේෂ කාර්ය සාධන බලකාය, සිවිල් ආරක්ෂණ දෙපාර්තමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා ජාතික ශිෂ්‍ය භට බලකාය වෙත අවශ්‍ය නිළ ඇඳුම් රෙදිපිළි ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු අමාත්‍යාංශය මගින් පිහිටුවා ඇති දේශීය රෙදිපිළි බෙදා හැරීමේ කමිටුව මගින් සිදු කරනු ලැබේ.

**ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුව, විශේෂ කාර්ය බලකාය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, බන්ධනගාර දෙපාර්තමේන්තුව සහ ජාතික ශිෂ්‍යභට බලකාය සඳහා නිල ඇඳුම් අවශ්‍යතාවය - 2014**

| ගණය | අවශ්‍යතාවය (මීටර් /ඒකක) | වටිනාකම (රු. මිලියන) |
|---|---|---|
| ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුව, විශේෂ කාර්ය බලකාය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, බන්ධනගාර දෙපාර්තමේන්තුව සහ ජාතික ශිෂ්‍යභට බලකාය සඳහා නිල ඇඳුම් අවශ්‍යතාවය | මීටර් 3,335,500 | 1,196.7 |
| වෙනත් | ඒකක 1,947,500 | 687.2 |
| **එකතුව** | | **1,882.9** |

*මූලාශයර් පේෂකර්මාන්ත සංවර්ධන අංශය*

**ඇඟළුම් කර්මාන්තය**

ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය වනාහී දේශීය ආර්ථිකය වෙත සැලකිය යුතු දායකත්වයක් ලබාදෙන සහ ශ්‍රී ලංකාවේ කාන්තාව වෙත සෘජු රැකියා අවස්ථා ජනිත කරවන විශාලම නිෂ්පාදන කර්මාන්තය වේ. පේෂකර්ම සංවර්ධන අංශය මගින් මෙම ක්ෂේත්‍රය තුළ මානව සම්පත් සංවර්ධනය ඵලදායිතාවය හා ගුණාත්මක භාවය ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය හා ඒකාබද්ධ ඇඟළුම් සංගම් සංසදය එක්ව ව්‍යාපෘති ත්‍රියාත්මක කරනු ලැබේ.

- **ඇඟළුම් කර්මාන්තය තුල බලශක්ති සංරක්ෂණ සහ ඵලදායිතාවය වැඩිදියුණු කිරීමේ වැඩසටහන**

සුළු හා මධ්‍ය පරිමාණ ඇඟළුම් කර්මාන්තශාලා වෙනුවෙන් පවත්වනු ලබන ඵලදායීතාවය ඉහල නැංවීමේ වැඩසටහන 2006 වර්ෂයේ සිට ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය හරහා ක්‍රියාත්මක කරනු ලබන්නකි. මෙහිදී ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය මඟින් තෝරාගන්නා ලද කර්මාන්තශාලා වල නිෂ්පාදන ඵලදායීතාවය ඉහල නැංවිම සඳහා අවශ්‍ය මඟ පෙන්විම සිදු කරවනු ලැබේ. 2014 වර්ෂයේ දී මෙම වැඩසටහන සඳහා රු.මි. 7 ක් ලබා දී ඇත. ඵලදායීතාවය ඉහල නැංවිම පිළිබඳ මෙම වැඩසටහන මඟින් 2006 වර්ෂයේ සිට මේ දක්වා කර්මාන්තශාලා 84 ක් වෙනුවෙන් පහසුකම් සපයා ඇති අතර මෙම වැඩසටහනේ මූලික අරමුණ වන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ඇඟළුම් කර්මාන්තශාලා වල නිෂ්පාදන කාර්යක්ෂමතාවය ඉහල නැංවිමයි. කර්මාන්තශාලාහී ප්‍රතිලාභ ඉහළ නංවමින් මිනිත්තුවකට වැයවන පිරිවැය අඩුකිරිම සහ ප්‍රතිලාභ ඉපැයීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ඇඟළුම් කර්මාන්තශාලා අතර තරඟකාරීත්වයක් ඇතිකිරීම මෙමඟින් සිදු කරනු ලැබේ. මේ වන විට පුහුණු වැඩසටහන 06ක් පවත්වා ඇති අතර සුළු හා මධ්‍ය පරිමාණ ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රය තුළ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම, ගුණාත්මක තත්ත්වය වර්ධනය කිරීම, පිරිවැය අඩු කිරීම, කර්මාන්තශාලා ක්‍රමවත් කිරීම, සේවකයන්ගේ ආකල්ප ගොඩනැංවීම හා බලශක්ති ඉතිරිය ද විදුලි බල පිරිවැය අඩු කිරීම වැනි අංගයන් එම පුහුණුව යටතට අයත් වේ.

- **ඇඟළුම් කර්මාන්තය තුල නිපුණතා සංවර්ධන සංවර්ධන වැඩසටහන (SME Skill Development Programme) ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය (SLITA)**

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ පේෂකර්ම සංවර්ධන අංශය ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය සමඟ එක්ව සුළු හා මධ්‍ය පරිමාණ ඇඟළුම් කර්මාන්තශාලා සඳහා වන කුසලතා සංවර්ධන වැඩසටහන 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලැබේ. 2014 වසරේදී ද එම වැඩසටහන නොකඩවා ක්‍රියාත්මක කරන අතර වැඩසටහන් 10 ක් හරහා 692 ක් වන සේවකයන් සඳහා ප්‍රතිලාභ ලබා දී ඇත.පුවත්පත් දැන්වීම පළකර මෙම වැඩසටහනට දායක වීමට කැමැත්තක් දක්වන කර්මාන්තශාලා වලින් අයදුම්පත් කැඳවා තෝරාගනු ලබන කර්මාන්තශාලා වෙනුවෙන් ඉගෙනුම් උපකරණ සකස් කරමින් හා පුහුණු වැඩසටහන් සකස් කර ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය තුල හෝ කර්මාන්තශාලා පරිශ්‍රය තුල දී නිෂ්පාදනය, කාර්මික ඉංජිනේරු සේවා ගුණාත්මක බව, නිෂ්පාදන සංවර්ධනය, පුහුණුව හා පුහුණුව ඇගයීම යන මූලික අංශ හරහා මෙම පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

- **ඇඟළුම් කර්මාන්තයේ දේශීය හා අන්තර්ජාතික ප්‍රතිරූපය වර්ධනය කිරීමේ වැඩසටහන**

ඒකාබද්ධ ඇඟළුම් සංගම් සංසදය යනු ශ්‍රී ලංකාව තුළ සමස්ථ පේෂකර්ම හා ඇඟළුම් කර්මාන්තය නියෝජනය කරමින් පේෂකර්ම හා ඇඟළුම් නිෂ්පාදකයන්, අපනයනකරුවන්, රෙදිපිළි හා උපකරණ නිෂ්පාදකයන්, සැපයුම්කරුවන්, එමෙන්ම මිලදී ගැනීමේ ඒකක ඇතුළත් සංවිධානයකි. ක්ෂේත්‍රය තුල තවත් සංගම් 07 ක් ද ඊට ඇතුළත් අතර 450

ක් ඉක්මවා ගිය පේෂකර්ම හා ඇඟළුම් නිෂ්පාදකයන් මිලදී ගැනීමේ කාර්යාල උපකරණ නිෂ්පාදකයන් මෙන්ම 500,000 කට ආසන්න සේවක ප්‍රජාව ද එයට ඇතුලත්ය. කර්මාන්තයේ දේශීය ප්‍රතිරූපය ගොඩනැංවීමට අවශ්‍ය ක්‍රමවේද සංවර්ධනය කිරීම සඳහා මැදිහත් වන ඒකාබද්ධ ඇඟළුම් සංගම් සංසදය මගින් ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව රජය හා අදාළ විදේශ රාජ්‍යයන් සමගද සමීපව කටයුතු කරනු ලැබේ.ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රය තුල ධනාත්මක ප්‍රතිරූපයක් ගොඩනැංවීම උදෙසා ජාත්‍යන්තර වෙළඳ සංවර්ධන හා ප්‍රතිරූපය ගොඩනැංවීමේ වැඩසටහන ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකාවේ ඇඟළුම් ගැනුම්කරුවන් අතර ප්‍රධාන පෙළේ සැපයුම්කරුවෙකු බවට පත් කිරීමට අවශ්‍ය ජාලගත සබඳතා වෙබ් අඩවි හරහා සිදු කරන අතර වෙළඳපල ප්‍රවර්ධන කටයුතු සහ වෙළඳ සමුළු මෙන්ම ඍජු වෙළඳපල ප්‍රවර්ධන කටයුතු ද ක්‍රියාත්මක කරනු ලැබේ. මීට අමතරව පොදු ජනතාව අතර හොඳ ප්‍රතිරූපයක් ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව ඇති කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට ද තම දායකත්වය ලබා දෙනු ලැබේ.

- **ඇඟළුම් කර්මාන්ත ආශ්‍රිත කර්මාන්ත ඒකක පිහිටුවීමේ වැඩසටහන**

ඇඟළුම් කර්මාන්තය යනු 40% ක් පමණ වන අපනයන ආදායමකට හිමිකම් කියන රැකියා උත්පාදිත ක්ෂේත්‍රයකි. මේ වන විට පුහුණු ශ්‍රමිකයින්ගේ හිඟ බව ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රයට අභියෝගයක්ව පවතී. තිරසාර ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රයක් උදෙසා සේවක ප්‍රජාව බහුල ප්‍රදේශයන්හී ඇඟළුම් කර්මාන්තශාලා ප්‍රතිස්ථාපනය කිරීම මෙන්ම දේශීය ගැණුම්කරණය සඳහා නිමි ඇඟළුම් ලබා දීම අරමුණු කරමින් බොහෝ මහා පරිමාණ ඇඟළුම් කර්මාන්ත ශාලා මේ වන විට උතුරු පළාත තුළ දිස්ත්‍රික්කයන්හී ව්‍යාප්තව තිබෙනු දක්නට ඇත. ඇඟළුම් කර්මාන්තය පදනම් කර ගත් කර්මාන්ත ඒකක පිහිටුවිම මගින් පවුල් 3400 කට වැඩි පිරිසකට ජීවන වෘත්තියක් සපයා දීම මෙන්ම ඇඟළුම් කර්මාන්ත ක්ෂේත්‍රයට සුදුසු සේවක පිරිසක් හඳුන්වා දීම ද අපේක්ෂාව වේ.

- **ඇඟළුම් අපනයන සේවා**

මෙරට ඇඟළුම් සහ ආශ්‍රිත නිෂ්පාදනයන් අපනයනය කිරිම සඳහා ඇඟළුම් නිෂ්පාදක සහ නිෂ්පාදක නොවන අපනයනකරුවන්ට අවශ්‍ය රෙගුලාසිමය හා නියාමන සහාය ලබාදීම සහ පහසුකම් හා සේවා සැපයිම හා දිරිගැන්විම කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ඇඟළුම් අපනයන සේවා අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

**2014 12 31 දිනට ඇඟළුම් අපනයන සේවා අංශය මගින් අනුමත කරන ලද අපනයනවල ප්‍රගතිය**

| අංශය | | ඇඟළුම් ප්‍රමාණය | වටිනාකම (ඇ.ඩො.) |
|---|---|---|---|
| ලියපදිංචි ඇඟළුම් නිෂ්පාදකයන් | ඒකක<br>මීටර් | 76,308,735<br>26,296 | 34,606,798.83 |
| නිෂ්පාදකයන් නොවන අපනයනකරුවන් | ඒකක<br>මීටර් | 1,360,646<br>4,105,485 | 4,589,277.76 |
| **එකතුව** | ඒකක<br>මීටර් | **77,669,381**<br>**4,131,781** | **39,196,076.59** |

*මූලාශ්‍රය: පේෂකර්මාන්ත සංවර්ධන අංශය*

# පේෂකර්ම දෙපාර්තමේන්තුව

### හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සම්බන්ධ විෂය පළාත් සභා යටතට පැවරී ඇති විෂයකි. ඒ අනුව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත්තේ එම විෂයට අදාළ ප්‍රතිපත්තිමය තීරණ හා මධ්‍යගත කටයුතු හා පළාත් සභා පේෂකර්මාන්ත අංශ සමග සම්බන්ධීකරණය තුලින් කර්මාන්තයේ දියුණුවට අදාළ සේවාවන් සැපයීමයි.

### ක්‍රියාකාරකම්

- අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සංවර්ධනය සඳහා අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම.
- නිෂ්පාදනය සංවර්ධනය අරමුණු කරගත් වැඩසටහන් සම්පාදනය කිරීම.
- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
- මෝස්තර සම්පාදන වැඩසටහන්
- පුහුණුකරවන්නන් පුහුණු කිරීමේ වැඩසටහන්
- පේෂකර්මාන්ත විෂය ආශ්‍රිත පුහුණු කිරීමේ වැඩසටහන්
- පේෂපාසැල් සිසු සිසුවියන්ගේ පෞර්ෂත්ව වර්ධනය කිරීමේ නායකත්ව පුහුණු වැඩමුළු තුළින් අනාගතයේ සාර්ථක ව්‍යවසායකයින් බිහි කිරීම.
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට අවශ්‍ය උපදේශකයින් හා කාර්යමණ්ඩල පුහුණු කිරීම.
- ක්ෂේත්‍රයට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම.
- අලෙවි ප්‍රවර්ධනය (දේශීය හා විදේශීය අලෙවි කටයුතු සංවිධානය කිරීම)
- අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ව්‍යාප්ත කිරීම අරමුණු කරගත් සුදුසු ව්‍යාපෘති, ස්වයංරැකියා හා උපකාරක සේවා සැපයීම, වැඩසටහන් සංවිධානය කිරීම
- අත්යන්ත්‍ර පේෂකර්මාන්තය ව්‍යාප්ත කිරීම අරමුණු කරගත් සුදුසු ව්‍යාපෘති, ස්වයංරැකියා හා උපකාරක සේවා සැපයීම, වැඩසටහන් සංවිධානය කිරීම
- අත්යන්ත්‍ර පේෂකර්මාන්තයේ මෝස්තර සංවර්ධන හා ගුණාත්මක වර්ධනය අරමුණු කරගත් ප්‍රදර්ශන හා තරග පැවැත්වීම
- ජාතික අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීම
- අත්යන්ත්‍ර පේෂකර්මාන්තය වර්ධනය සඳහා අවශ්‍ය පර්යේෂණ අත්හදා බැලීම් හා සංරක්ෂණ කටයුතු
- නව තාක්ෂණය හඳුන්වාදීම හා අදාළ සංවර්ධන කටයුතු

උක්ත අරමුණු ඉටු කිරීම සඳහා පහත සඳහන් ආයතන මෙම දෙපාර්තමේන්තුව යටතේ දැනට ක්‍රියාත්මක වේ.

- පර්යේෂණ, පුහුණු,

මෝස්තර හා සේවා ආයතනය කටුබැද්ද- 01

- පේෂකර්මාන්ත කෞතුකාගාරය හා මෝස්තර බැංකුව, කටුබැද්ද - 01
- පේෂකර්මාන්ත පුහුණු පාසැල්- 12
- මෝස්තර පුහුණු පාසැල් - 01
- ස්වභාවික වර්ණ ව්‍යාපෘතිය - 01

### 2014.12.31 දිනට ප්‍රගතිය

- සිංහල මාධ්‍ය පේෂ කර්මාන්ත උපදේශකයින් 05 බඳවා ගන්නා ලදී.
- කොට්ටල පේෂ පැසැලේ සහ නුවරඑළිය සංචාරක නිවාසයේ අළුත්වැඩියා කටයුතු නිම කර ඇත.

- රු.මි. 119.8 ක වියදමක් දරමින් 1980/1982 කාලය තුල පුද්ගලීකරණය කරන ලද බලවේග පේෂකර්ම ව්‍යාපෘති වල සේවය කල වසර 10 ඉක්ම වූ සේවකයන් 2,785 දෙනෙකුට වන්දි ප්‍රදානය කරන ලදී.
- පේෂ පුහුණු පාසැල සඳහා ශිෂ්‍යයන් 138 ක් බඳවා ගත් අතර මෝස්තර පුහුණු පාසැල සඳහා 16 දෙනෙකු බඳවා ගන්නා ලදී.
- පේෂ කර්මාන්ත සංසණනයක් පවත්වා වයඹ පලාතේ දිස්ත්‍රික්ක 03 ක් තුල වියන්නන් සඳහා පුහුණු පාඨමාලා පවත්වන ලදී.
- සේවකයන් 710 දෙනෙකු පුහුණු කර අතර ශිෂ්‍යයන් සඳහා වැඩසටහන් 03 ක් ද බලවේග පේෂකර්ම ව්‍යාපාර වල සේවකයක් සඳහා පුහුණු වැඩසටහනන් ද පවත්වන ලදී.
- පාලමුනෙයි වර්ණාගාරයේ හා අලෙවි සැලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.

# ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

**හැඳින්වීම**

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය (SLITA) වර්ෂ 2009 අංක 12 දරණ පනත යටතේ ස්ථාපිත කරන ලද අතර එහි ක්‍රියාකාරී මෙහෙයුම් 2009 ජූනි මස 15 වන දින සිට ආරම්භ කර ඇත. ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය ශ්‍රී ලංකාවේ පේෂකර්ම, ඇඟලුම් සහ පාවහන් කර්මාන්තයට අවශ්‍ය මානව සම්පත් පුහුණු කිරීමේ ආයතන අතර ප්‍රමුඛ ආයතනයක් ලෙස කටයුතු කරනු ලබයි. පුහුණුවට අමතරව ආයතනය මගින් උපදේශනය, තාක්ෂණික සේවා සහ පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයට අවශ්‍ය පරීක්ෂණාගාර සේවා සපයනු ලබයි. ආයතනය මගින් දිගුකාලීන ඩිප්ලෝමා, කෙටිකාලීන සහ කර්මාන්තශාලාවල අවශ්‍යතාවයන්ට අනුව පාඨමාලා මගින් පේෂකර්ම සහ ඇඟලුම් තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ පුහුණුව ලබාදේ. පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථානය :ඔඹීක* සහ ඇඟලුම් කර්මාන්ත අභ්‍යාස ආයතනය (CITI) යන ආයතන ඒකාබද්ධ කිරීමේ උපාය මාර්ගික තීරණය මගින් මිනිස් සම්පත්, යන්ත්‍රෝපකරණ, ආයතනික ගොඩනැගිලි කාර්යක්ෂමව ඵලදායි ලෙස භාවිතා කිරීම සිදුකර ඇත. තවද ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය එහි ආයතනික ව්‍යුහය ප්‍රතිසංවිධානය කර ඇති අතර ආයතනය තුල අංශ හයක් ව්‍යුහගත කර ඇත. එමගින් පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයේ ඇතිවන නව ව්‍යාපාරික අභියෝගයන්ට මුහුණදීමට පියවර ගෙන ඇත. ආයතනයේ කළමනාකාරීත්ව ව්‍යුහය තුලින් එක් එක් අංශවල කාර්යභාරය පැහැදිලි ලෙස නිර්වචනය කර තිබීම මගින් ආයතනික ආදායම වැඩි කරගනු ලබයි.

**අරමුණු**

නව පනතේ සඳහන් ආකාරයට පහත අරමුණු කේන්ද්‍ර කර ශ්‍රී ලාංකේය පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රය දියුණු කිරීමේ වඩා වැඩි වගකීමක් ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය මත පැවරී ඇත.

- පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සඳහා විශේෂඥ සේවය සැපයීම.
- නවීන තාක්ෂණයට ගැලපෙන පරිදි පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රයේ තාක්ෂණික දැනුම පුළුල් කිරීම.
- දේශීය හා විදේශීය ඇඟලුම් නිෂ්පාදකයින්ට උපදේශනය සහ තාක්ෂණික සේවා ලබාදීමේ මූලිකයා ලෙස ක්‍රියා කිරීම.
- ගෘහාශ්‍රිත අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය සඳහා තාක්ෂණික දැනුම ලබාදීම.
- පේෂකර්ම, ඇඟලුම්, අත්යන්ත්‍ර, පාවහන් කර්මාන්තවල යෙදෙන ග්‍රාමීය සුළු පරිමාණ ව්‍යවසායකයින් සඳහා විවිධ ආකාරයෙන් තාක්ෂණික දැනුම ලබාදීම.
- වෘත්තීමය පුහුණු පාඨමාලා පවත්වන්නන් අතර ප්‍රමුඛයා ලෙස ක්‍රියා කරමින් ජාතික වෘත්තීමය ප්‍රමිතීන්ට අනුකූල වූ ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා දක්වා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ සේවාවන් පුළුල් කිරීම.
- ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ සේවාවන් සේවාදායකයින්ට පහසුවෙන් ලබාගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය ශක්තිමත් කිරීම.

- පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් පිහිටුවීම.

ඉහත සඳහන් අරමුණු මත පිහිටා ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය, පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රයට සේවා සැපයීමේ ප්‍රමුඛයා ලෙස අඛණ්ඩව සහ කාර්යක්ෂමව සේවා සැපයීමට බලාපොරොත්තු වන අතර ඉදිරි කාලයේදී වැඩදායි ලෙස කටයුතු කිරීම තුලින් ආයතනයේ ස්වයං මූල්‍ය තත්වය ස්ථාවර කිරීමට කටයුතු කිරීම.

### 2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය


### මූල්‍ය සහ භෞතික ප්‍රගතිය

| අංශය | 2014 සත්‍ය | 2014 ඉලක්කගත |
|---|---|---|
| මූල්‍යමය ප්‍රගතිය -අදායම්(රු.මි) | | |
| පරික්ෂාකිරීම් | 83.58 | 76 |
| පුහුණු | 56.27 | 57.13 |
| උපදේශනය | 1.14 | 6.9 |
| අනෙකුත් | 28.49 | 15.62 |
| රාජ්‍ය ප්‍රතිපාදන | - | 5 |
| විලම්බිත ආදායම් | 19.6 | 19.95 |
| මුළු ආදායම් | 189.1 | 180.6 |
| මුළු වියදම් | 142.9 | 133.06 |
| අතිරික්ත | 46.22 | 47.54 |


| අංශය | 2014 සත්‍ය | 2014 ඇස්තමේන්තුගත |
|---|---|---|
| භෞතික ප්‍රගතිය (ඒකක) | | |
| පරික්ෂා කිරීම් | 65031 | 30000 |
| පුහුණුවීම් | 2520 | 1173 |
| පුහුණු පාඨමාලා | 120 | 101 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය*


### මූල්‍ය ප්‍රගතිය




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය*




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය*




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය*

**පේෂකර්ම, ඇඟලුම් තාක්ෂණය සහ කළමනාකරණ පුහුණුව**

2014 වර්ෂයේ මුල් මාස 8 1/2 ක කාලය තුල පුහුණු කිරීමේ ක්‍රියාකාරකම්වල සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කර ඇති අතර ඒ සඳහා පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයේ සතුටුදායක අපනයන සංවර්ධන තත්ත්වයද බලපා ඇත. ආයතනය විසින් ව්‍යුහගත පාඨමාලා 100 ක් 2014 වර්ෂයේ පැවැත්වීම

සඳහා සැලසුම් කොට ඇත. මීට අමතරව ආයතනය විසින් නව ඩිප්ලෝමා පාඨමාලාවන් වන කර්මාන්තශාලා ඉංජිනේරු පිළිබඳ ඩිප්ලෝමාව සහ විලාසිතා නිර්මාණය කිරීම සඳහා ඇඟලුම් නිශ්පාදිත සංවර්ධනය පිළිබඳ වූ ඩිප්ලෝමා පාඨමාලා හඳුන්වා දී ඇත. පූර්ණකාලීන ඩිප්ලෝමා පාඨමාලාව ප්‍රධානතම ව්‍යුහගත පාඨමාලාව ලෙස පවත්වා ගෙන යන අතර, එමගින් පේෂකර්ම සහ ඇඟලුම් ක්ෂේත්‍රයට අවශ්‍ය කරනු ලබන මධ්‍යම මට්ටමේ තාක්ෂණික කළමනාකරුවන් බිහි කිරීම සඳහා පාඨමාලාව නිර්මාණය කර ඇත. තවදුරටත් මෙම පාඨමාලා හදාරන්නන් සඳහා උපාධි මට්ටම දක්වා හැදෑරිය හැකි අවස්ථා උදාකර ගැනීමට එංගලන්තයේ බෝල්ටන් විශ්ව විද්‍යාලය සමඟ කටයුතු කරමින් සිටී. මෙම කාලය තුල ආයතනය විසින් පවත්වනු ලබන දීර්ඝකාලීන ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ පිළිගැනීමට ලක් වී ඇති අතර ඩිප්ලෝමා පාඨමාලාවන් හැදෑරූ ශිෂ්‍යයන් සඳහා පේෂකර්ම සහ ඇඟලුම් තාක්ෂණය පිළිබඳ උපාධි මට්ටමේ පාඨමාලාවන් හැදෑරීමේ අවස්ථාව උදාකර ඇත.

ඩිප්ලෝමා පාඨමාලාවන්ට බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමත් සමඟ ඔවුන්ගේ රැකියා නියුක්තිය සඳහා වූ යොමුකිරීමේ විවෘත දිනයක් ආයතනය මඟින් සංවිධානය කර ඒ සඳහා පිළිගත් කර්මාන්ත ආයතන කැඳවන ලදී. මෙම කාල පරිච්ඡේදය තුල දීර්ඝකාලීන, කෙටිකාලීන සහ කර්මාන්තශාලා අවශ්‍යතා මත සැලසුම් කරන ලද පාඨමාලා 82 ක් පවත්වා ඇති අතර, එමඟින් 1840 ක් පුහුණුව ලබාගෙන ඇත. මේ සඳහා ශිෂ්‍යයන් සහ කර්මාන්තවල නියැලෙන්නන් සහභාගී වී ඇත. මෙම වර්ෂයේ පූර්ණකාලීන ඩිප්ලෝමාව 2014 මාර්තු මස ආරම්භ කල අතර, ඒ සඳහා පූර්ණකාලීන ශිෂ්‍යන් 60 දෙනෙකු බඳවා ගෙන ඇති අතර, ඔවුන් අධ්‍යයන කටයුතුවල නිරතව සිටී. දීර්ඝකාලීන පාඨමාලා වැඩිවීමත් සමඟ තාක්ෂණික කාර්ය මණ්ඩල සංවර්ධනය ද දේශීය හා විදේශීය වශයෙන් සිදු කර ඇත. මෙම කාලය තුල පුහුණුවෙන් ලද ආදායම රු.මි. 44.23 ක් වූ අතර, එම ආදායම සැලකිය යුතු මට්ටමකින් වර්ධනය වී පසුගිය වර්ෂයට වඩා වැඩි බව පෙන්නුම් කෙරේ.

**ඇඟලුම් ආශ්‍රිත ගෘහ කර්මාන්තය සඳහා පුහුණුව**

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ උතුරු පළාතේ ඇඟලුම් ආශ්‍රිත ගෘහ කර්මාන්ත පුහුණුව සඳහා වැඩසටහනක් 2014 අගෝස්තු මස ආරම්භ කරන ලදී. ඒ අනුව මන්නාරම, වවුනියාව, මුලතිව් යන දිස්ත්‍රික්කවල මැහුම් මධ්‍යස්ථාන 97 ක් පිහිටුවීම සඳහා සැලසුම් කොට ඇත. මෙම මධ්‍යස්ථාන භාරව කටයුතු කරන පුහුණු කරන්නන් සඳහා අවශ්‍ය පුහුණුව ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය මඟින් ලබා දී ඇත. මේ අනුව පුහුණුවන්නන් 74 දෙනෙකුට දැනටමත් පුහුණුව ලබාදී ඇති අතර එම පුහුණුව මන්නාරමේ පිහිටුවා ඇති SLITA ශාඛාවේ දී ලබාදුන් අතර රත්මලානේ ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනයේ දී 28 දෙනෙක් සඳහා ද පුහුණුවීමේ පහසුකම් සලසා දෙන ලදී.

**පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තය සඳහා වූ භෞතික හා රසායනික පරීක්ෂණාගාර සේවා**

ISO 17025 තත්ත්ව අනුකූලතා සහතිකයෙන් පිදුම් ලත් පර්යේෂණාගාරය ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් ප්‍රතීතනය කර ඇත. මේ අනුව වාර්ෂික අනුකූලතා තක්සේරුව ද එම ආයතනය මගින් ලබාගෙන ඇත. ලිමිටඩ් බ්‍රෑන්ඩ් අනුකූලතා සහතිකයද මෙම පර්යේෂණාගාරය වෙත ඉන්ටර්ටෙක් ඉන්දියා ආයතනය මඟින් ලබාදී ඇති අතර එමගින් තත්ත්ව සහතික අපනයන ඇඟලුම් සඳහා ලබාදීමේ වැඩපිළිවෙල ද සිදුකෙරේ.

ආයතනයේ පර්යේෂණාගාරය පිළිගත හැකි තත්ත්ව මට්ටමේ පර්යේෂණාගාර සේවා, රජයේ සහ පෞද්ගලික අංශවලට ලබාදීම සිදු කරනු ලබයි. පර්යේෂණාගාර සේවා මගින් වර්ෂයේ මුල් මාස 8 1/2 කාලය තුල ඉපැයූ ආදායම පුහුණුකිරීම් මගින් ලද ආදායමට වඩා වැඩි වී ඇත. එහෙත් පර්යේෂණාගාරය මෙම කාලය තුල භෞතික සහ රසායනික පරීක්‍ෂණ 39,212 ක් පරීක්‍ෂාවට ලක්කර ඇති අතර, එමගින් රු.මි. 45.92 ක් උපයා ගෙන ඇත. මෙම පර්යේෂණාගාරය සම් සහ පාවහන් කර්මාන්තය සඳහා වූ පරීක්ෂණාගාර සේවා සැපයීම සඳහා පියවර ගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් එම කර්මාන්තය සඳහා අවශ්‍ය තාක්ෂණික සේවා සැපයීම ද සිදුකරනු ලබන අතර එමගින් තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය සහාය ද ලබාදේ.

**උපදේශන සේවා සැපයීම**

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘති සඳහා තාක්ෂණික සහාය ලබාදේ. මේ සම්බන්ධයෙන් පේෂකර්ම දෙපාර්තමේන්තුවේ ද සහායෝගීතාවය ලබාගෙන ඇත. මෙහි මුල් පියවරයන් ලෙස පුහුණුව සහ උපදේශන වැඩසටහන් නැගෙනහිර පළාතේ පාලමුනේ පිහිටි පේෂකර්ම හා අත්යන්ත්‍ර කර්මාන්තයට ලබා දී ඇත. මෙයට අමතරව උතුරු පළාතේ පිහිටුවා ඇති ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තශාලා 2 ක් සඳහා අවශ්‍ය උපදේශනය මේ වන විට ලබා දී ඇත.

**නිෂ්පාදන ඵලදායිතා වැඩි දියුණු කිරීමේ වැඩසටහන**

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ඇඟලුම් අපනයනය කරන්නන්ගේ මණ්ඩලය, දේශීය ඇඟලුම් නිපදවන්නන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය, මෙම නිෂ්පාදන ඵලදායිතා වර්ධනය කිරීමේ වැඩ සටහනේ පාර්ශවකරුවන් වන අතර, මෙමගින් කුඩා හා මධ්‍යම මට්ටමේ ව්‍යවසායකින්ගේ ඵලදායිතාවය වැඩි දියුණු කිරීම කරනු ලැබේ. 2014 වසරේ පෙබරවාරි සිට අගෝස්තු කාල සීමාව සඳහා කුඩා හා මධ්‍යම මට්ටමේ කර්මාන්තශාලා 6 ක් මෙම වැඩ සටහනට ඇතුලත් කරන ලද අතර, එම කර්මාන්තශාලාවලට උපදේශකවරුන් මගින් නිෂ්පාදන කාර්යක්ෂමතාවය හා තත්ත්වය වැඩි දියුණු කිරීම තුළින් දේශීය හා විදේශීය ඇඟලුම් නිපදවීමේ තරගකාරීත්වයට එළඹීම සඳහා අවශ්‍ය උපදේශනය ලබාදෙනු ලැබේ.

මෙම වැඩසටහන මගින් උපදේශකවරුන් කර්මාන්තශාලා නිෂ්පාදන අංශයන්හි ඇති නිෂ්පාදන/තාක්ෂණික ගැටළු සහ බලශක්තිය ඵලදායි ලෙස භාවිතා කිරීම සඳහා අවශ්‍ය විසඳුම් ලබාදේ. ප්‍රතිලාභී කර්මාන්තශාලාවන් මෙම වැඩ සටහන පියවර 4 කින් නිමා කරනු ලබන අතර, එහිදී කර්මාන්තකරුවන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම පුහුණු වැඩ සටහන් මගින් ලබාදෙනු ලැබේ. මෙම වැඩසටහනේ ප්‍රගතිය ඇගයීම, පාර්ශවීයකරුවන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් කරනු ලබයි. මෙම වැඩ සටහන සඳහා රු. මි. 7 ක ප්‍රතිපාදන වෙන් වී ඇති අතර මෙයින් රු. මි. 5.8 ක මුදලක් වැය වී ඇත.

පේෂ කර්මාන්තකරුවන්ගේ කර්මාන්තශාලා සඳහා වූ ඵලදායිතාවය වර්ධනය කිරීමේ වැඩසටහන සඳහා කර්මාන්තශාලා 2 ක් තෝරාගෙන උපදේශනය ලබාදීම 2014 ජූලි මස ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන ජූලි මස සිට දෙසැම්බර් දක්වා මාස හයක කාලය තුල පවත්වාගෙන යනු ලැබේ. මේ සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය රු. මි. 3 ක ප්‍රතිපාදන ලබාදී

ඇති අතර එයින් රු. මි. 1 ක මුදලක් මේ වනවිට මේ සඳහා වැය කර ඇත.

**නිපුණතා සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන**

කුඩා හා මධ්‍යම මට්ටමේ පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තශාලාවල සේවකයින්ගේ නිපුණතා වර්ධනය කිරීමේ අරමුණින් මෙම පුහුණු වැඩසටහන සැලසුම් කර ඇත. මාස 8 1/2 ක කාලය තුල පුහුණු වැඩසටහන් 10 ක් කුඩා හා මධ්‍යම කර්මාන්තශාලාවල සහ ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයෙහි පවත්වා ඇති අතර කර්මාන්තශාලා කළමනාකරුවන් ඇතුලු සේවකයින් 692 දෙනෙකු සඳහා පුහුණුව ලබාදී ඇත. මෙම වැඩසටහන යටතේ කර්මාන්තශාලාවල පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම මෙම කර්මාන්තශාලාවලට අනුකූලව සිදු කරනු ලබයි. මෙම වැඩසටහන ක්‍රියාත්මක වන කාලය තුල නිපුණතා වැඩි දියුණු කිරීම තුලින් නිෂ්පාදන ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා දායකත්වය ලබා දී ඇත. මේ සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය රු. මි. 2.5 ක ප්‍රතිපාදන 2014 වර්ෂය සඳහා වෙන්කර ඇති අතර එයින් මේ වන විට රු. මි. 1.25 ක් වැය කර ඇත.

**සම්භාණ්ඩ හා පාවහන් නිෂ්පාදන පුහුණුකිරීමේ වැඩසටහන**

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයට සම්බන්ධ සම්භාණ්ඩ සහ පාවහන් කර්මාන්තයට අදාල පුහුණුව සඳහා පුහුණු කිරීමේ පාඨමාලා ආරම්භ කර ඇත. ඒ සඳහා කර්මාන්ත වල නියැලෙන්නන් සහ ඒ පිළිබඳ උනන්දුවන්නන් සඳහා පාඨමාලා සකස් කර ඇත.

කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය මඟින් රු.මි. 15 ක නවීන යන්ත්‍ර සූත්‍ර මෙම අංශයට ලබාදී ඇත. කර්මාන්ත සහ වාණිජ කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් මහතාගේ ප්‍රධානත්වයෙන් මෙම අංශය 2014 මාර්තු මස 19 දින විවෘත කරන ලද අතර ඒ සඳහා අමාත්‍යාංශ නිලධාරීන් සහ කර්මාන්තකරුවන් සහභාගී වූහ.

මෙම අංශය පිහිටුවීමේ මූලික අරමුණ වන්නේ දැනට සම්භාණ්ඩ සහ පාවහන් කර්මාන්තයේ සංවර්ධනය සඳහා කාර්මික පිරිස්වල අවශ්‍යතාවය සපුරාගැනීම වේ. ඒ අනුව සම්භාණ්ඩ සහ පාවහන් අපනයනය කිරීමේ කර්මාන්තය වැඩි දියුණු කිරීමට ද එමඟින් බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයේ තාක්ෂණිඥයන් මේ සම්බන්ධයෙන් විදේශීය පුහුණුව ලබා ඇති අතර ඔවුන් මගින් තාක්ෂණික දැනුම ලබාදීම සිදු කෙරේ. ඊට අමතරව කර්මාන්තශාලාවල පළපුරුද්ද ලත් විශේෂඥවරුන්ගේ සේවය එම අංශය මඟින් ලබාගැනීම සිදුකෙරේ.

දැනට කර්මාන්තශාලාවල නියැලෙන්නන් සහ එම අංශය පිළිබඳ උනන්දුවන්නන් 14 දෙනෙකු පුහුණුව ලබාගෙන ඇත. 41 දෙනෙකු සඳහා කර්මාන්තශාලා ඉංජිනේරු සහ සම් සැකසීම පිළිබඳ වැඩමුළු දෙකක් පවත්වා ඇත. තවද සම්භාණ්ඩ සහ පාවහන් සඳහා පර්යේෂණ සේවා සැපයීමට අවශ්‍ය පර්යේෂණාගාර උපකරණ මෙම ආයතනය සතුව ඇත.

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය දැනටමත් පාවහන් කර්මාන්තයට අදාල යන්ත්‍රසූත්‍ර හා මෙවලම් ආදියෙන් සමන්විත වී ඇති අතර එම ක්ෂේත්‍රය ප්‍රචලිත කිරීම තුලින් පුහුණුව හා උපදේශනය සිදු කිරීමට බලාපොරොත්තු වේ.

**පර්යේෂණ හා සංවර්ධන අංශය**

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය මඟින් පර්යේෂණ හා සංවර්ධන අංශයක් 2013 ජූනි මස ස්ථාපිත කරන ලදී. මෙම අංශය පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රයේ වෘත්තීය දැනුම ලත් උපදේශකවරයෙකුගේ අධීක්ෂණය සහ මග පෙන්වීම යටතේ ආරම්භ කරන ලදී. එමඟින් පේෂකර්ම සහ ඇඟලුම් ක්ෂේත්‍රයට අදාල ප්‍රවර්ධනය, ප්‍රචාරණය, දැනුම ලබාදීම සහ සමීක්ෂණ කටයුතු සිදුකිරීම කරනු ලබයි. මෙහි ආරම්භයේ දී දිවයින පුරා දැනට පවත්වාගෙන යනු ලබන පේෂකර්ම, අත්යන්ත්‍ර සහ ඇඟලුම් ආයතන සම්බන්ධයෙන් දත්ත රැස්කිරීම සහ කාර්යාලීය ප්‍රයෝජනය සඳහා සංඛ්‍යාන ලබාගැනීම දැනටමත් ආරම්භ කර ඇත. මෙයට අමතරව මෙම අංශය මඟින් විද්‍යාත්මක පර්යේෂණ මූලික කටයුතු සැලසුම් කිරීමේ පියවර ගනිමින් සිටී.

# වාණිජ අංශය

# වාණිජ දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

ද්විපාර්ශ්වික, කලාපීය සහ බහු පාර්ශ්වික මට්ටමින් ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීමෙහි ලා කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ උපදේශක ආයතනය වශයෙන් වාණිජ දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ. මෙම වගකීමට, අනෙකුත් කරුණු අතර:

(අ) ශ්‍රී ලංකාවේ නිදහස්/ වරණීය වෙළඳ ගිවිසුම් පිළිබඳව සාකච්ඡා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම,

(ආ) අනෙකුත් රටවල් සමග ඒකාබද්ධ ආර්ථික කොමිෂන් සභාවල කටයුතු මෙහෙයවීම,

(ඇ) විදේශයන්හි විවිධ වෙළඳ ප්‍රතිපත්ති හා සම්බන්ධ සංසදවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම ඇතුලත් වේ.

වාණිජ දෙපාර්තමේන්තුව එහි වැඩසටහන් රජයේ විදේශ වෙළඳ දැක්ම අනුව අඛණ්ඩව ක්‍රියාත්මක අතර එමගින් රටේ ආර්ථික වර්ධනයට විශාල දායකත්වයක් ලබා දේ. ප්‍රවර්ධන කාර්යයන් හි දී ශ්‍රී ලංකාවේ දැනට පවත්නා වෙළඳ සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීමත් නව වෙළඳපොළවල් හඳුනා ගැනීමත්, නව නිෂ්පාදනයන් ප්‍රවර්ධනය කිරීම, ජාත්‍යන්තරතලයේ වෙළඳාම සඳහා කුඩා කර්මාන්ත අංශයෙහි කාර්යක්ෂම දායකත්වය දිරිමත් කිරීම හා දකුණු ආසියානු කලාපය තුළ ශ්‍රී ලංකාව වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීම වැනි කටයුතු සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ මූලික අවධානය යොමු වී ඇත. විදේශ වෙළඳ නියෝජනය තුළින් සෘජු විදේශීය ආයෝජනය හා සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමෙහි ලා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය හා සහයන් වාණිජ දෙපාර්තමේන්තුව මඟින් සලසා දෙනු ලැබේ.

### 2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය

අපනයන අංශයේ ප්‍රගතිය

2014 වර්ෂය ශ්‍රී ලංකා රේගුව විසින් සකස් කරන ලද යාවත්කාලීන දත්ත අනුව 2014 වර්ෂයේ මුල් මාස 06 ට අදාල කාලපරිච්ඡේදය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ අපනයන අදායම 21% කට වඩා වැඩි වර්ධනයක් සහිතව ඇ.ඩො.මිලියන 11,044.38 ක් විය. එම වටිනාකම පසුගිය වර්ෂයේ එම කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී ඇ.ඩො.මිලියන 10,009.45 විය.

එසේම, ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs) යටතේ ඇති ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA), පකිස්ථානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) හා කලාපීය වෙළඳ ගිවිසුම් (RTAs) ලෙස දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA), දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුම (SAPTA) සහ ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA) මෙන්ම යුරෝපීය සංගමය සහ ඇමරිකා එක්සත් ජනපදය ද ඇතුලත් වූ පොදු වෙළඳ වරණීය ක්‍රමය (GSP) සහ ගෝලීය වෙළඳ වරණීය ක්‍රමය (GSTP) යනසියලුම ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාව මෙම වර්ෂයේ මුල් භාගය සඳහා කරන ලද අපනයන් හි මුළු වටිනාකම පහත වගු අංක 01 හි දැක්වේ.

**වෙළඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාව කරන ලද අපනයන් හි වටිනාකම්** (ඇ.එ.ජ ඩොලර් මිලියන)

| Agreement | 2014 |
|---|---|
| ISFTA | 375.80 |
| PSFTA | 51.78 |
| *SAFTA | 1.73 |
| *SAPTA | 1.18 |
| APTA | 114.50 |
| GSP | 3,578.55 |
| *GSTP | 13.11 |
| **Total** | **6,150.65** |

*මූලාශ්‍රය :ශ්‍රී ලංකා රේගුව*

- **චීනය හා ශ්‍රී ලංකාව අතර යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම**

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යංශය සහ මුදල් හා ක්‍රම සම්පාදන යන අමාත්‍යංශයන්හි මග පෙන්වීම යටතේ මෙම යෝජිත ගිවිසුම සම්බන්ධව ඒකාබද්ධ ශක්‍යතා අධ්‍යන වාර්තාව, කෙටුම්පත් කරන ලද ගිවිසුම මෙන්ම ඉල්ලුම් සහ පිරිනැමීම් භාණ්ඩ ලැයිස්තු සකස් කිරීම වාණිජ දෙපාර්තමේන්තුව විසින් මෙම කාල පරිච්ඡේදය තුළදී සිදුකරන ලදී.

- **අන්තර් රාජ්‍ය ප්‍රතිපත්ති කතිකාවත**

ජපානය හා ශ්‍රී ලංකාව අතර සිදුකරන ලද ආර්ථික ප්‍රතිපත්ති කතිකාවත අනුව රාජ්‍යයන් දෙක අතර අවබෝධතා ගිවිසුමක් ජපන් අගමැතිවරයාගේ පසුගිය සැප්තැම්බර් මස ශ්‍රී ලංකාවේ සිදු කරනු ලැබූ සංචාරයේ දී අත්සන් තැබීම සිදු විය.

- **ඒකාබද්ධ කොමිසන්**

- ඉරානය හා ශ්‍රී ලංකාව අතර දසවැනි ඒකාබද්ධ කොමිසන් රැස්වීම ජනවාරි මස ටෙහෙරාන් නුවරදීත්;
- ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර වෙළඳාම,ආයෝජනය සහ ආර්ථික කරුණු ගැන ද්විපාර්ශ්වික රැස්වීම ජනවාරි මාසයේ නවදිල්ලි නුවරදීත්;
- බංගලාදේශය හා ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ කොමිසමේ රැස්වීම පෙබරවාරි මස ඩකා නුවරදීත්;
- බෙලරුසය හා ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ ආර්ථික කොමිසමේ පළමු වටයේ රැස්වීම ජුලි මස කොළඹදීත්;
- කටාර් හා ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ ආර්ථික කොමිසමේ 01 වැනි රැස්වීම සැප්තැම්බර් මස දෝහා කටාර් නගරයේදීත්;
- වෙළෙඳාම, ආයෝජන හා රේගු සහයෝගිතා පිළිබඳ ඒකාබද්ධ වැඩකිරීමේ කාණ්ඩයේ පළමු සැසිවාරය 2014 ඔක්තෝම්බර් 20 සහ 21 යන දෙදින තුළ පකිස්තානයේ ඉස්ලාමාබාද් නුවරදීත්;
- වෙළෙඳාම, ආයෝජන හා රේගු සහයෝගිතා පිළිබඳ ඒකාබද්ධ වැඩකිරීමේ කාණ්ඩයේ දෙවන සැසිවාරය 2014 සැප්තැම්බර් මස බංගලාදේශය හා ශ්‍රී ලංකාව අතරත්, 20 සහ 21 යන දෙදින තුළ පකිස්තානයේ ඉස්ලාමාබාද් නුවරදීත්;
- එහි තුන්වන සැසිවාරය කෙන්යාව සහ ශ්‍රී ලංකාව අතරත් 2014 නොවැම්බර් මාසයේදීත්;

පැවැත්වීමට වාණිජ දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

- **බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල (BMISTEC), බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාවය පිළිබඳ ගන්නා ලද මූලික පියවරයන්**

බිම්ස්ටෙක් තුන්වන වටයේ සමුළුව, බිම්ස්ටෙක් 14 වැනි අමාත්‍ය රැස්වීම සහ එහි 16 වැනි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රැස්වීම යනාදිය තායිලන්තයේ නායි පී තාවු නුවර මෙම වර්ෂයේ මාර්තු මස පැවැත්වුණි. මෙම ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව තීරු බදු සහන නොමැති භාණ්ඩ ලැයිස්තුව (Negative List) සකස් කිරීම අවසන් කර ඇත.

- **බහු පාර්ශවීය වෙළඳ සබඳතා**

- ලෝක වෙළඳ සංවිධානයේ (WTO), වෙළඳාම පහසුකරණය පිළිබඳ ගිවිසුමෙහි අවශ්‍යතාවය හා පුමුඛතා ස්වයං ලෙස ඇගයීම සම්බන්ධව සම්මන්ත්‍රණයක් මාර්තු මාසයේ දී කොළඹ දී පැවැත්විණි.
- තවද ලෝක වෙළඳ සංවිධානයේ නව වැනි අමාත්‍ය මණ්ඩලයේ ඇති වූ එකඟතාවයන් ඇතුළත් බාලි පැකේජය ක්‍රියාත්මක කිරීමද සිදු කර ඇත.
- එසේම ලෝක බුද්ධිමය දේපල සංවිධානය (WIPO), ලෝක වෙළඳ සංවිධානය හා ලෝක

වෙළඳ සංවිධාන නීතිය පිළිබඳ උපදේශාත්මක ආයතනය (ACWL) යන ආයතනයන් හි උපදේශකත්වය මත ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පිළිබඳ කාර්යාලයට (NIPO) දියුණු වෙමින් පවත්නා රටවල්වලට අදාළ පිටපත් අයිතිය (Copy Right) සම්බන්ධව නම්‍යතාවයන් හඳුන්වා දෙන ලදී.

**වාණිජ දෙපාර්තමේන්තුවේ විදේශගත නිලධාරීන් විසින් ඉටුකරන ලද ප්‍රධාන ප්‍රවර්ධන වැඩසටහන්**

- සෞදි අරාබියේ මෙම වර්ෂයේ දී පැවැත්වීමට සැලසුම් කොට ඇති ප්‍රවර්ධන වැඩසටහන් සම්බන්ධව කර්මාන්ත හා වාණිජ කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් කරන ලද පෙර සූදානම් සංචාරය වෙනුවෙන් මූලික කටයුතු කරන ලදී.
- චීනය හා ශ්‍රී ලංකාවේ රේගු ආයතන අතර අන්‍යෝන්‍ය අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම වෙනුවෙන් මූලික සාකච්ඡා ආරම්භ කිරීම සඳහා කටයුතු කරන ලදී.
- ශ්‍රී ලංකාවේ සිට චීනයට කෙසෙල් අපනයනය කිරීමේ දී අත්‍යාවශ්‍ය වන නිරෝධන නිශ්කාශන (Quarantine Clearance) අවසර ලබා ගැනීමේ මූලික කටයුතු සිදු කිරීම.
- කුරුඳු හා සම්බන්ධ (Pure Cinnamon) ලාංජනය මෙක්සිකෝවේ ලියාපදිංචි කිරීම සඳහා මූලික කටයුතු සිදුකිරීම.
- ගුවන් සේවා සම්බන්ධව දකුණු අප්‍රිකාව හා ශ්‍රී ලංකාව අතර ගිවිසුමක් අත්සන් කිරීමට අවශ්‍ය මූලික කටයුතු යෙදීම.
- ගරු නියෝජ්‍ය කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් දකුණු අප්‍රිකාවේ ජොහැන්සන්බර්ග් නගරයේ දී ඇෆරෝ ලංකා ව්‍යාපාරික සමුළුව නමින් ව්‍යාපාරිකයන්ගේ හමුවක් ජුනි මස පැවැත්විණි. මේ සඳහා දකුණු අප්‍රිකාව මෙන්ම සැම්බියාව, ස්වාසිලන්තය හා නැම්බියාව යන රටවල් ද නියෝජනය කරමින් සමාගම් ආයතන 140 කට අධික ප්‍රමාණයක් සහභාගී වී ඇත.
- ප්‍රංශයේ සිට ශ්‍රී ලංකාවට පැමිණි සාමාජිකයින් 14 දෙනෙකුගෙන් සමන්විත වෙළඳාම හා ආයෝජන කටයුතු හා සම්බන්ධ ව්‍යාපාරිකයන් කණ්ඩායමකට වාණිජ දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සපයන ලදී.
- ශ්‍රී ලංකාවේ යුරෝපීය වාණිජ මණ්ඩලයේ සම්බන්ධීකරණය මත යුරෝපා
- ශ්‍රී ලංකා ව්‍යාපාරික කවුන්සිලය සහ SLASSCOM-IT BPO සංගමය යන ආයතන සමඟ ඒකාබද්ධව බෙල්ජියම වෙත තොරතුරු තාක්ෂණය සම්බන්ධව ව්‍යාපාරික දූත මණ්ඩලයක් මැයි මාසයේ දී යැවීමට කටයුතු කරන ලදී.
- ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන්ගේ පුළුල් සහභාගිත්වයක් සහිත, ප්‍රදර්ශනය කුටි 135 කින් සමන්විත ඉතා විශාල ශ්‍රී ලාංකික ප්‍රදර්ශන කුටියක් CHINA South Asia Expo හි ජුනි මස 06 සිට 10 දක්වා පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරන ලදී.
- ප්‍රදර්ශනකරුවන් 11 දෙනෙකුගේ සහභාගිත්වය සහිතව බටහිර ජපානයේ පැවැත්වුණු ආනයන වෙළඳ සල්පිල් වලට ශ්‍රී ලංකාවේ ආයතන සහභාගී කරවීමට කටයුතු කරන ලදී.
- එක්සත් රාජධානියේ පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය හා ලන්ඩන් කොටස් හුවමාරුව එක්ව Sri Lanka Capital Market නමින් ප්‍රවර්ධන වැඩසටහනක් මැයි මස සිදු කරන ලදී.
- කහටගහ ග්‍රැෆයිට් හා මන්තායි සෝල්ට් යන සමාගම් වෙනුවෙන් ඔවුන්ගේ අපනයන භාණ්ඩ විදේශ විදේශ වෙළඳ පොළ තුළ ප්‍රවර්ධනය සහ ආයෝජන කොටස්කරුවන් සොයා ගැනීම වෙනුවෙන් සහයන් දක්වන ලදී.

**වාණිජ දෙපාර්තමේන්තුවේ වෙළඳ ප්‍රවර්ධන නිලධාරීන් විසින් 2014 සඳහා ඉටු කරන ලද කාර්යයන්**

| Activities | | Quantity |
|---|---|---|
| Staged Sri Lanka specific (single-country) promotional campaigns in host countries | | 33 |
| Trade delegations to Sri Lanka | Number of delegations | 35 |
| | Number of delegates | 387 |
| Trade delegations to the host country | Number of delegations | 78 |
| | Number of delegates | 805 |
| Individual visits to Sri Lanka | | 237 |
| Individual visits to the host country | | 280 |
| Exhibitions promoted in the host country | Number of fairs | 61 |
| | Number of exhibitors / visitors | 737 |
| Promotional fair participation from the host in Sri Lanka | Number of fairs | 22 |
| | Number of exhibitors / visitors | 169 |
| Number of inquiries served (trade/ investment/tourism) | | 2,132 |
| Number of trade complaints attended | | 47 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව / වාණිජ දෙපාර්තමේන්තුව*

**වෙළඳ ගිවිසුම් යටතේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ප්‍රභවස්ථාන සහතික**

| Scheme/ Agreement | No. of COOs |
|---|---|
| EU GSP | 83,898 |
| GSP- Other | 12,706 |
| GSP-CIS | 842 |
| ISFTA | 10,852 |
| PSFTA | 7,069 |
| APTA | 4,131 |
| SAFTA | 388 |
| SAPTA | 309 |
| GSTP | 107 |
| **Total** | **120,302** |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව / වාණිජ දෙපාර්තමේන්තුව*

- ශ්‍රී ලංකා රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද Hub Operation මෙහෙයුම් යටතේ GSP සහතික පත්‍ර නිකුත් කිරීම ආරම්භ කරන ලදී.
- ශ්‍රී ලංකා රේගුව විසින් චීනය වෙත සිදු කෙරෙන ප්‍රතිඅපනයන් වෙනුවෙන් ආදාළ නැව්ගත කිරීම වෙනස් වීමකට භාජනය නොවු බවට දෙන සහතිකය (Non Manipulation Certification) සම්බන්ධයෙන් සාකච්ඡාවන් සඳහා ශ්‍රී ලංකා රේගුව හා ශ්‍රී ලංකා තානාපති කාර්යාලය එක්ව නිලධාරීන් හුවමාරු කර ගැනීම සිදු කරන ලදී. වර්තමානයේ දී එහි ක්‍රමවේදයන් සාකච්ඡා මට්ටමේ පවතී.
- සාර්ක් සංවිධානය (SAARC) හා ආසියාන් (ASEAN) සංවිධානය අතර යුරෝපා GSP ක්‍රමය මගින් කලාපීය සමුච්චයන් ලෙස ශ්‍රී ලංකාව විසින් ඉන්දුනිසියාවෙන් සකස් නොකරන ලද දුම්කොළ ආනයනය කර ඒවායින් සුරුට්ටු ලංකාවේදී නිෂ්පාදනය වූ පසු එම නිමි භාණ්ඩ සඳහා GSP සහතික පත්‍ර නිකුත් කිරීම මෙම වර්ෂය මුලදී ආරම්භ කරන ලදී.
- නොර්වේ රාජ්‍ය මගින් අනුග්‍රහය දක්වනු ලබන GSP+ ක්‍රමය පිළිබඳ ව දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයන් අපනයන සංවර්ධන මණ්ඩලය එක්ව මාර්තු මාසයේ කොළඹ දී පවත්වන ලදී.

# සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

**හැඳින්වීම**

1815 දී ශ්‍රී ලංකා ආර්ථිකය ඉංග්‍රීසි පාලනයට නතුවීමත් සමඟ කෝපි, තේ, රබර් වැනි ප්‍රධාන අපනයන බෝග වගාවන් ආරම්භ කරමින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ක්ෂේත්‍රය පුළුල් කිරීමට ඉංග්‍රීසීන් විසින් කටයුතු කර ඇත. ව්‍යාපාරික කටයුතු පහසු කරලීම සඳහා ශ්‍රී ලංකාවේ සමාගම් ලියාපදිංචිය 1861 දී සංයුක්ත ස්කන්ධ සමාගම් ආඥා පනතින් ආරම්භ කර ඇත. 1948 පෙබරවාරි 04 වෙනිදා දක්වා පැවති ඉංග්‍රීසි පාලන කාල පරිච්ඡේදය තුල ලංකාවේ සමාගම් ලියාපදිංචිය 1897 සංයුක්ත ස්කන්ධ බැංකු ආඥා පනත හා 1938 අංක 51 දරණ සමාගම් ආඥා පනත යටතේ සමාගම් ලියාපදිංචි කර ඇත. මෙම පනත යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව පිහිටුවා, එම දෙපාර්තමේන්තුවට වෙළඳ ලකුණ ආඥා පනත, ව්‍යාපාර නාම ආඥා පනත, සීට්ටු ආඥා පනත හා සමිති ආඥා පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම ද පවරා ඇත. 1979 අංක 02 දරණ ජාතික බුද්ධිමය දේපල සංග්‍රහ පනතේ විධිවිධාන අනුව 1980 වර්ෂයේ දී ජාතික බුද්ධිමය දේපල කාර්යාලයක් පිහිට වූ අතර එම දෙපාර්තමේන්තුවට 1981 වර්ෂයේදී වෙළඳ ලකුණු ආඥා පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම පවරා ඇත.

නිදහසින් පසුව ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ක්ෂේත්‍රය දේශීය අනන්‍යතාවයකින් යුක්තව ක්‍රියාත්මක වූ අතරම එයට පහසුකම් සපයමින් 1982 අංක 17 දරණ සමාගම් පනත 1982 වර්ෂයේ සිට ක්‍රියාත්මක විය. මෙම පනත වසර 25 ක් පමණ, ක්‍රියාත්මක වු අතරම එම පනත තව දුරටත් සරල කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුළුල් විම සැලකිල්ලට ගෙන විශාල ආයෝජකයින් ආකර්ශණය කරගැනීමට පහසුකම් ලබා දෙමින් 2007 අංක 07 දරණ සමාගම් පනත 2007 මැයි මස 03 වන දින සිට ක්‍රියාත්මක වේ.

**අරමුණු හා ක්‍රියාකාරීත්වය**

දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති මූලික කාර්යය වන්නේ පහත සඳහන් කර ඇති ව්‍යවස්ථාවන් ක්‍රියාත්මක කිරීම, පරිපාලනය කිරීම හා බලගැන්වීම වේ. එම ව්‍යවස්ථාවන් පහත දැක්වේ.

(අ) 2007 අංක 07 දරන සමාගම් පනත
(ආ) සමිති ආඥා පනත - 123 වන අධිකාරිය
(ඇ) 1935 අංක 61 දරන සීට්ටු ආඥා පනත
(ඈ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත

**2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය**

- 2014 වර්ෂයේ දී මෘදුකාංග සංවර්ධන සඳහා රු. මි. 60.8 ක වියදමින් ව්‍යාපෘතියේ පලමු අදියරේ කටයුතු සිදු කෙරෙමින් පවතී.
- මෘදුකාංග තත්ත්ව විගණනය රු. මි. 13.7 ක වියදමින් සිදු කර ගෙන යනු ලබයි. ආයතන පරිසරය සඳහා නව මුහුණුවරක් ලබා දීමට රු. මි. 5.5 ක වියදමින් කටයුතු කරගෙන යනු ලබයි. මේ වන විට භෞතික ප්‍රගතිය 25% ක් ඉක්මවා ඇති අතර මෙම වසර අවසන් වන විට කාර්යයන් නිම කිරීමට බලාපොරොත්තු වේ.
- මූල ධන වත්කම් අත්පත් කරගැනීම හා පුනරුත්ථාපන කටයුතු 2014 වර්ෂය තුල රු.මි. 96.3 ක වියදමින් සිදු කර ගෙන යන අතර මේ වන විට එහි කටයුතු 50% කට වඩා වැඩි ප්‍රගතියක් ලබා ඇත.

### 2014 වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් සිදු කල ලියාපදිංචි කිරීම්

| විස්තරය | ඉලක්ක 2014 | ප්‍රගතිය 2014.12.31 දිනට | වෙනත් |
|---|---|---|---|
| **1.** නව සංස්ථාගත කිරීම් | 7000 | 6,845 | සමාගම් පනත, පොදු කොන්ත්‍රාත් පනත සහ සමිති අඥා පනත ක්‍රියාත්මක කිරීමෙන් |
| **2.** ලේඛන ලියාපදිංචි ප්‍රමාණය | 180,000 | 166,508 | |
| **3.** 3)සමිති ලියාපදිංචි ප්‍රමාණය | 500 | 71 | |
| **4.** ලේකම්වරු ලියාපදිංචිය | 600 | 566 | |
| **5.** පොදු කොන්ත්‍රාත් ලියාපදිංචිය | 4,000 | 10384 | |
| **මුළු ගණන** | **192,100** | **184,374** | |

*මූලාශ්‍රයඃසමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව*

**ආදායම් සහ වියදම් පිළිබද සාරාංශය**

| විස්තරය | ඉලක්ක 2014 | ප්‍රගතිය | ප්‍රතිෂතය |
|---|---|---|---|
| දෙපාර්තමේන්තු ආදායම (රු.මි) | 390 | 566 | 145 % |
| වියදම (රු. මි.) | 178.5 | 102.52 | 57% |

*මූලාශ්‍රයඃසමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව*

# ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය

**හැඳින්වීම**

2003 අංක 36 දරණ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ පද්ධතිය පරිපාලනය සම්බන්ධ බලය පැවරී ඇත. මෙම බලය පැවරීම සහිතව ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය ප්‍රථමයෙන් පිහිටුවන ලද්දේ 1979 අංක 52 දරණ ජාතික බුද්ධිමය දේපළ සංග්‍රහ පනතේ විධිවිධාන යටතේ 1980 දීය.

**කාර්යභාරය**

වෙළඳ ලකුණු පේටන්ට් බලපත්‍ර, කාර්මික සැලසුම්, පිරිසැලසුම් නිර්මාණවල, සංයුක්ත පරිපථ සහ සාමූහික සංගම් ලියාපදිංචි කිරීම සහ පරිපාලනය කිරීම ඇතුලුව බුද්ධිමය දේපළ පරිපාලනය කිරීම.

- බුද්ධිමය දේපළ පිළිබඳ තොරතුරු එක්රැස්කිරීම සහ ප්‍රචලිත කිරීම.
- බුද්ධිමය දේපළ පිළිබඳ දැනුම ප්‍රවර්ධනය කිරීම.
- ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සඳහා බුද්ධිමය දේපළ භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම.
- බුද්ධිමය දේපළ ආශ්‍රිත ශ්‍රී ලංකාවේ ජාත්‍යාන්තර වගකීම සපුරාලීම සහ ඒ පිළිබඳ කලාපීය සහ අන්තර් ජාතික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම.
- බුද්ධිමය දේපළ පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා කිරීම.
- ප්‍රකාශන අයිතිය සහ සම්බන්ධිත අයිතිවාසිකම් පිළිබඳ ක්ෂේත්‍රයේ ආරවුල් නිරාකරණය, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් බලාත්මක කිරීමට පහසුකම් සැලසීම.
- බුද්ධිමය දේපළ නියෝජිතයන් ලියාපදිංචි කිරීම සහ පරිපාලනය.

**2014 දෙසැම්බර් 31 දක්වා ප්‍රගතිය**

**බුද්ධිමය දේපළ පරිපාලනය**

ප්‍රකාශන අයිතිය හා සම්බන්ධ ක්‍රියාකරකම් සහ වෙළඳ ලකුණු පේටන්ට් සහ කාර්මික සැලසුම්, බුද්ධිමය දේපළ නියෝජිතයන් සහ සාමූහික සංගම් ලියාපදිංචි කිරීම් සහ ලියාපදිංචිය අලුත් කිරීම්, පැවරීම් සහ අවසර ගිවිසුම් වැනි ලියාපදිංචි කිරීමෙන් පසුව සිදුකරන ක්‍රියාකාරකම් බුද්ධිමය දේපළ පරිපාලනයට ප්‍රධාන වශයෙන් ඇතුලත් වේ. බුද්ධිමය දේපළ පරිපාලනය පිළිබඳ ක්ෂේත්‍රයේ දී පහත සඳහන් ප්‍රතිඵල ලැබ ඇත.

**වෙළඳ ලකුණු**

ලියාපදිංචි කිරීමට අයදුම් කර ඇති වෙළඳ ලකුණු, සේවා ලකුණු, සාමූහික ලකුණු සහ සහතික ලකුණු යන ලකුණුවල කාර්ය පටිපාටි හරය සහ නෛතිකභාවය පිළිබඳව පරීක්ෂා කර බලා සුදුසුකම් ලැබූ ඒවා ලියාපදිංචි කිරීම මෙම කාර්යාලය මඟින් සිදු කෙරේ. තවද ලියාපදිංචි කරන ලද ලකුණු හා සම්බන්ධව අලුත් කිරීම් පැවරීම් සහ අවසර ගිවිසුම් පිළිබඳ පරිපාලනමය කටයුතු ද ලකුණු හා සම්බන්ධ තොරතුරු රැස්කර ප්‍රචලිත කිරීම ද සිදු වේ. ප්‍රස්තුත කාලසීමාව තුල දී ලැබී ඇති අයදුම්පත් සහ ඉටුකරන ලද කාර්යයන් පිළිබඳ විස්තර සංඛ්‍යාත්මක වශයෙන් පහත දැක්වේ.

| | ක්‍රියාකාරකම් | 2014 නිමකල සංඛ්‍යාව |
|---|---|---|
| 01. | වියානා වර්ගීකරණය | 5,078 |
| 02. | පරීක්ෂාව හා සෝදිසි වාර්තා යැවීම | 21,931 |
| 03. | අයදුම්කරුවන්ට ලිපි යැවීම (සහතික කිරීම් හා ප්‍රතික්ෂේප කිරීම්) | 17,774 |
| 04. | ගැසට් නිවේදන සකස් කිරීම හා ඉදිරිපත්කීම | 6,902 |
| 05. | ගැසට් නිවේදන සකස් කිරීම | 1,714 |
| 06. | ගැසට් නිවේදන පළවීම | 2,184 |
| 07. | ගාස්තු ගෙවූ පසු ලියාපදිංචි කිරීමට යොමුකිරීම | 1,556 |

| | | |
|---|---|---|
| 08. | රියාපදිංචි සහතික නිකුත් කිරීම | 1,140 |
| 09. | අලුත් කිරීමේ සහතික | 919 |
| 10. | ඒකපාර්ශවික විභාග | 987 |
| 11. | විරුද්ධපාර්ශවික විභාග | 65 |
| 12. | ගොනු වසාදැමීම් | 1,391 |
| 13. | අනෙකුත් අදාල ලිපි යැවීම් | 12,306 |
| 14. | සන්නම් නාම සංශෝධනය,ලිපිනයන් වෙනස් කිරීම, පැවරුම් වාරතා කිරීම | 1,729 |

*මූලාශ්‍රය: ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය*

### අයදුම්පත් වෙනත් ලේඛන ලැබීම්

| | අයදුම්පත් වර්ග | අයදුම්පත්/ ලේඛන ලැබීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | අයදුම්පත් | 8,552 |
| 02. | ගැසට් නිවේදන ප්‍රකාශනය කිරිමට ගෙවීම් | 8,212 |
| 03. | ලියාපදිංචි කිරීමේ ගාස්තු ගෙවීම | 1,577 |
| 04. | අලුත්කිරීමේ අයදුම්පත් | 2,503 |
| 05. | පැවරීම් හා ලිපිනය වෙනස් කිරීම | 838 |

*මූලාශ්‍රය: ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය*

### නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර

මෙම කාර්යාලය විසින් දේශීය හා විදේශීය පේටන්ට් බලපත්‍ර අයදුම්පත් පරික්ෂා කර බලා සුදුසුකම් ලබන නව නිපැයුම් වලට පේටන්ට් ආරක්ෂාව ප්‍රදානය කරනු ලැබේ. එසේ පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීමෙන් අනතුරුව ඊට අදාල අලුත් කිරීම් පැවරීම් සහ අවසර ගිවිසුම් යනාදි විවිධ අංගයන් ද මෙම කාර්යාලය විසින් පරිපාලනය කරනු ලැබේ. එපමණක් නොව විද්‍යාත්මක සහ වෙළඳ ප්‍රජාවන් පර්යේෂණ හා සංවර්ධන ආයතනයන් කර්මාන්තකරුවන් ඇතුලු අවශේෂ පාර්ශවයන්හි ද ප්‍රයෝජනය පිණිස පේටන්ට් සහ තාක්ෂණික තොරතුරු (දේශීය සහ අන්තර්ජාතික) රැස්කර බෙදාහැරීම ද මෙම කාර්යාලය සතු එක් වගකීමකි. ප්‍රශ්තුත කාල සීමාව තුළදී ලැබී ඇති අයදූම්පත් සහ ඉටුකල කාර්යයන් පිළිබඳ සංඛ්‍යා ලේඛන පහත දැක්වේ.

| | ක්‍රියාකාරකම් | 2014 | |
|---|---|---|---|
| | | අයදුම්පත් ලැබීම් | නිමකල සංඛ්‍යාව |
| 01. | ලියාපදිංචිය සඳහා ලද අයදුම්පත් | 536 | 263 |
| 02. | ලැබුනු බව දැන්වීම | - | 491 |
| 03. | මූලික පරීක්ෂාව | - | 827 |
| 04. | සංශෝධන | - | 22 |
| 05. | පිරික්සුම් හා පරික්ෂණ වාර්තා | - | 93 |
| 06. | ගැසට් නිවේදන | - | 41 |
| 07. | සම්බන්ධිත ලිපි පිළිබඳ කටයුතු කිරීම | 287 | 1,963 |
| 08. | වලංගු කිරීම හා විවිධ | - | 888 |
| 09. | පැවරීම් | 24 | 08 |
| 10. | පැවරීම් හා ලිපිනය වෙනස් කිරීම | 31 | 18 |
| 11. | අලුත් කිරීම | 556 | 520 |
| 12. | ලේඛන පිටපත් | - | 23 |

*මූලාශ්‍රය: ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය*

### කාර්මික සැලසුම්

කාර්මික සැලසුම් ලියාපදිංචි කිරීම සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂා කර බලා සුදුසුකම් ලත් ඒවා ලියාපදිංචි කිරීම මෙම කාර්යාලය මගින් සිදු කරන අතර අලුත් කිරීම්, පැවරීම් සහ අවසර ගිවිසුම් ඇතුලු ලියාපදිංචි කිරීමෙන් පසුව සිදුකරන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද කටයුතු කරයි. කාර්මික සැලසුම් හා සම්බන්ධ තොරතුරු එක් රැස්කොට බෙදා හැරීම ද මෙම කාර්යාලය මඟින් සිදු කරනු ලැබේ.

ප්‍රශ්තුත කාලසීමාව තුල දී ලැබී ඇති අයදූම්පත් සංඛ්‍යාව සහ නිම කරන ලද කාර්යයන් පිළිබඳ සංඛ්‍යා ලේඛන පහත දැක්වේ.

| | ක්‍රියාකාරකම් | 2014 | |
|---|---|---|---|
| | | නිමකල සංඛ්‍යාව | අයදුම්පත් ලැබීම් |
| 01. | අයදුම්පත් ලැබීම් | 292 | 529 |
| 02. | ලැබුනු බව දැන්වීම | - | 339 |
| 03. | මූලික පරික්ෂා | - | 411 |
| 04. | පරික්ෂණ වාර්තා(නවතාවය සහිත) | - | 264 |
| 05. | පරික්ෂණ වාර්තා (නවතාවය නොමැති හෙයින් ප්‍රතික්ෂේපිත) | - | 85 |
| 06. | ලියාපදිංචි ගාස්තු කැඳවීම | - | 249 |
| 07. | ගැසට් නිවේදන පළ කිරීම | 251 | 200 |
| 08. | සම්බන්ධිත ලිපි පිළිබඳව කටයුතු කිරීම | 183 | 1,897 |
| 09. | වලංගු කිරීම හා විවිධ (දත්ත ඇතුළත් කිරීම්) | - | 634 |
| 10. | පැවරීම් | - | 02 |
| 11. | නම් සහ ලිපින වෙනස් කිරීම | 08 | 04 |
| 12. | අලුත් කිරීම් | 39 | 35 |
| 13. | ලේඛන පිටපත් | - | 06 |

*මූලාශ්‍රය: ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය*

**ප්‍රකාශන අයිතිය හා සම්බන්ධිත අයිතිවාසිකම්**

ප්‍රකාශන අයිතිය හා සම්බන්ධිත අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කාර්යය ප්‍රවර්ධනය කිරීම ද මෙම කාර්යාලයෙන් සිදු වේ. ප්‍රකාශන හිමිකම් ආරවුල් නිරාකරණය සඳහා ඉල්ලීම් 04ක් ඉදිරිපත් වී ඇති අතර ඒ සම්බන්ධයෙන් කටයුතු කෙරෙමින් පවතී.

**යටිතල පහසුකම් සංවර්ධනය**

මෙහි දී මූලික අවධානය යොමු වූයේ බුද්ධිමය දේපළ පරිපාලනය පරිගණක ගත කිරීම පිළිබඳව ය. වෙළඳ ලකුණු, පේටන්ට් හා කාර්මික සැලසුම් පිළිබඳ පරිගණක ක්‍රමය පූර්ණ ලෙස දැන් ක්‍රියාත්මක වේ. සරප් අංශය සඳහා පරිගණක ක්‍රමවේදයක් හඳුන්වා දීමේ කටයුතු හා ආයතනයේ රාජකාරි කටයුතු සඳහා සියලු නිලධාරීන්ට විද්‍යුත් තැපැල් පහසුකම් ලබා දීමේ වැඩපිළිවෙලක් පිළිබඳව අධ්‍යනය කෙරෙමින් පවතියි.

**දැනුවත් භාවය වැඩි කිරීම, හැකියාවන් ගොඩ නැංවීම සහ විශේෂ වැඩසටහන්**

බුද්ධිමය දේපළ භාවිත කරන්නන්ගේ සහ අයිතිකරුවන්ගේ යහපත තකා බුද්ධිමය දේපළ පිළිබඳ මහජනතාව අතර දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමුව ඇත. රාජ්‍ය හා පෞද්ගලික යන අංශ දෙකේම විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා සම්මන්ත්‍රණ සහ පොදු දේශන ද ඇතුලු ක්‍රියාකාරකම් 19 ක් සංවිධානය කිරීම හෝ සංවිධානය කිරීමට සක්‍රීයව සහභාගි වීම බුද්ධිමය දේපළ කාර්යාලය විසින් සිදුකරන ලදී. මේ සඳහා සම්බන්ධ වූ සංවිධානවලට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, පරිසර පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය, නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, මොරටුව විශ්ව විද්‍යාලය, ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය, මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය හා පෞද්ගලික අංශයේ විවිධ ආයතන ද ඇතුළත් වේ.

මීට අමතරව 2014 ඔක්තෝම්බර් මාසයේ දී මධ්‍යම පළාත් වාණිජ මණ්ඩලය සමග දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වා ඇත.

සේවයේ සිටියදී ම කාර්ය මණ්ඩලයට පුහුණුව ලබා දීම සෑම විටම ධෛර්යමත් කරනු ලැබේ. මීට අමතරව නිලධාරීන් 18 දෙනෙකුට විදේශ පුහුණුව ලබා දෙන ලදී.

ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ අනුග්‍රහය ඇතිව පේටන්ට් වාර්තා සකස් කිරීම පිළිබඳ පස්දින වැඩමුළුවක් පවත්වන ලද අතර එම සංවිධානයේ ම සහයෝගීතාව ඇතිව තාක්ෂණ හා නවෝත්පාදන මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ තුන්දින වැඩමුළුවක් පවත්වන ලදී. ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ නියෝජිතයන් දෙදෙනෙකුගේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකාවේ නවෝත්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තීන් සැකසීම සඳහා යෝජනා මාලාවක් සැකසීමට අදාලව සතියක සාකච්ඡා වැඩමුළුවක් සංවිධානය කරන ලදී.

**සැකසෙමින් ඇති නීතීන්**

ප්‍රකාශන හිමිකම් අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ස්වේච්ඡාවෙන් ලියාපදිංචියට (Voluntary Deposit) අවශ්‍ය කරන නීති සම්පාදනය කිරීම

භූගෝලීය දර්ශක (Geographical Indication) ලියාපදිංචි කිරීම සඳහා නීති සැකසීම ආදිය.

**ජාත්‍යන්තර සම්බන්ධතා**

දේශීය බුද්ධිමය දේපළ පද්ධතිය වැඩිදියුණු කිරීම අරඹයා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය, ජපන් පේටන්ට් කාර්යාලය සහ කොරියානු අන්තර්ජාතික බුද්ධිමය දේපළ පුහුණු ආයතනය වැනි වෙනත් රටවල බුද්ධිමය දේපළ කාර්යාල හා ආයතන සමග සමීප සබඳතාවයක් පවත්වාගෙන යන්නෙමු.

**තොරතුරු සහ උපදේශක සේවා**

බුද්ධිමය දේපළ පිළිබඳ උනන්දුවන ව්‍යාපාරික ආයතන, කාර්මික ආයතන, පර්යේෂණ හා සංවර්ධන ආයතන සහ නව නිපැයුම්කරුවන්ගේ ද ප්‍රයෝජනය සඳහා මෙම කාර්යාලය විසින් බුද්ධිමය දේපළ හා සම්බන්ධ සියලු ක්ෂේත්‍ර හා අදාළ තොරතුරු එක්රැස් කිරීම, ගබඩා කිරීම හා බෙදා හැරීම සිදු කරනු ලැබේ. නව නිපැයුම්කරුවන්ට, කර්මාන්තකරුවන්ට, ශාස්ත්‍රීය හා කලාත්මක නිර්මාණකරුවන්ට, පර්යේෂණ සහ සංවර්ධන ආයතනවලට ඔවුන්ගේ ඉල්ලීම මත විශේෂඥ සහ උපදේශන සේවා සපයනු ලැබේ. ආයතනයේ නමින් වෙබ් අඩවියක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉක්මනින් තොරතුරු බෙදා හැරීම සහ උපදෙස් ලබා දීම සඳහා තොරතුරු කවුළුවක් පිහිටුවා ඇත. එහි දී මහජන පිරික්සුම් 8,810 ක් සිදු කර ඇත. උපදෙස් සේවා 11,563 ක් ලබා දී ඇත.

**රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග සහයෝගීතාව**

රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ගණනාවකට බුද්ධිමය දේපළ හා අදාළ කටයුතුවල දී මෙම කාර්යාලය සහයෝගීතාවය දක්වා තිබේ. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විනිසුරුවන්ගේ ආයතනය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, කෘෂිකර්ම අමාත්‍යාංශය, සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය, කුළුබඩු සභාව, ශ්‍රී ලංකා කජු සංස්ථාව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මණ්ඩලය හා පෞද්ගලික අංශයේ විවිධ ආයතන මීට ඇතුළත් වේ.

**බුද්ධිමය දේපළ නියෝජිතයින්**

නව නියෝජිතයින් 21 ලියාපදිංචි කර ඇති අතර ලියාපදිංචි කිරීම් 23 ක් අලුත් කර ඇත.

**මූල්‍ය කටයුතු**

ආදායම් උපයන දෙපාර්මේන්තුවක් වන අප ආයතනය සේවා ගාස්තු අය කරමින් බුද්ධිමය දේපළ පනත යටතේ ස්ථාපිත කරන ලද බුද්ධිමය දේපළ අරමුදල පවත්වාගෙන යනු ලැබේ.

**ආදායම් සාරාංශය**


| 2013 | 2014 |
|---|---|
| රු.78,176,424.13 | රු.82,311,485.52 |

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ සංවර්ධනය සහ ප්‍රවර්ධනයේ නියැළි ප්‍රධානතම රාජ්‍ය ආයතනය වන අපනයන සංවර්ධන මණ්ඩලය, තම වගකීම් ඉටු කිරීමේ කාර්යභාරය සහ විෂය පථය පැහැදිලිව හඳුනාගෙන ඇත. 2014 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය පහත දැක්වේ.

**2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල අපනයන ප්‍රගතිය**




*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව*

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ තොරතුරු තාක්ෂණ සේවා අපනයන ආදායම 2014 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුල ඇමරිකානු ඩොලර් මිලියන 11.878 ක් උපයා ගනු ලැබූ අතර එය 2013 වසරේ අදාල කාලය තුල උපයන ලද ඇමරිකානු ඩොලර් මිලියන 11.113 හා සසඳන විට 6.88% කින් වර්ධනය වී ඇත.

ප්‍රධාන අපනයන ක්ෂේත්‍රයන් වන කෘෂි, ධීවර සහ කාර්මික අපනයනයන් පිළිවෙලින් සමස්ථ අපනයන ආදායමට 22.72%, 2.23% සහ 67.92% ආදි වශයෙන් පිළිවෙලින් ධන වර්ධනයන් දක්නට ලැබින.

2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල කෘෂි අපනයන ක්ෂේත්‍රයේ ධන වර්ධනය, තේ (5.43%), රබර් (5.43%), එළවළු (25.78%), පලතුරු (51.80%), කැපූ මල් හා විසිතුරු පැල (4.87%) සහ නිස්සාරක තෙල් (26.08%) යන අංශයන්ගේ ධන වර්ධනය හේතු විය. අදාල කාලය තුල පොල් ආශ්‍රිත නිෂ්පාදන (-36.1%) සහ කුළුබඩු (-28.90%) අපනයනයන්ගේ අඩුවීමක් දක්නට ලැබිණ.

ධීවර අපනයන ක්ෂේත්‍රයේ සියලුම අංශයන් එනම්, විසිතුරු මසුන් (17.09%), ක්‍රස්ටේෂියන්ස් (23.93%) සහ මුහුදු ආහාර (13.72%) යනාදී ලෙස වර්ධනයක් පෙන්වන ලදී. කාර්මික අපනයන ක්ෂේත්‍රයේ, සමස්ත අපනයන ආදායමට 41.32% ක දායකත්වයක් දක්වන රෙදිපිළි සහ ඇඟළුම් අපනයන ආදායම 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලය තුල 9.23% ධන වර්ධනයක් වාර්තා කරන ලදී.

අදාල කාලය තුල සකස්කළ ආහාර පාන, දුම්කොළ (13.96%), සම් සහ සම් ආශ්‍රිත නිෂ්පාදන (6.22%), කඩදාසි නිෂ්පාදන (10.01%), රබර් ආශ්‍රිත නිෂ්පාදන (0.22%) , රසායනික නිෂ්පාදන (40.25%), ප්ලාස්ටි ක් නිෂ්පාදන (17.27%), ඛනිජ නිෂ්පාදන (5.2%), ලුහු ඉංජිනේරු නිෂ්පාදන (5.17%). ඉලෙක්ට්‍රික් සහ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන (9.95%), ප්‍රවාහන උපාංග සහ කොටස් (13.08%), බෝට්ටු නිෂ්පාදන (5.19%) සහ පාවහන් (195.73%) යනාදි ක්ෂේත්‍රයන්ගේ ධන වර්ධනයන් වාර්තා කරන ලදී. නමුත් දියමන්ති, මැණික් සහ ආභරණ (-12.85%) සහ පෙට්‍රෝලියම් නිෂ්පාදන (-21.03%) අපනයනයන් අදාල කාලය තුල සෘන වර්ධනයන් වාර්තා කරන ලදී.

සමස්ත අපනයන ආදායමෙන් පිළිවෙලින් 31.35% ක් හා 24.43% ක් අවශෝශනය කරගන්නා අපගේ ප්‍රධාන වෙළඳපලවල් වන යුරෝපා සංගමය සහ ඇමරිකානු එක්සත් ජනපදය 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල 6.43% ක් සහ 9.14% යනාදී ලෙස ධන වර්ධනයන් වාර්තා කරන ලදී.

- **උපාය මාර්ගික සැලැස්ම 2015 - 2020**

අපනයන සංවර්ධන මණ්ඩලය 2015 - 2020 කාලය සඳහා අපනයන සංවර්ධන කාර්යයේ නිරත වන රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් දෙකේම උපදේශකත්වයෙන් සහ සහභාගීත්වයෙන් නව උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීමට ආරම්භ කරන ලදී. මේ සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය US/AID හි VEGA FEG ශ්‍රී ලංකා ව්‍යාපෘතිය මගින් මූල්‍යමය සහනයක් ලබාගත් අතර MTI Consulting ආයතනය මගින් උපදේශකත්වය ලබාගන්නා ලදී.

- **ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම (NES)**

අපනයන සංවර්ධන මණ්ඩලය 2015 - 2020 කාලය සඳහා අපනයන සංවර්ධන කාර්යයේ නිරත වන රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් දෙකේම උපදේශකත්වයෙන් සහ සහභාගීත්වයෙන් ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීමට ආරම්භ කරන ලදී.

අපනයන සංවර්ධන මණ්ඩලය මේ සඳහා තාක්ෂණික සහය ජිනීවා හි අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානය (ITC) මගින් ලබාගත් අතර පසුගිය අගෝස්තු මස ශ්‍රී ලංකාවට ජිනීවා හි අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානයෙන් (ITC) මෙහි මූලික වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා නියෝජිතයින් දෙදෙනෙකු පැමිණි අතර මූලික උපදේශක කටයුතු අදාල පාර්ශවයන් සමග සිදුකරන ලදී.

- **උපදේශක සභා**

අපනයන සංවර්ධන පනත යටතේ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පිහිටුවන ලද උපදේශක සභා 26 මගින් රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකේම සහභාගීත්වය ශක්තිමත් කරමින් අපනයන වෙළඳාමට පහසුකම් සැපයේ. මෙම උපදේශක සභා උද්යෝගීව අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ නිරන්තර ක්‍රියාකාරකම්හි නිරත වේ.

- **"බෙන්ච්මාර්ක්" වැඩ සටහන - ප්‍රගති වර්ධනයට ප්‍රවේශයක්**

2012 වසරේදී ජිනීවා හි අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානයෙන් (ITC), ලෝකයේ වෙළඳ ප්‍රවර්ධනයේ සහය දෙන ආයතනයන්ගේ (TPO) ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය ඇගයීම සඳහා සිදු කරන ලද " බෙන්ච්මාර්කින්" වැඩ සටහනේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය ජූලි මස සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ජිනීවා සිට පැමිණ අපනයන සංවර්ධන මණ්ඩලය සඳහා ප්‍රගති වර්ධන ප්‍රවේශයක් සැකසීම (PIRM) පිළිබඳ වැඩ සටහන් පවත්වන ලදී.

- **ව්‍යවසායකයන්ගේ ගැටළු විසඳීම**

ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අපනයන සංසදය පැවැත් වූ අතර අපනයන ක්ෂේත්‍රය හා අදාල ගැටළු 53 ක් පමණ මෙහිදී සාකච්ඡා කරන ලදී.

- **වෙළඳපල සංවර්ධන සහ ප්‍රවර්ධන වැඩ සටහන්**

අදාල කාලය තුල අපනයන සංවර්ධන මණ්ඩලය පහත දැක්වෙන අන්තර්ජාතික

වෙළඳ ප්‍රදර්ශනයන්හි ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපයන් සංවිධානය කරන ලදී.

- **යුරෝපා කලාපය :** අලිමන්ටේරියා, බාසිලෝනා, ස්පාඤ්ඤය (අපනයනකරුවන් 05 යි), සී ෆුඩ් එක්ස්පෝ ග්ලෝබල්, බෙල්ජියම (අපනයනකරුවන් 05 යි ), සියල්, කැනඩාව (අපනයනකරුවන් 05 යි), ඉන්ටර්සූ, ජර්මනිය (අපනයනකරුවන් 07 යි), පේපර් වර්ල්ඩ්, ජර්මනිය (අපනයනකරුවන් 03 යි)
- **ඇමරිකානු කලාපය :** ඇමරිකා නිව් ඕලියන්ස් හි IFT වෙළඳ ප්‍රදර්ශනය (අපනයනකරුවන් 02 යි)
- **ආසියානු කලාපය :** ෆුඩෙක්ස්, ජපානය (අපනයනකරුවන් 04 යි), ඉන්ටර්නැෂනල් හෝටිකල්චර්, කොරියාව (අපනයනකරුවන් 06 යි), ජපානයේ IT Week (අපනයනකරුවන් 04 යි), චීනයේ කුන්මිං හි දෙවන දකුණු ආසියානු ප්‍රදර්ශනය (අපනයනකරුවන් 120 යි), ඉන්දියා අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනය (අපනයනකරුවන් 5)
- **මැද පෙරදිග, CIS, අප්‍රිකානු කලාපය :** ගල්ෆ් ෆුඩ්, එක්සත් අරාබි එමීරය (අපනයනකරුවන් 23 යි), සයිටෙක්ස්, දකුනු අප්‍රිකාව (අපනයනකරුවන් 12 යි)

▪ **ව්‍යාපාර ප්‍රවර්ධන ධූත මෙහෙවර**

- **බාහිර ගැනුම්කරු විකුණුම්කරු හමු -** මියන්මාරයට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියුතු 18 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, බහරේනයට 20 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, ඊශ්‍රායලයට 20 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, ටියුනීසියාවට 03 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, ඉන්දියාවට 05 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, මාලදිවයිනට 15 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, බ්‍රසීලයට ඇඟළුම් ක්ෂේත්‍රයේ නියුතු 09 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, මාලදිවයිනට අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු 23 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්.

- **අභ්‍යන්තර ගැනුම්කරු විකුණුම්කරු හමු -** මාලදිවයිනෙන් නියෝජිත පිරිසක්, චීනයෙන් නීරෝධායන සේවාවන් ආශ්‍රිත නියෝජිත පිරිසක්, චීනයේ ෆූජියාන් පළාතෙන් 20 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, චීනයෙන් 03 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, සිංගප්පූරුවෙන් 02 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, සී ෂෙල්ස් 04 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, ඊජිප්තුවෙන් සහ පෝලන්තයෙන් නියෝජිත පිරිස්.

▪ **වෙළඳපල පර්යේෂණ**

අපනයන සංවර්ධන මණ්ඩලය, විශාල අපනයන වෙළඳපල කිහිපයක් මත රැඳියාව අවමකර අපනයන වෙළඳපල විවිධාංගිකරණය කිරීමේ අරමුණින් බ්‍රසීලය, දකුණු අප්‍රිකාව, චීනය ආදි රටවල වෙළඳපල පර්යේෂණ අධ්‍යයනයන් සිදුකරන ලදී.

BRICS කලාපයේ සාමාජික රටවල් වන බ්‍රසීලය සහ දකුණු අප්‍රිකාව ඉහළ ආර්ථික වර්ධනයක් පෙන්වන රටවල් ලෙස හඳුනාගෙන ඇති අතර ඒවා සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලාංකීය අපනයනකරුවන් සඳහා වෙළඳපල ගවේෂණ චාරිකාවන් කිහිපයක් සිදු කරන ලදී.

අපනයන සංවර්ධන මණ්ඩලය, ඇඟළුම් කරුවන්ගේ සංසදය බ්‍රසීලයේ ශ්‍රී ලංකා

තානාපති කාර්යාලය හා එක්ව බ්‍රසීලයට ප්‍රධාන ඇගළුම් සමාගම් 07 ක් හා සුළු හා මධ්‍ය ව්‍යවසාය 05 ක් ඇතුළු පළමු ශ්‍රී ලාංකීය ඇගළුම් ප්‍රවර්ධන ධූත මෙහෙය සිදු කරන ලදී.

- **දේශිය වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම**
  - අන්තර්ජාතික මැණික් සහ ආභරණ ප්‍රදර්ශනය (FACETS 2014)
  - පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය

- **කෘෂිකාර්මික නිෂ්පාදන, ධීවර නිෂ්පාදන, කාර්මික නිෂ්පාදන සහ අපනයන සේවා සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන්**
  - **ශ්‍රී ලංකා කුරුඳු සන්නම්කරණය**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පිරිසිදු ශ්‍රී ලංකා කුරුඳු අන්තර්ජාතික සන්නම් නාමයක් ලෙස අන්තර්ජාතික වෙළඳපලට හඳුන්වා දෙන ලදී. ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය, කොලොම්බියා සහ පේරු යනාදී රටවල මෙම වෙළඳ ලකුණ ලියාපදිංචි කරන ලදී. එමෙන්ම එය ලෝක බුද්ධිමය දේපල කාර්යාංශයේ ද ලියාපදිංචි කරන ලදී.

යුරෝපා වෙළඳපලේ ශ්‍රී ලංකා කුරුඳු සඳහා භූගෝලීය දර්ශකය ලබා ගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය කටයුතු කරමින් සිටී.

- **Pure Ceylon Cinnamon වෙළඳ ලකුණ භාවිතයේ අයිතිය ලබාදීමේ වැඩ සටහන**

අපනයන සංවර්ධන මණ්ඩලය සුදුසුකම් ලත් අපනයනකරුවන් 13 දෙනෙකු සඳහා තම අගය එකතු කරන ලද කුරුඳු අපනයනයේදී මෙම වෙළඳ ලකුණ භාවිතා කිරීම සඳහා බලපත්‍ර නිකුත් කරන ලදී.

- **ජාතික කාබනික තත්ත්ව ඒකකය පිහිටුවීම**

කාබනික කෘෂි නිෂ්පාදන අපනයනය සහ ආනයනය පාලනය කිරීම සඳහා ස්වාධීන ජාතික ආයතනයක් ලෙස ජාතික කාබනික තත්ත්ව ඒකකය පිහිටුවන ලදී. මෙමගින් අන්තර්ජාතික වෙළඳපලේ කාබනික කෘෂි නිෂ්පාදනයන් හි විශ්වාසනීයත්වය ආරක්ෂා කිරීම මෙන්ම ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන නිෂ්පාදනයන් හි තත්ත්වය සහ ආරක්ෂාව සහතික කිරීමත් කරනු ලැබේ.

සියලුම කාබනික කෘෂි නිෂ්පාදන ක්ෂේත්‍රයේ නිරතවන නිෂ්පාදකයන්, සකසන්නන් සහ අපනයනකරුවන්/ ආනයනකරුවන් මෙම කාබනික තත්ත්ව ඒකකයේ ලියාපදිංචි විය යුතු අතර, කාබනික තත්ත්වයන්ට අනුකූල විය යුතුය. එමෙන්ම නිෂ්පාදනයන් සඳහා කාබනික ලේබලය ඇතුලත් කිරීම සඳහා අන්තර්ජාතික වශයෙන් පිළිගත් සහතිකකරණ ආයතනයකින් සහතිකයක් ලබා ගත යුතුයි.

- **කෘෂි අපනයන කලාප**

අපනයනය සඳහා කෘෂි නිෂ්පාදන සැපයුම් සංවර්ධනය සහ ග්‍රාමීය ප්‍රජාවට අපනයනයේ ප්‍රතිලාභ ලබා දීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලය කෘෂි අපනයන කලාපයන් පිහිටුවන ලදී. දකුණු පලාතේ කුරුඳු තලන්නන්ගේ තත්ත්ව ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා කුරුඳු ක්ෂේත්‍රයේ සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදන ක්‍රම (GMP) සහිත මධ්‍යස්ථාන 15 ක් පිහිටුවන ලදී.

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ විසිතුරු මසුන් අභිජනනය සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. 2013 හා 2014 වර්ෂයන් හි සිංගප්පූරුවේ පැවති අන්තර්ජාතික විසිතුරු මත්ස්‍ය තරඟයන්හි දී පොලොන්නරුව කෘෂි කලාපයේ විසිතුරු මත්ස්‍ය අභිජනකයින් අන්තර්ජාතික මට්ටමේ ජයග්‍රහණ අත් කරගන්නා ලදී.

අම්පාර දිස්ත්‍රික්කයේ කහ වගාකිරීමේ වැඩසටහනක් සහ නැගෙනහිර පලාතේ අන්නාසි වගා කිරීමේ වැඩසටහනක් පිහිටුවන ලදී.

- **විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් සඳහා නිරෝධායන පහසුකම් සහ රඳවා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා සහන ලබා දීමේ වැඩ සටහන.**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2013 ජාතික අයවැය මගින් අනුමත වූ විසිතුරු මත්ස්‍ය ක්ෂේත්‍රයේ නිරෝධායන පහසුකම් සහ රඳවා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා මූල්‍ය සහනයක් ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී. අදාල කාලය තුල ගිවිසුම් 10 ක් අත්සන් කරන ලදී. එමෙන්ම තවත් සමාගම් 04 ක ලියකියවිලි සහ වියදම් ප්‍රතිපූරනය සඳහා ඉදිරිපත් කර තිබේ.

- **ශ්‍රී ලංකා අත්යන්ත්‍ර, ඇඟළුම් ක්ෂේත්‍රය සඳහා මෝස්තර සංවර්ධන වැඩ සටහන**

ශ්‍රී ලංකා අත්යන්ත්‍ර ඇඟළුම් ක්ෂේත්‍රයේ තිරසාර බව රැකගැනීම සඳහා මෝස්තර සහ ප්‍රවර්ධන හැකියාවන් සංවර්ධනය කිරීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලය අත්යන්ත්‍ර ක්ෂේත්‍රයේ නියැලි 50 දෙනෙකු සඳහා පසුගිය ජුනි 30 වන දින වැඩමුළුවක් පවත්වන ලදී.

- **බෝට්ටු දැක්ම සහ ධීවර ප්‍රදර්ශනය 2014**

බෝට්ටු නිෂ්පාදන ක්ෂේත්‍රයේ අදාල අංශයන් හි සෘජුව හා වක්‍රව නිරතවන සියලුම ව්‍යවසායකයින් සඳහා ඔවුන්ගේ නිෂ්පාදන ගැණුම්කරුවන්ට ප්‍රදර්ශනය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා එකම වේදිකාවක් සැපයීමේ අරමුණින්, අපනයන සංවර්ධන මණ්ඩලය, බෝට්ටු ඉදිකිරීම් තාක්ෂණ සංවර්ධන ආයතනය සහ ලංකා ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ සේවා පෞද්ගලික සමාගම, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය එක්ව 2014 ඔක්තෝබර් 10-12 දක්වා වත්තල දික්ඕවිට ධීවර වරායේදී මෙම බෝට්ටු ප්‍රදර්ශනය පවත්වන ලදී. මෙවර ප්‍රදර්ශනයේ කැපී පෙනෙන අංගයක් වූයේ පළමු වරට ඉදිරිපත් කරන ලද ජලය මත ප්‍රදර්ශනය කරනු ලැබූ යාත්‍රාවන්ය.

ප්‍රදර්ශන කුටි 65 කින් සමන්විත වූ අතර ජලය මත විශාල බෝට්ටු 11 ක් සහ භූමියේ 9 ක් ප්‍රදර්ශනය කරන ලදී.
"ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කර්මාන්ත සංවර්ධනය සහ සමුද්‍රීය සංචරණය" යන මැයෙන් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. මෙහිදී ICOMIA හි කීර්තිමත් දේශකයන් විසින් ශ්‍රී ලංකාවට ප්‍රයෝජනවත්වන සමුද්‍රීය හා ජලය ආශ්‍රිත සංවර්ධනය, සමුද්‍රීය තිරසාර බව සහ තවත් බොහෝ විෂයයන් පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම් හුවමාරු කරන ලදී.

- **අත්කම් නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා සාධාරණ වෙළඳාම (Fair Trade) සංකල්පය හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම**

මෙම වැඩ සටහනේ පළමු අදියර 2013 වසරේදී විදේශීය සාධාරණ වෙළඳාම පිළිබඳ විශේෂඥයෙකුගේ උපදේශකත්වයෙන් ආරම්භ කරන ලදී. දෙවන අදියර යටතේ 2014 වසරේදී මේ සඳහා සමාගම් 09 ක් තෝරාගත් අතර ඔවුන් සාධාරණ වෙළඳ තත්ත්වයන් පිළිබඳ දැනුවත් කරන ලදී.

- **ගෝලීය රබර් සම්මේලනය 2014**

2014 ඔක්තෝබර් 27 සිට 30 දක්වා ප්‍රථම වරට ශ්‍රී ලංකාවේදී රබර් නිෂ්පාදන ක්ෂේත්‍රයේ කීර්තිමත් අන්තර්ජාතික පුරෝගාමීන්ගේ සහ ශ්‍රී ලාංකීය රබර් නිෂ්පාදකයන්/ අපනයනකරුවන්ගේ හඟාගීත්වයෙන් මෙම ගෝලීය රබර් සම්මේලනය පවත්වන ලදී.

රබර් නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියාමන අධිකාරීන් සහ වාණිජමය ක්‍රියාකරුවන් සඳහා ස්වාභාවික රබර් ක්ෂේත්‍රය මුහුණ දෙන අනාගත අභියෝගතා සහ නව ප්‍රවණතා පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබාදීම, තොරතුරු හුවමාරුව සඳහා පහසුකම් සැලසීම මගින් නව ව්‍යාපාරික අවස්ථාවන් උදා කිරීම හා ඒවා පුළුල් කිරීම, ආසියානු රටවල විශේෂයෙන් ශ්‍රී ලංකාව තුළ රබර් ක්ෂේත්‍රයේ පුළුල් ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීම, ප්‍රතිපත්ති සකසන්නන් සහ සංගම් නායකයින්ට කර්මාන්තයේ තීරණාත්මක සාධක පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වේදිකාවක් සකස් කර දීම සහ රබර් ක්ෂේත්‍රයේ නවතම පර්යේෂණයන්, සංවර්ධනයන් සහ නවෝත්පාදනයන් පිළිබඳ ක්ෂේත්‍රයේ විශේෂඥයින්ට සන්නිවේදනය කිරීම යනාදී ප්‍රධාන අරමුණු පහක් සපුරාගැනීමේ අපේක්ෂාවෙන් මෙම සම්මේලනය පවත්වනු ලැබීය.

- **පළමු ශ්‍රී ලාංකීය අන්තර්ජාතික විසිතුරු මත්ස්‍ය කර්මාන්තය පිළිබඳ සම්මේලනය (INFOFISH 2014)**

අපනයන සංවර්ධන මණ්ඩලය, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යංශය, මැලේසියාවේ INFOFISH ආයතනය, ආසියා පැසිෆික් කලාපය සඳහා අලෙවිකරණ තොරතුරු සහ තාක්ෂණ උපදේශන සේවා සඳහා වූ අන්තර් රාජ්‍ය ආයතනය සහ මැලේසියාවේ අන්තර්ජාතික විසිතුරු මත්ස්‍ය ආයතනය (OFI) එක්ව මෙම අන්තර්ජාතික විසිතුරු මත්ස්‍ය කර්මාන්තය පිළිබඳ සම්මේලනය පවත්වන ලදී.

කොළඹ, ගලදාරී හෝටල පරිශ්‍රයේදී මෙම සම්මේලනය උත්සවාකාරයෙන් ආරම්භ කරන ලද අතර මෙමගින් දකුණු ආසියාවේදී අන්තර්ජාතික ධීවර ක්ෂේත්‍රයේ විශේෂඥයින් සහ අපනයනකරුවන් රැසක් ප්‍රථම වරට එකම වෙලාවක දී එකම තැනකදී හමුවීමේ අවස්ථාවක් සලසන ලදී.
විසිතුරු මත්ස්‍ය වෙළඳපල තත්ත්වය සහ සැපයුම සහ දේශීය සහ අන්තර්ජාතික වෙළඳාම හා අදාල වෙළඳ ගැටලු යනාදිය ඉලක්ක කරමින් මෙම සම්මේලනය පවත්වන ලදී.
මෙහිදී විසිතුරු මත්ස්‍ය වගාව සෞඛ්‍යය යනාදී විවිධ උපක්ෂේත්‍රයන්ගේ නූතන දියුණුව පිළිබඳව සාක්ච්ඡා කෙරිණ.
විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ විවිධ උප කොටස් නියෝජනය කරමින් දේශීය හා අන්තර්ජාතික නියෝජිතයන් 300 කට අධික පිරිසක් මෙම දෙදින සම්මේලනය සඳහා සහභාගී විය.

- **අපනයන සේවා**

  - නෙදර්ලන්තයේ CBI ආයතනයේ විශේෂඥයෙකු තෝරාගත් මෘදුකාංග සමාගම් 07 ක චාරිකාවේ නිරත වූ අතර ඔවුන්ට ව්‍යාපාර අලෙවිකරණ සැලැස්මක් පිළිබඳ උපදේශන ලබාදෙන ලදී.
  - තොරතුරු තාක්ෂණ සන්නිවේදන ක්ෂේත්‍රයේ 30 දෙනෙකු සඳහා වෙබ් අඩවි තත්ත්වයෙන් උසස් කිරීම සහ අන්තර්ජාලය හරහා අලෙවිකරණය පිළිබඳ දෙදින වැඩමුළුවක් ජුනි 19 සහ 20 යන දිනයන්හි දී අපනයන සංවර්ධන මණ්ඩලය, නෙදර්ලන්තයේ CBI ආයතනය හා එක්ව පවත්වන ලදී.

- ඉලෙක්ට්‍රොනික් සහ තොරතුරු තාක්ෂණ සන්නිවේදන ක්ෂේත්‍රයේ 84 දෙනෙක් සඳහා Internet of Things යන මැයෙන් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.
- තොරතුරු තාක්ෂණ සන්නිවේදන ක්ෂේත්‍රයේ 80 දෙනෙක් සඳහා Free an Open Source Software (FOSS) යන මැයෙන් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

*Some rival ICT Promotional Logos*

**▪ ශ්‍රී ලංකා මෘදුකාංග සන්නාමීකරණය [මූලික වැඩ කටයුතු]**

ශ්‍රී ලංකා මෘදුකාංග සන්නාම් ක්‍රියාවලිය සඳහා සුදුසු ක්‍රමයක් සකස් කිරීමට රාජ්‍ය ආයතන, කර්මාන්ත සංගම්, මෘදුකාංග සංවර්ධන සමාගම්, ව්‍යාපාර ක්‍රියාවලි කළමණාකරණය/ දැනුම ක්‍රියාවලි කළමණාකරණය, අධ්‍යාපනය, යටිතල පහසුකම්, ඉංජිනේරු අංශයන් නියෝජනය වන පරිදි සාමාජිකයන් 25 ක ගෙන් සමන්විත කණ්ඩායමක් පිහිටුවන ලදී. මේ සම්බන්ධයෙන් සමාගම් සඳහා යොමු කරන ලද ප්‍රශ්නාවලියට සමාගම් 62ක් අනුකූලතාවය දක්වන ලදී. ඒ අනුව උපදෙශක සභාව මගින් මේ කාර්යය සඳහා නිර්මාණයක් සහ සන්නාමීකරණයට සුදුසු තේමාවක් නිර්දේශ කිරීමට නියමිතය.

- පලාත් මට්ටමින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය කිරීමේ ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් නුවර/ ගාල්ල/ මාතර දිස්ත්‍රික්ක වල තොරතුරු තාක්ෂණ සමාගම් 25 ක් සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය SLASSCOM හා එක්ව කොළඹ තොරතුරු තාක්ෂණ උද්‍යානයේ (IT Park) හි අධ්‍යන චාරිකාවක් සහ දැනුම බෙදාගැනීමේ සැසියක් සංවිධානය කරන ලදී.

**▪ ප්‍රාදේශීය සංවර්ධන වැඩ සටහන්**

අපනයන සංවර්ධනය උදෙසා ග්‍රාමීය සම්පත් හා හැකියාවන් දායක කර ගැනීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය ශාඛා ජාලය මගින් අදාල කාලය තුල ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන්වල ප්‍රගතිය පහත දැක්වේ.

- ලියාපදිංචි තේ නිෂ්පාදකයන්, සකසන්නන් සහ අපනයනකරුවන් සඳහා වෙන්කිරීමේ ක්ෂේත්‍ර හැකියාව (Grading Area Capacity) සංවර්ධනය කිරීමේ යෝජනා ක්‍රමය යටතේ තෝරාගත් සමාගම් 02 ක ක්ෂේත්‍ර චාරිකාවේ නිරත වූ අතර එක් ගිවිසුමක් අත්සන් කරන ලදී.
- තේ ක්ෂේත්‍රය සඳහා පද්ධති/නිෂ්පාදන සහතිකකරණය සඳහා සහන ලබාදීමේ යෝජනා ක්‍රමය යටතේ තෝරා ගත් කර්මාන්තශාලා 05 කට සහනයන් ලබාදෙන ලදී.
- සන්නාම් නාම සහ සන්නාම් විශිෂ්ටත්වය සංවර්ධනය කිරීම සඳහා සහන සැලසීමේ යෝජනා ක්‍රමය යටතේ අදාල කාලය තුල සමාගම් 04 කට සහන සැලසා ඇත. එමෙන්ම Basilur Tea Export Pvt Ltd. සමාගමට සන්නාම් නාම ලියාපදිංචිය සඳහා සහන ලබාදෙන ලදී.
- හම්බන්තොට වගා ගෘහ තුල විසිතුරු හා කැපූ මල් වගා කිරීමේ නියුතු 08 දෙනෙකු සඳහා සැපයුම් සංවර්ධන වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලද අතර ඔවුන් සෘජු අපනයන කරුවන්ට සම්බන්ධ කරන ලදී.

- වව්නියාවේ කහ වගාව ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන - පළමු අස්වැන්න ලබාගත් අතර ගොවීන් සහ අපනයනකරුවන් අතර සම්බන්ධතා ගොඩනැංවීම සඳහා කටයුතු කරන ලදී.
- මධ්‍යම පළාත, වයඹ පළාත, දකුණු පළාත සහ හම්බන්තොට යන ප්‍රදේශයන්හි පළතුරු, කුළුබඩු, අගය එකතු කළ තේ සහ කැපූ මල් යනාදී ක්ෂේත්‍රයන්හි නියුතු වගාකරුවන් 200 ක් පමණ පිරිසක් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් 06 ක් අදාල කාලය තුල පවත්වන ලදී.
- තෝරාගත් අපනයනකරුවන් සඳහා අපනයන වෙළඳපලට අගය වැඩි එළවළු/ කුළුබඩු සැපයීම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ වගා ගෘහ 16 ක වැඩ කටයුතු අවසන් කරන ලදී.
- වයඹ පළාතේ විසිතුරු මල් හා පැල වගාකරුවන් 102 ක් සඳහා අපනයන වෙළඳපල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- ඊශ්‍රායලයේ කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම් සහ අලෙවිකරණය පිළිබඳ තාක්ෂණික දැනුම ලබා ගැනීමේ වැඩ සටහනකට ශ්‍රී ලංකා ආරක්ෂිත කෘෂි ව්‍යවසායකයින්ගේ සංගමයේ සාමාජිකයින් 07 දෙනෙක් සහභාගී කරවන ලදී.
- කුළුබඩු සහ නිස්සාරක තෙල් නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා නිෂ්පාදන/ පද්ධති සහතිකකරණය සහන සැලසීමේ යෝජනා ක්‍රමය.

▪ **අනෙකුත් වැඩ සටහන්**

- **ශ්‍රී ලාංකීය නිෂ්පාදන සහ සේවා විද්‍යුත් මාධ්‍යයෙන් ප්‍රවර්ධනය කිරීම.**

www.srilankabusiness.com යන අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය මගින් ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන සහ සේවා ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහනක් අන්තර්ජාලය හරහා ආරම්භ කරන ලදී. එමෙන්ම ශ්‍රී ලංකා කුරුඳු ප්‍රවර්ධනය කිරිම සඳහා ද වෙබ් පිටුවක් සංවර්ධනය කරන ලදී.




- **විද්‍යුත් වාණිජ බිහිදොර (විද්‍යුත් වෙළඳ මධ්‍යස්ථාන)**

මෙම අන්තර්ජාල බිහිදොර ඔස්සේ එක්සත් රාජ්‍යය, ස්වීඩනය සහ ජර්මනිය යනාදී රටවල ගැනුම්කරුවන්ගෙන් ශ්‍රී ලාංකීය කුළුබඩු සහ ආයුර්වේද නිෂ්පාදන සඳහා සාර්ථක වෙළඳ ඇණවුම් 05 ක් සිදු කෙරිණ. අදාල කාලය තුල තේ, ඇඟළුම්, සම් ආශ්‍රිත නිෂ්පාදන, සකස් කළ ආහාර, නිල් මැණික්, කැපූ පොල්, මෝටර් බෝට්ටු, එළවළු, මිරිස් සහ අන්නාසි යනාදී නිෂ්පාදන සඳහා වෙළඳ ඇණවුම් 15 ක් පමණ අන්තර්ජාලය ඔස්සේ ලැබී තිබිණ.

▪ **අපනයන ප්‍රගති දර්ශක 2004 - 2014**

පසුගිය දශකයේ අපනයන සංඛ්‍යා දත්තයන් විශ්ලේෂනය කර "අපනයන ප්‍රගති දර්ශක" නමින් සවිස්තරාත්මක ප්‍රකාශනයක් සකස් කරන ලද අතර මෙය සංයුක්ත තැටියක් ලෙසද ප්‍රකාශයට පත් කෙරේ.

# පුහුණු සහ මානව සම්පත් තොරතුරු

# කාර්යමණ්ඩල තොරතුරු

| Designation | Specialization | Service | Service level | Grade/Class | Salary Code | Approved permanent | Existing permanent |
|---|---|---|---|---|---|---|---|
| Secretary | | | 1 | | SL -4 | 1 | 1 |
| Additional Seretary | Admin & Finance | SLAS | 1 | Special Grade | SL -3 | 1 | 0 |
| Additional Seretary | Regional Industry Development | SLAS | 1 | Special Grade | SL -3 | 1 | 1 |
| Additional Secretary | Policy Development | SLAS | 1 | Special Grade | SL -3 | 1 | 1 |
| Additional Secretary | Commerce | SLAS | 1 | Special Grade | SL -3 | 1 | 1 |
| Additional Secretary | Textiles & Exports | SLAS | 1 | Special Grade | SL -3 | 1 | 1 |
| Senior Assistant Secretary | Admin | SLAS | 1 | Class I | SL -1 | 1 | 1 |
| Chief Internal Auditor | | SLAcS | 1 | Class I | SL -1 | 1 | 1 |
| Chief Accountant | | SLAcS | 1 | Class I | SL -1 | 1 | 1 |
| Director | Field 1,2,3 | Dept. | 1 | | SL -1 | 3 | 2 |
| Director | Regional Industry Development | SLAS | 1 | Class I | SL -1 | 1 | 0 |
| Director | Planning | SLPS | 1 | Class I | SL -1 | 1 | 1 |
| Director | Corporations | SLAS | 1 | Class I | SL -1 | 1 | 0 |
| Director | Industrial Registration | SLAS | 1 | Class I | SL -1 | 1 | 1 |
| Director | Industrial Policy & Development | SLAS | 1 | Class I | SL -1 | 1 | 0 |
| Director | Textile & Exports | SLAS | 1 | Class I | SL -1 | 1 | 1 |
| Director | Research & Development | SLAS | 1 | Class I | SL - 1 | 1 | 1 |

| Designation | Specialization | Service | Service level | Grade/Class | Salary Code | Approved permanent | Existing permanent |
|---|---|---|---|---|---|---|---|
| Director | Commerce | SLAS | 1 | Class I | SL -1 | 1 | 0 |
| Deputy Director/ Assistant Director | Field 1,2,3 | Dept | 1 | Class II-I/ II-II | SL -1 | 3 | 3 |
| Deputy Director/ Assistant Director | Regional Industry Development<br>Head Office | SLAS | 1 | Class II, III | SL -1 | 2 | 2 |
| Deputy Director/ Assistant Director | Divisional Office | SLAS | 1 | Class II, III | SL -1 | 14 | 10 |
| Deputy Director/ Assistant Director | Textiles | SLAS | 1 | Class II, III | SL -1 | 2 | 2 |
| Deputy Director/ Assistant Director | Planning | SLPS | 1 | Class II, III | SL -1 | 3 | 3 |
| Deputy Director/ Assistant Director | Industrial Policy & Development | SLAS<br>Dept. | 1 | Class II, III<br>Dept. | SL -1<br>SL -1 | 1<br>1 | 1<br>1 |
| Deputy Director/ Assistant Director | Corporations | SLAS | 1 | Class II, III | SL -1 | 1 | 1 |
| Deputy Director/ Assistant Director | Industrial Registration | SLAS | 1 | Class II, III | SL -1 | 1 | 0 |
| Deputy Director/ Assistant Director | Commerce | SLPS<br>SLAS | 1<br>1 | Class II, III<br>Class II, III | SL -1<br>SL -1 | 1<br>1 | 1<br>1 |
| Assistant Secretary | Administration | SLAS | 1 | Class III | SL -1 | 3 | 3 |
| Internal Auditor | | SLAcS | 1 | Class II/ III | SL -1 | 1 | 0 |
| Accountant | | SLAcS | 1 | Class II/ III | SL -1 | 3 | 3 |
| Administrative Officer | | PMAS | 2 | Supra | MN 7 | 1 | 1 |
| Translator | | TS | 2 | | MN 6 | 2 | 1 |
| Information & Communication Technology Officer | | ITS | 2 | Class I, II,III | MN 6 | 4 | 1 |
| Personal Security Officer | | Dept | 2 | | RS 1 | 05 | 05 |

| Designation | Specialization | Service | Service level | Grade/Class | Salary Code | Approved permanent | Existing permanent |
|---|---|---|---|---|---|---|---|
| Computer Programmer | | Dept. | 3 | | MN 2 | 1 | 1 |
| Media Officer | | Asso.officers | 3 | | MN 4 | 1 | 1 |
| Industrial Inspector | | Asso.officers | 3 | | MN 4 | 16 | 07 |
| Development Officer | | Asso.officers | 3 | | MN 4 | 810 | 513 |
| Industrial Development Assistant | | Asso.officers | 3 | | MN 4 | 47 | 38 |
| Development Assistant | | Asso.officers | 3 | | MN 4 | 08 | 4 |
| Budget Assistant | | Asso.officers | 3 | | MN 4 | 01 | 0 |
| Accounts Assistant | | Asso.officers | 3 | | MN 4 | 01 | 1 |
| Procurement Assistant | | Asso.officers | 3 | | MN 4 | 01 | 0 |
| Management Assistant | | PMAS | 3 | I,II,III | MN 2 | 105 | 70 |
| Information Technology Assistant | | ITS | 3 | III | MT1 | 1 | 0 |
| Data Entry Operator | | Dept. | 3 | | MN 1 | 02 | 2 |
| Receptionist | | Dept. | 3 | | MN 1 | 01 | 0 |
| Still Photographer | | Dept. | 3 | | MT 1 | 01 | 1 |
| Video Grapier | | Dept. | 3 | | MT 1 | 01 | 1 |
| Assistant Cameraman | | Dept | | | PL 1 | 01 | 1 |
| Drivers | | DS | | I, II A, II B | PL 3 | 41 | 32 |
| Office Employee Assistant | | OES | | I,II,III | PL1 | 57 | 56 |
| **TOTAL** | | | | | | **1174** | **781** |

# දේශීය පුහුණු - 2014

| | පාඨමාලාව | ආයතනය | පුහුණු ලාභීන් |
|---|---|---|---|
| 01 | රාජ්‍ය ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 01 |
| 02 | ව්‍යාපෘති යෝජනා ලිවීම පිළිබඳ උපදේශන පුහුණු පැවරුම් | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 20 |
| 03 | ඉංග්‍රීසි ඩිප්ලෝමාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 03 |
| 04 | සමාන්‍ය ඉංග්‍රීසි කථාකිරීම | බ්‍රිතාන්‍ය කවුන්සිලය | 04 |
| 05 | පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම පිළිබඳ වැඩමුළුව | වෘත්තීය සංවර්ධන අරමුදල | 01 |
| 06 | කළමණාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය | කැළණිය විශ්ව විද්‍යාලය | 01 |
| 07 | ග්‍රැෆික් නිර්මණකරන පාඨමාලාව | ග්‍රැෆික් නිර්මණකරන පාඨමාලාව | 01 |
| 08 | ජාතික ඵලදායිතා ආයතනයේ ඵලදායිතා පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 01 |
| 09 | සමාජීය විද්‍යාපති පාඨමාලාව | කැළණිය විශ්ව විද්‍යාලය | 01 |
| 10 | දැඩි පාරසරික බලපෑම් අධ්‍යයනය පිළිබඳ 18 වන ජාත්‍යන්තර වැඩසටහන | මධ්‍යම පරිසර අධිකාරිය | 01 |
| 11 | සන්නිවේදන දෙමළ භාෂාව | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 02 |

# විදේශීය පුහුණු – 2014

| | රට | පාඨමාලාව | පුහුණු ලාභීන් |
|---|---|---|---|
| 01 | China | Study Visit to China | 03 |
| 02 | Japan | WIPO Training Course on IP management and the Formulation and Implementation of Results - Based IP office Plan | 01 |
| 03 | Malaysia | Second Country Study visit of Master of Public Management (MPM) Programme | 01 |
| 04 | China | Seminar on Chemical Management | 02 |
| 05 | Korea | Tenth Regional Assistant and Protection Course for Asian Parties | 01 |
| 06 | China | Third Advanced Regional Assistance and Protection Course | 01 |
| 07 | Netherlands | 03rd OPCW Assistance & Protection Course for Instructors | 01 |
| 08 | Thailand | UNIDO Training on Monitoring and Evaluation Management | 01 |
| 09 | China | Seminar on Construction and Development of CAFTA | 02 |
| 10 | Korea | Knowledge Sharing Programme | 01 |
| 11 | China | Seminar on Export - Oriented Economy for Developing Countries | 01 |
| 12 | China | Seminar on Youth Business Initiation for Asian Countries | 01 |
| 13 | Thailand | Grassroots Economic Development (GED) Following Sufficiency Economy Philosophy | 01 |
| 14 | China | Seminar on Tea International Trade and Industrialization for Asian European Countries | 03 |
| 15 | India | Industrial & Infrastructure Project Preparation & Appraisal | 01 |

| | | | |
|---|---|---|---|
| 16 | India | Promoting Innovation and Entrepreneurship through Incubation | 01 |
| 17 | India | Training Program on Small Business & Promotion | 01 |
| 18 | China | Seminar on Business Data Collecting, Summarizing and Analyzing for Asian and European Countries | 03 |
| 19 | China | Training Course on Hybrid Cotton Technology for Asian Countries | 01 |
| 20 | China | Seminar on Biogas Industry Promotion & Management for Officials from Asian Countries | 01 |
| 21 | China | Seminar on Industrial Park Construction &n Cooperation between China, Asian & European Countries | 05 |
| 22 | India | Small Business Planning and Promotion | 01 |
| 23 | China | Seminar on Service Industry Management for Asian & European Countries | 03 |
| 24 | China | Seminar on Chinese for Diplomatic from Asian & European Countries | 02 |
| 25 | China | Training Course on Import-Export Textile Product Testing Technology for Asian Countries | 01 |
| 26 | Korea | International Trade & World Trade Organization | 01 |
| 27 | Korea | Knowledge Sharing Programme | 01 |
| 28 | China | Seminar on Automobile Industry for Asian and European Countries | 01 |
| 29 | India | Training Program on Women and Enterprise Development | 01 |
| 30 | India | Training Program on Innovative Strategies for SME Development | 01 |
| 31 | India | International Training Program on Leadership Development | 01 |

# මූල්‍ය ප්‍රගතිය

# පුනරාවර්තන සහ මූලධන වියදම් 2014.12.31 දිනට (සංශෝධිත අයවැය)

ශීර්ෂය : 149 කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
වැඩසටහන : 01 මෙහෙයුම් වැඩසටහන
ව්‍යාපෘතිය : 01 අමාත්‍ය කාර්යාලය

| වැඩසටහන ව්‍යාපෘතිය | වැය විෂයය | කාණ්ඩය / වැය විෂයය විස්තරය | 2014 ඇස්තමේන්තුව රු. | වියදම 31.12.2014 රු. | ශේෂය රු. |
|---|---|---|---|---|---|
| | | **පුද්ගල පඩිනඩි** | **16,260,000** | **16,106,365** | **153,635** |
| 0 | 1001 | වැටුප් හා වේතන | 8,900,000 | 8,802,574 | 97,426 |
| 0 | 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 2,100,000 | 2,080,953 | 19,047 |
| 0 | 1003 | වෙනත් දීමනා | 5,260,000 | 5,222,839 | 37,161 |
| | | | | | |
| | | **ගමන් වියදම්** | **12,250,000** | **12,183,623** | **66,377** |
| 0 | 1101 | දේශීය | 800,000 | 755,043 | 44,957 |
| 0 | 1102 | විදේශීය | 11,450,000 | 11,428,580 | 21,420 |
| | | | | | |
| | | **සැපයීම්** | **12,050,000** | **11,770,324** | **279,676** |
| 0 | 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 2,200,000 | 2,174,540 | 25,460 |
| 0 | 1202 | ඉන්ධන | 9,790,000 | 9,563,784 | 226,216 |
| 0 | 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 60,000 | 32,000 | 28,000 |
| | | | | | |
| | | **නඩත්තු වියදම්** | **10,350,000** | **10,244,805** | **105,195** |
| 0 | 1301 | වාහන | 9,450,000 | 9,437,580 | 12,420 |
| 0 | 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 400,000 | 397,534 | 2,466 |
| 0 | 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000 | 409,690 | 90,310 |
| | | | | | |
| | | **සේවා** | **7,450,000** | **7,080,964** | **369,036** |
| 0 | 1401 | ප්‍රවාහන | 450,000 | 360,900 | 89,100 |
| 0 | 1402 | තැපැල් සහ සංනිවේදන | 1,000,000 | 919,673 | 80,327 |
| 0 | 1403 | විදුලිය සහ ජලය | 1,150,000 | 1,098,944 | 51,056 |
| 0 | 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 3,000,000 | 3,000,000 | 0 |
| 0 | 1405 | වෙනත් | 1,850,000 | 1,701,448 | 148,552 |
| | | | | | |
| | | **අනෙකුත් පුනරාවර්තන වියදම්** | **5,000** | **0** | **5,000** |
| 0 | 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී | 5,000 | 0 | 5,000 |
| | | | | | |
| | | **මුළු පුනරාවර්තන වියදම්** | **58,365,000** | **57,386,081** | **978,919** |
| | | | | | |
| | | **මූලධන වියදම්** | | | |
| | | | | | |
| | | **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | **7,300,000** | **7,197,598** | **102,402** |
| 0 | 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 3,000,000 | 3,000,000 | 0 |
| 0 | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000 | 497,448 | 2,552 |
| 0 | 2003 | වාහන | 3,800,000 | 3,700,150 | 99,850 |
| | | | | | |
| | | **මූලධන වත්කම් අත්පත්කර ගැනීම** | **39,800,000** | **37,092,256** | **2,707,744** |
| 0 | 2101 | වාහන | 36,000,000 | 33,353,960 | 2,646,040 |
| 0 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 3,500,000 | 3,438,296 | 61,704 |
| 0 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 300,000 | 300,000 | 0 |
| | | | | | |
| | | **මූලධන වියදම් එකතුව** | **47,100,000** | **44,289,854** | **2,810,146** |
| | | **මුළු වියදම්** | **105,465,000** | **101,675,935** | **3,789,065** |

## පුනරාවර්තන සහ මූලධන වියදම් 2014.12.31 දිනට (සංශෝධිත අයවැය)

ශීර්ෂය : 149 කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
වැඩසටහන : 01 මෙහෙයුම් වැඩසටහන
ව්‍යාපෘතිය : 02 පරිපාලනය හා ආයතනික සේවා

| වැඩසටහන ව්‍යාපෘතිය | වැය විෂයය | කාණ්ඩය / වැය විෂයය විස්තරය | 2014 ඇස්තමේන්තුව රු. | වියදම 31.12.2014 රු. | ශේෂය රු. |
|---|---|---|---|---|---|
| | | **පුද්ගල පඩිනඩි** | **63,752,000** | **60,414,023** | **3,337,977** |
| 1 | 1001 | වැටුප් හා වේතන | 36,800,000 | 34,999,724 | 1,800,276 |
| 1 | 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 3,000,000 | 2,297,298 | 702,702 |
| 1 | 1003 | වෙනත් දීමනා | 23,952,000 | 23,117,001 | 834,999 |
| | | | | | |
| | | **ගමන් වියදම්** | **4,300,000** | **3,502,858** | **797,142** |
| 1 | 1101 | දේශීය | 800,000 | 570,324 | 229,676 |
| 1 | 1102 | විදේශීය | 3,500,000 | 2,932,534 | 567,466 |
| | | | | | |
| | | **සැපයීම්** | **9,445,000** | **8,639,851** | **805,149** |
| 1 | 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 3,000,000 | 2,952,854 | 47,146 |
| 1 | 1202 | ඉන්ධන | 6,225,000 | 5,502,997 | 722,003 |
| 1 | 1203 | නිල ඇඳුම් | 220,000 | 184,000 | 36,000 |
| | | | | | |
| | | **නඩත්තු වියදම්** | **8,075,000** | **6,845,598** | **1,229,402** |
| 1 | 1301 | වාහන | 4,800,000 | 4,501,920 | 298,080 |
| 1 | 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 1,275,000 | 1,248,142 | 26,858 |
| 1 | 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2,000,000 | 1,095,536 | 904,464 |
| | | | | | |
| | | **සේවා** | **22,300,000** | **20,662,359** | **1,637,641** |
| 1 | 1401 | ප්‍රවාහන | 1,600,000 | 1,542,070 | 57,930 |
| 1 | 1402 | තැපැල් සහ සංනිවේදන | 3,000,000 | 2,830,061 | 169,939 |
| 1 | 1403 | විදුලිය සහ ජලය | 10,200,000 | 9,097,225 | 1,102,775 |
| 1 | 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 1,000,000 | 1,000,000 | 0 |
| 1 | 1405 | වෙනත් | 6,500,000 | 6,193,003 | 306,997 |
| | | | | | |
| | | **මාරුකිරීම්** | **6,022,000** | **5,606,422** | **415,578** |
| 1 | 1505 | සම්පාදන සහ දායක මුදල් | 5,000,000 | 4,623,585 | 376,415 |
| 1 | 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී | 1,000,000 | 977,514 | 22,487 |
| 1 | 1701 | පාඩු සහ කපාහැරීම් | 22,000 | 5,324 | 16,676 |
| | | | | | |
| | | **මුළු පුනරාවර්තන වියදම්** | **113,894,000** | **105,671,111** | **8,222,889** |
| | | | | | |
| | | **මූලධන වියදම්** | | | |
| | | | | | |
| | | **මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම** | **10,500,000** | **10,126,981** | **373,019** |
| 1 | 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 6,100,000 | 5,938,852 | 161,148 |
| 1 | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 200,000 | 195,816 | 4,184 |
| 1 | 2003 | වාහන | 4,200,000 | 3,992,314 | 207,686 |
| | | | | | |
| | | **මූලධන වත්කම් අත්පත්කර ගැනීම** | **7,800,000** | **7,545,045** | **254,955** |
| 1 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 5,400,000 | 5,184,197 | 215,803 |
| 1 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,400,000 | 2,360,848 | 39,152 |
| | | | | | |
| | | **හැකියා වර්ධනය** | **1,800,000** | **1,733,071** | **66,929** |
| 1 | 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 1,800,000 | 1,733,071 | 66,929 |
| | | | | | |
| | | **මූලධන වියදම් එකතුව** | **20,100,000** | **19,405,097** | **694,903** |
| | | **මුළු වියදම්** | **133,994,000** | **125,076,209** | **8,917,791** |

# පුනරාවර්තන සහ මූලධන වියදම් 2014.12.31 දිනට (සංශෝධිත අයවැය)

**ශීර්ෂය : 149 කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**
**වැඩසටහන : 02 සංවර්ධන වැඩසටහන**
**ව්‍යාපෘතිය : 03 කාර්මික සංවර්ධන වැඩසටහන්**

| වැඩසටහන ව්‍යාපෘතිය | වැය විෂයය | කාණ්ඩය / වැය විෂයය විස්තරය | 2014 ඇස්තමේන්තුව රු. | වියදම 31.12.2014 රු. | ශේෂය රු. |
|---|---|---|---|---|---|
| | | **පුද්ගල පඩිනඩි** | **243,340,000** | **241,285,647** | **2,054,353** |
| 1 | 1001 | වැටුප් හා වේතන | 139,550,000 | 138,914,851 | 635,149 |
| 1 | 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,740,000 | 709,910 | 1,030,090 |
| 1 | 1003 | වෙනත් දීමනා | 102,050,000 | 101,660,886 | 389,114 |
| | | | | | |
| | | **ගමන් වියදම්** | **3,600,000** | **2,012,887** | **1,587,113** |
| 1 | 1101 | දේශීය | 1,100,000 | 1,012,874 | 87,126 |
| 1 | 1102 | විදේශීය | 2,500,000 | 1,000,012 | 1,499,988 |
| | | | | | |
| | | **සැපයීම්** | **6,075,000** | **5,873,083** | **201,917** |
| 1 | 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,650,000 | 1,565,147 | 84,853 |
| 1 | 1202 | ඉන්ධන | 4,300,000 | 4,187,937 | 112,063 |
| 1 | 1203 | නිල ඇඳුම් | 125,000 | 120,000 | 5,000 |
| | | | | | |
| | | **නඩත්තු වියදම්** | **4,100,000** | **3,460,879** | **639,121** |
| 1 | 1301 | වාහන | 2,750,000 | 2,565,060 | 184,940 |
| 1 | 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 750,000 | 689,362 | 60,638 |
| 1 | 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 600,000 | 206,457 | 393,543 |
| | | | | | |
| | | **සේවා** | **11,810,000** | **8,961,628** | **2,848,372** |
| 1 | 1401 | ප්‍රවාහන | 1,300,000 | 945,616 | 354,384 |
| 1 | 1402 | තැපැල් සහ සංනිවේදන | 2,400,000 | 1,822,245 | 577,755 |
| 1 | 1403 | විදුලිය සහ ජලය | 1,500,000 | 1,317,413 | 182,587 |
| 1 | 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 3,110,000 | 1,876,980 | 1,233,020 |
| 1 | 1405 | වෙනත් | 3,500,000 | 2,999,374 | 500,626 |
| | | | | | |
| | | **අනෙකුත් පුනරාවර්තන වියදම්** | **1,600,000** | **1,585,642** | **14,358** |
| 1 | 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොලී | 1,600,000 | 1,585,642 | 14,358 |
| | | | | | |
| | | **මුළු පුනරාවර්තන වියදම්** | **270,525,000** | **263,179,767** | **7,345,233** |
| | | | | | |
| | | **<u>මූලධන වියදම්</u>** | | | |
| | | | | | |
| | | **මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම** | **5,240,000** | **4,423,475** | **816,525** |
| 1 | 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 3,500,000 | 3,378,558 | 121,442 |
| 1 | 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 240,000 | 235,312 | 4,688 |
| 1 | 2003 | වාහන | 1,500,000 | 809,605 | 690,395 |
| | | | | | |
| | | **මූලධන වත්කම් අත්පත්කර ගැනීම** | **3,900,000** | **3,833,935** | **66,066** |
| 1 | 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 3,700,000 | 3,633,935 | 66,066 |
| 1 | 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 200,000 | 200,000 | 0 |
| | | | | | |
| | | **හැකියා වර්ධනය** | **4,900,000** | **4,829,215** | **70,785** |
| 1 | 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 4,900,000 | 4,829,215 | 70,785 |
| | | | | | |
| | | **මූලධන වියදම් එකතුව** | **14,040,000** | **13,086,624** | **953,376** |
| | | **මුළු වියදම්** | **284,565,000** | **276,266,391** | **8,298,609** |

## පුනරාවර්තන සහ මූලධන වියදම් 2014.12.31 දිනට (සංශෝධිත අයවැය)

**ශීර්ෂය : 149 කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**
**වැඩසටහන : 02 සංවර්ධන වැඩසටහන**
**ව්‍යාපෘතිය : 03 කාර්මික සංවර්ධන වැඩසටහන්**

| වැඩසටහන / ව්‍යාපෘතිය | වැය විෂයය | කාණ්ඩය / වැය විෂයය විස්තරය | 2014 ඇස්තමේන්තුව රු. | වියදම 31.12.2014 රු. | ශේෂය රු. |
|---|---|---|---|---|---|
| | | මූලධන වියදම් | | | |
| | | | | | |
| 2 | 2502 | **කර්මාන්තපුර** | **315,000,000** | **216,915,489** | **98,084,511** |
| | | | | | |
| 3 | 2502 | **ආංශික සංවර්ධන වැඩසටහන** | **75,000,000** | **48,951,516** | **26,048,484** |
| | | | | | |
| | | සංවර්ධන අංශ I | 8,160,000 | 6,784,397 | 1,375,603 |
| | | | | | |
| | | සංවර්ධන අංශ II | 25,000,000 | 5,045,563 | 19,954,437 |
| | | | | | |
| | | සංවර්ධන අංශ III | 141,200,000 | 19,906,340 | 121,293,660 |
| | | | | | |
| | | දැයට කිරුළ | 10,000,000 | 10,467,811 | (467,811) |
| | | | | | |
| | | අනෙකුත් ප්‍රදර්ශන | 1,000,000 | 3,843,097 | (2,843,097) |
| | | | | | |
| | | ඵලදායිතාල කර්මාන්ත ලියාපදිංචිකිරීම් සහ කළමණාකරණ තොරතුරු අංශය | 12,540,000 | 2,371,786 | 10,168,214 |
| | | | | | |
| | | රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය | 2,100,000 | 532,522 | 1,567,478 |
| | | | | | |
| 4 | 2502 | **අත් යන්ත්‍ර හා පේෂ කර්මාන්ත ආයෝජන** | **200,000,000** | **181,093,279**<br>***53,648,746.74** | **18,906,721** |
| | | | | | |
| 7 | 2502 | **මන්තායි ලුණු ව්‍යාපෘතිය (මන්තායි ලුණු සමාගම)** | **10,000,000** | **0** | **10,000,000** |
| | | **මුළු වියදම්** | **600,000,000** | **446,960,285** | **153,039,715** |